# වාර්ෂික වාර්තාව

# 2023

## ජාතික රක්ෂණ භාර අරමුදල

# වාර්ෂික වාර්තාව
# 2023

ජාතික රක්ෂණ භාර අරමුදල

# පටුන


**ජාතික රක්ෂණ භාර අරමුදල** **5**

අපගේ සංකලිත වාර්තාව ගැන 7

අපගේ දැක්ම සහ අපගේ මෙහෙවර 9

අප කවුදැන් ද 11

අපගේ ආයතනික වටිනාකම් 13

මූල්‍යමය විශේෂ අවස්ථා - 2023 14

සභාපතිතුමියගේ සමාලෝචනය 15

ප්‍රධාන විධායක නිලධාරීවරියගේ සමාලෝචනය 17

ඉලක්ක අරමුණු සහ උපාය මාර්ග 19

**කළමනාකරණ කථිකාව සහ විශ්ලේෂණය** **23**

පාරිසරික සමාලෝචනය 25

මූල්‍ය කාර්යසාධන සමාලෝචනය - 2023 26

ආංශික සමාලෝචනය 28

**පාලනය සහ අභ්‍යන්තර පාලනය** **31**

ව්‍යවසාය පාලනය 33

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් -2023 35

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැතිකඩ - 2023 36

ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම - 2023 38

ව්‍යවසාය අවදානම් කළමනාකරණය 41

තිරසරභාවය වාර්තාකරණය 45

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 46

විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව 48

**මූල්‍ය වාර්තා** **51**

විගණකාධිපතිවරයාගේ වාර්තාව 53

මූල්‍ය ප්‍රකාශන - 2023 59

**අතිරේක තොරතුරු** **115**

දස වසරක දැක්ම 117

ආයතනික තොරතුරු 119




# ජාතික රක්ෂණ භාර අරමුදල



# අපේ සංකලිත වාර්තාව ගැන

ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) 2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන අරමුදලේ කාර්යසාධනය සම්බන්ධ විස්තීර්ණ සහ සංක්ෂිප්ත තොරතුරු ඇතුළත් 2023 වර්ෂයේ වාර්ෂික සංකලිත වාර්තාව සාඩම්බරයෙන් මෙසේ ඉදිරිපත් කරයි.

## අපගේ වාර්ෂික සංකලිත වාර්තාව සඳහා සාදරයෙන් පිලිගනිමු

2006 වර්ෂයේ සිට සංකලිත වාර්තා කිරීමේ ගමන, කෙටි කාලීන මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් අගයන් නිර්මාණය කිරීමෙහිලා අරමුදල සතු හැකියාව සහ ප්‍රධාන ඇල්මක් දක්වන පාර්ශ්වයන් වෙත තරගකාරී හා කල්පවතින අගයන් නිර්මාණය කිරීමෙහිලා අරමුදල සතු හැකියාවන් පිළිබඳ සාකල්‍ය දැක්මක් සම්පාදනය කරයි. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ හා ඊට අදාළ සංශෝධනයන් සහ අපගේ මූල්‍ය වාර්තාකරණය පදනම් කර ගෙන මෙම වාර්තාව පිලියෙල කර ඇත.

## අපගේ සංකලිත චින්තනය

මම වාර්තාවේ අන්තර්ගතය සහ ආකෘතිය නිර්මාණය කරනු වස් අපි අරමුදලේ සියලුම කෘත්‍යයන් සහ පවතින සියලුම සම්පත් සහයෝගී කර ගනිමින් අපගේ උපායමාර්ග සහ අභ්‍යන්තර කරුණු සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය නිර්මාණය කරන්නෙමු.

## උපායමාර්ගික දිශානතිය

මෙම වාර්ෂික වාර්තාව තිරසාර වර්ධනය උදෙසා ඉලක්කගත කර ඇති අරමුදලේ වර්තමාන සහ අනාගත උපාය මාර්ග පිළිබඳ තොරතුරු සපයන අතර මහා භාණ්ඩාගාරය සහ අනෙකුත් අදාළ අධිකාරීන් සඳහා අවබෝධයක් ලබා දෙයි.

## මූල්‍ය නොවන තොරතුරු

අරමුදලෙහි තත්ත්වය කාර්යසාධනය සහ උපායමාර්ග පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කරමින් සහ විනිවිදභාවය ඉහළ නංවමින් මෙම වාර්තාව මගින් අදාළ සහ අවශ්‍ය තැන්හි දී මූල්‍ය නොවන තොරතුරු හෙලිදරව් කරයි.

## සංසන්දනාත්මක තොරතුරු

මෙම වාර්තාව මගින් විශිෂ්ට ඉදිරිපත් කිරීමක් සහ රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීම අරමුණු කර ගෙන අවශ්‍ය තැන්හි දී සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කරයි.

## සීමාව සහ විෂයපථය

2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ මාස 12ක කාලපරිච්ඡේදය සඳහා වන ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්යසාධනය සහ අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වාර්තාව අනුමත කිරීම දක්වා සිදු වූ වැදගත් සිද්ධීන් මෙම සංකලිත වාර්තාව ආවරණය කරයි.

## අනාගත වාර්තා කිරීමේ කාලපරිච්ඡේද

අපගේ කාර්ය සාධනය කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් වාර්තා කිරීමේ කාල රාමු තුනක් යටතේ අදාළ පරිදි වාර්තා කර ඇත.



# අපගේ දැක්ම

සියලුම අවශ්‍ය රක්ෂණය කල හැකි පාර්ශ්වයන් සඳහා රැකවරණය හා ආරක්ෂිත ජාලයක්

# අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට දායකවීම සඳහා :

- සමාජයේ අවශ්‍යතා සහිත සියලුම අංශයන් අරඹයා දැරිය හැකි, ඵලදායි, කාර්යක්ෂම හා ප්‍රගතිශීලි රක්ෂණ ක්‍රම ලබා දීම
- වෙනස් වන අවශ්‍යතාවයන් තුළින් පැන නගින ඉහළ අවධානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශි කිරීමෙන් හා වෙනත් වැඩ පිළිවෙල තුලින් දේශීය වෙළෙඳ පොළට විසඳුම් සලසා දීම
- දේශීය රක්ෂණ වෙළෙඳපොළට අතිරේක ධාරිතාවය සැපයීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොලක් නිර්මාණය කිරීම



# අප කවුරුන් ද

ජාතික රක්ෂණ භාර අරමුදල 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත මගින් ස්ථාපිත කරන ලදී. ප්‍රතිරක්ෂණය වැඩ වර්ජනය කෝලාහල සිවිල් කලබගෑනි සහ ත්‍රස්තවාදය රක්ෂණය අග්‍රහාර වෛද්‍ය රක්ෂණය සෞඛ්‍ය රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණයේ වෙනත් ආකාර සැපයීම ආර්ථිකය සඳහා එහි දායකත්වයට ඇතුළත් වේ. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වැඩ වර්ජනය කෝලාහල සිවිල් කලබගෑනි සහ ත්‍රස්තවාදය පිළිබඳ අවදානම වෙනුවෙන් රක්ෂණ ආවරණ නිකුත් කරන සියලුම රක්ෂකයින් ඒ සඳහා එකතු කළ වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/4 දරන රජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව සෑම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ කොන්ත්‍රාත්තුවකින් පැනනගින මුළු ප්‍රතිරක්ෂණ වගකීම්වලින් 30%ක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. වර්තමානය වන විට ජාතික රක්ෂණ භාර අරමුදල සාමාන්‍ය රක්ෂකයින් සඳහා ප්‍රතිරක්ෂණය සපයන එකම ශ්‍රී ලාංකික ආයතනය වේ.

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 12/2005 මගින් ක්‍රියාත්මක කරන ලද අතර මෙම යෝජනා ක්‍රමය 2006 ජනවාරි මස පළමු වැනි දින සිට ජාතික රක්ෂණ භාර අරමුදලේ විෂය පථයට යටත්විය. රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට හිමිකම් කියන අතර අග්‍රහාර රන් සහ රිදී යෝජනාක්‍රම හඳුන්වාදීම මගින් මෙම යෝජනා ක්‍රමය යටතේ පුළුල් ප්‍රතිලාභ ලබාදීමට හැකි වී ඇත. මෙයට අමතරව අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය අර්ධ රාජ්‍ය නිලධාරීන්ට ද ලබා දෙනු ලැබේ. එමෙන්ම 2016 වර්ෂයෙන් පසුව විශ්‍රාම ලබා ඇති විශ්‍රාම ලත් රාජ්‍ය නිලධාරීන් ද අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ ආවරණය වන කණ්ඩායම් අතර වේ.

ජාතික රක්ෂණ භාර අරමුදල සියලුම රාජ්‍ය ආයතන සහ පෞද්ගලික මෝටර් රථ හිමිකරුවන් සඳහා මෝටර් රථ රක්ෂණ ආවරණයක් සපයන අතර රාජ්‍ය අංශයට පමණක් නොව පෞද්ගලික අංශයට ද ඉතා කෙටි කාලයක් තුළ හිමිකම්පෑම් ලබා දෙමින් විස්තීරණ ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂා කරයි. සාමාන්‍ය රක්ෂණය යටතේ ජාතික රක්ෂණ යෝජනා ක්‍රමය මගින් සියලුම රාජ්‍ය ආයතනවලට මෝටර් රථ නොවන රක්ෂණය සපයයි. නව තාක්ෂණික ක්‍රමවේද යොදා ගැනීම මගින් අපගේ අභ්‍යන්තර සහ බාහිර කාර්යසාධන කාර්යක්ෂමතාවන් වැඩිදියුණු කර ඇත.

# අපගේ ආයතනික වටිනාකම්

අපගේ ප්‍රධාන ආයතනික වටිනාකම් හය, අපගේ ව්‍යාපාර වෙත ප්‍රවේශ විය යුතු ආකාරය සඳහා ශක්තිමත් පදනමක් සහ මාර්ගෝපදේශයක් නිර්මාණය කරයි.




## පාරිභෝගික කේන්ද්‍රීයත්වය

පාරිභෝගික කේන්ද්‍රීය ව්‍යාපාර මගින් පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමට සහ ශක්තිමත් සබඳතා ගොඩනැගීමට කැප වූ සංස්කෘතියක් ජාතික රක්ෂණ භාර අරමුදල තුළ පෝෂණය කරයි. ජාතික රක්ෂණ භාර අරමුදල සමාජය කේන්ද්‍රීය කරගත් රක්ෂණ සපයන බැවින් සහ රජයට සමීපව කටයුතු කරන බැවින් පාරිභෝගික තෘප්තිය වඩා වැදගත් වේ.

## විශ්වාසනීයත්වය

අවංක වීමේ සහ ශක්තිමත් සදාචාර ප්‍රතිපත්ති තිබීමේ ගුණාංගය. රාජ්‍ය ආයතනයක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල එහි ප්‍රතිපත්ති මනාව පවත්වාගෙන යන අතර අභ්‍යන්තර මෙන්ම බාහිර පාර්ශ්වයන්ට අවංක වේ.

## ගුණාත්මකභාවය

යම් දෙයක විශිෂ්ටත්වයේ මට්ටම, ජාතික රක්ෂණ භාර අරමුදල සැම විටම ගුණාත්මක හා කල් පවත්නා නිෂ්පාදන සහ සේවාවන් සැපයීමට කටයුතු කරයි.

### ගෞරවය

යමෙකු හෝ වැදගත් යැයි සලකන දෙයක් කෙරෙහි දක්වන ආචාරශීලී බව, ගෞරවය සහ සැලකිල්ල. වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල සැමවිටම අන් අයගේ වචන සහ ක්‍රියාවන්ට ගරු කරයි.

### නව්‍යකරණය

නව දේවල් කිරීමේ ක්‍රියාව හෝ ක්‍රියාවලිය සහ නව අදහස් ඉදිරිපත් කිරීම. වෙනත් ඕනෑම ආයතනයක් මෙන් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අඛණ්ඩ සාර්ථකත්වය සඳහා නවෝත්පාදනය ඉතා වැදගත් වේ.

### අඛණ්ඩ වර්ධනය

අඛණ්ඩ වැඩිදියුණු කිරීම යනු සරලව සිදුවෙමින් පවතින, වෙනත් වචන වලින් කියතොත්, අඛණ්ඩව, යමක් වැඩිදියුණු කිරීමට හෝ වඩා හොඳ කිරීමට දරන උත්සාහයකි.

# මූල්‍යමය විශේෂ අවස්ථා - 2023

| | | |
|---|---|---|
| මුළු වත්කම්<br>රු. බි. 53.03 | ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය<br>567% | වත්කම් මත ප්‍රතිලාභ<br>12.34% |
| බදුවලට පෙර ලාභය<br>රු. බි. 11.5 | ෆිච් ශ්‍රේණිගත කිරීම<br>BBB (LKA) | ඒකාබද්ධ අරමුදලට දායකත්වය<br>රු. බි. 2.6 |

| මූල්‍ය කාර්යසාධනය | 2023 (රුපියල්) | 2022 (රුපියල්) | % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය | 11,402,441,499 | 12,201,341,213 | -6.6 |
| ශුද්ධ ඉපැයූ වාරිකය | 20,077,948,513 | 20,887,486,607 | -3.9 |
| බදුවලට පෙර ලාභය (PBT) | 11,537,045,028 | 8,533,829,340 | 35.2 |
| බදුවලට පසු ලාභය (PAT) | 6,545,895,266 | 6,835,723,619 | 4.2 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 2,600,000,000 | 1,608,000,000 | 61.69 |
| **වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය** | | | |
| මුළු වත්කම් | 53,026,584,586 | 42,270,115,114 | 25.4 |
| මුළු සමකොටස් | 26,067,193,887 | 19,515,232,931 | 33.6 |
| රක්ෂණ ගිවිසුම් වගකීම් | 20,598,773,647 | 18,922,228,957 | 8.9 |
| මුළු වගකීම් | 26,959,390,698 | 22,754,882,181 | 18.5 |



# සභාපතිතුමියගේ පණිවුඩය

### 2023 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම

ජාතික රක්ෂණ භාර අරමුදලේ, 2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි. ජාතියේ සුබසිද්ධිය පෙරදැරි කරගනිමින්, අපගේ පාර්ශ්වකරුවන්ට වඩාත් වැදගත් වටිනාකමක් එක් කළ සන්ධාන සහ හවුල්කාරීත්වයන් වසර ගණනාවක් පුරා අපි ගොඩනඟා ඇත්තෙමු. එය අපගේ ක්‍රමික වර්ධනයට බෙහෙවින් ඉවහල් විය.

### ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්ය සාධනය සහ දායකත්වය

මන්දගාමී වෙමින් පැවති රක්ෂණ වෙළඳපොළක් තුළ ක්‍රියාත්මක වූ බැවින්, ජාතික රක්ෂණ භාර අරමුදල (NITF), දළ ලිඛිත වාරිකයේ (Gross Written Premium) මධ්‍යස්ථ පහත වැටීමක් වාර්තා කළේය. ඒ අනුව 2022 වර්ෂයේදී රුපියල් බිලියන 12.2ක් ලෙස පැවති එම අගය, 2023 වර්ෂයේදී රුපියල් බිලියන 11.4ක් විය. කෙසේ වෙතත්, මෙම ජයග්‍රහණය ආකර්ශණීය එකක් වන අතර, 2022 වර්ෂයේදී වාර්තා කළ රුපියල් බිලියන 6.8ක බදු පසු ලාභයට (Profit after Tax) සාපේක්ෂව, 2023 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 6.5ක බදු පසු ලාභයක් වාර්තා කිරීමටද ජාතික රක්ෂණ භාර අරමුදල සමත් විය. තවද, 2023 වර්ෂයේදී සිය මූල්‍ය ශක්තිමත්භාවය සනාථ කරමින්, 'BBB(lka)' නම් වූ ෆිච් ශ්‍රේණිගත කිරීම (Fitch Rating) ලබා ගැනීමටද ජාතික රක්ෂණ භාර අරමුදල සමත් විය.

### කෘතඥතාව පළ කිරීම

මෙම ආයතනය මෙහෙයවනු ලබන ගරු මුදල් අමාත්‍යතුමාට සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මෙන්ම, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ අතිරේක ලේකම්වරුන්ට ඔවුන්ගේ මඟපෙන්වීම සහ සහයෝගය සඳහා මාගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. භාණ්ඩාගාර ලේකම්තුමා සහ ජාතික රක්ෂණ භාර අරමුදල සමීපව කටයුතු කරන අනෙකුත් සියලුම භාණ්ඩාගාර නිලධාරීන් විසින් ලබාදුන් සහයෝගයද ගෞරවයෙන් සිහිපත් කරමි. රක්ෂණ කර්මාන්තයේ නියාමකයා වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල් සහ ආයතනික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරී මඬුල්ල වෙත මාගේ අවංක කෘතඥතාව පුද කරමි.

අවසාන වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සෙසු සාමාජිකයින්ට, ප්‍රධාන විධායක නිලධාරිවරයාට මෙන්ම වසර පුරා නොසැලෙන කැපවීමෙන් සහ උනන්දුවෙන් සහයෝගය දැක්වූ ජාතික රක්ෂණ භාර අරමුදලේ සියලුම සේවක පිරිසට මම ස්තූතිවන්ත වෙමි. ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම්වල සියලුම සාමාජිකයින්ට ඔවුන්ගේ සහයෝගය වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.



ආචාර්ය විශාඛා වනසිංහ
සභාපති
25.04.2025



# ප්‍රධාන විධායක නිලධාරීවරියගේ සමාලෝචනය

**ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයට අහිතකර වාතාවරණයක් පවතින වත්මන් තත්ත්වය මධ්‍යයේ වුවද, ජාතික රක්ෂණ භාරකාර අරමුදල (ජාතික රක්ෂණ භාර අරමුදල) 2023 වර්ෂයේදී වාරික වර්ධනය සහ පාරිභෝගික සේවාව අතින් සතුටුදායක කාර්ය සාධනයක් වාර්තා කිරීමට සමත්ව ඇති බව ඉමහත් සතුටින් ප්‍රකාශ කරමි. තවද, විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය, ඉන්ධන හිඟය සහ විදුලි කප්පාදුව වැනි ගැටලු රැසක් මධ්‍යයේ වුවද මෙම වසර ආරම්භ වූ බව සඳහන් කළ යුතුය. විශාල හිමිකම් ගෙවීමකින් පසුව වුවද, මූල්‍ය ස්ථාවරත්වය පිළිබිඹු කරමින්, ෆිච් රේටින් ලංකා (Fitch Rating Lanka) වෙතින් BBB ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීමට ජාතික රක්ෂණ භාරකාර අරමුදල සමත් වූ බව අවධාරණය කිරීම වැදගත් වේ.**

## මූල්‍ය ප්‍රගතිය

ජාතික රක්ෂණ භාරකාර අරමුදල 2023 වර්ෂයේදී සිය මූල්‍ය කළඹ කාර්යක්ෂමව කළමනාකරණය කරමින්, 2022 ට සාපේක්ෂව සිය මූල්‍ය ශක්තිය ඉහළ නංවා ගැනීමටත්, පාරිභෝගිකයින්ට ඉහළ මට්ටමේ සේවාවක් ලබා දීමටත් කටයුතු කර ඇත. 2022 වසරේදී රුපියල් බිලියන 12.2 ක් ලෙස වාර්තා වූ දළ ලියූ වාරිකය, 2023 දී රුපියල් බිලියන 11.4 ක් ලෙස සටහන්ව ඇති අතර, එය 2022 ට සාපේක්ෂව 2023 දී පහත වැටීමක් පෙන්නුම් කරයි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රතිරක්ෂණ සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් ආරවුල් සහ ත්‍රස්තවාදී අරමුදලේ දළ ලියූ වාරික ඉහළ යාමයි.

2022 සහ 2023 වර්ෂවල මූල්‍ය තත්ත්වය සලකා බැලීමේදී, 2022 දී රුපියල් බිලියන 42.3 ක් වූ මුළු වත්කම්, 2023 දී රුපියල් බිලියන 53 ක් දක්වා මධ්‍යස්ථව ඉහළ ගොස් ඇත.

මූල්‍ය ප්‍රගතිය සහ BBB ෆිච් ශ්‍රේණිගත කිරීම සලකා බැලීමේදී, ජාතික රක්ෂණ භාරකාර අරමුදල ප්‍රධාන වශයෙන් දළ ලියූ වාරික සහ මුළු වත්කම් හේතුවෙන් ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පෙන්නුම් කර ඇත.

## මෙහෙයුම් ප්‍රගතිය

2023 වර්ෂයේදී, රන්, රිදී, සාමාන්‍ය සහ විශ්‍රාමික රක්ෂණ යෝජනා ක්‍රම වලින් සමන්විත වූ අග්‍රහාර හිමිකම්වල පැහැර හැරීම් සැලකිය යුතු ලෙස අඩු කිරීමට ජාතික රක්ෂණ භාරකාර අරමුදලට හැකි විය.

## ඇගයීම

2023 වර්ෂයේ ජයග්‍රහණ සඳහා අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වටිනා දායකත්වය සහ අපගේ ව්‍යාපාරයට අනෙකුත් කාර්යය මණ්ඩලයේ අඛණ්ඩ කැපවීම සහ පක්ෂපාතීත්වය වෙනුවෙන් මගේ කෘතඥතාව සහ අගය කිරීම පළ කිරීමට කැමැත්තෙමි. ජාතික රක්ෂණ භාර අරමුදල කෙරෙහි තැබූ විශ්වාසය සහ අවංක සහයෝගය වෙනුවෙන් මහජනතාවට සහ පාරිභෝගිකයින්ට ද මම ස්තූතිවන්ත වෙමි. තවද, 2023 වර්ෂය තුළ ඔවුන්ගේ සහයෝගය වෙනුවෙන් සභාපතිතුමාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ට සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන්ට මගේ අවංක කෘතඥතාව පුද කරන අතර, අනාගතයේදී සමාජ ආරක්ෂණයට වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් දායක වෙමින් ජනතාවට සේවය කිරීමට බලාපොරොත්තු වෙමි.



ගාමිණී ලියනාරච්චි
ප්‍රධාන විධායක නිලධාරී (වැඩ බලන)
2024.04.25

# ඉලක්ක අරමුණු සහ උපායමාර්ග

| ඉලක්ක | පරමාර්ථ | උපාය මාර්ග |
|---|---|---|
| 01. රාජ්‍ය අංශයේ සෞඛ්‍ය රක්ෂණාවරණ සේවා ලබා දීමේ ප්‍රමුඛයා වීම. | 2023 වන විට අග්‍රහාර සේවා සපයමින් රාජ්‍ය සේවකයින් තෘප්තිමත් කිරීම සහ ඔවුන් අතර විශ්වසනීයත්වය ගොඩනැගීම. | ■ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය<br>■ අති නවීන, ආකර්ෂණීය පාරිභෝගික සේවා ස්ථානයක්.<br>■ තොරතුරු තාක්ෂණික (IT) විසඳුම් භාවිත කරමින් කඩිනම් සේවා සැපයීම.<br>■ ඉඩකඩ කළමනාකරණය.<br>■ ගැටුම් නිරාකරණය.<br>■ ශක්තිමත් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාර .<br>■ තොරතුරු තාක්ෂණ (IT) පද්ධති සංවර්ධනය.<br>■ කාර්ය මණ්ඩල සංවර්ධනය. |
| 02. රාජ්‍ය රක්ෂණ ආයතන අතරින් වෙළෙඳපොළ ප්‍රමුඛයා වීම. | 2025 වන විට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යේ දළ ලේඛනගත වාරික (GWP) 25% කින් වැඩි කිරීම. | ■ පවතින නිෂ්පාදන කොටස් වශයෙන් සකස් කිරීම තුළින් GWP වැඩි කිරීම.<br>■ නව පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීම.<br>■ කොටස් වශයෙන් සකස් කිරීම්වල සංවර්ධනයන්ට ගැළපෙන පරිදි පද්ධතිය වැඩිදියුණු කිරීම.<br>■ නව මුලපිරීම් සඳහා දැනුවත්භාවය සහ විශ්වසනීයත්වය ගොඩනැගීම.<br>■ නව අලෙවිකරණ ක්‍රම නිර්මාණය කිරීම. |

| | | |
|---|---|---|
| 03. ප්‍රතිරක්ෂණයෙහි දකුණු ආසියානු කලාපයේ කලාපීය ප්‍රමුඛයෙක් වීම. (ලෝක බැංකු ව්‍යාපෘතිය මත පදනම්ව). | 2025 වන විට ප්‍රතිරක්ෂණ අරමුදලක් සංවර්ධනය කිරීම | ■ කමිටුවක් පිහිටුවා සැකසුම් ක්‍රමය අවසන් කිරීම.<br>■ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.<br>■ E-දැන්වීම් මගින් ජාතික රක්ෂණ භාර අරමුදල හි ශක්තිය සහ රක්ෂණ කර්මාන්තයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම. |
| | 2024 වන විට 30% කට වැඩි ප්‍රතිරක්ෂණ වගකීමක් භාර ගැනීම. | ■ අවදානම් ගැනීමට පෙර වෙළෙඳපොළ අධ්‍යයනය කිරීම.<br>■ නව සම්පත් (මානව සම්පත් සහ අනෙකුත් සම්පත් යන දෙකම) ආකර්ෂණය කර ගැනීම.<br>■ ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම. |
| | 2024 වන විට සාමාන්‍ය රක්ෂණ සඳහා නව ගිවිසුම් ප්‍රතිරක්ෂණ සැකැස්මක් නිර්මාණය කිරීම | ■ කමිටුවක් පිහිටුවා ක්‍රියාවලිය තීරණය කිරීම.<br>■ අවශ්‍ය තොරතුරු රැස් කිරීම.<br>■ අලෙවිකරණය තුළින් නව ව්‍යාපාර අවස්ථා ලබා ගැනීම. |
| 04. SRCC සහ T සහ ජාතික රක්ෂණ භාර අරමුදල අරමුදල් සම්බන්ධයෙන් රජයේ හොඳම විකල්ප අරමුදල් හිමියා බවට පත්වීම. | 2025 වන විට SRCC සහ T සහ ජාතික රක්ෂණ භාර අරමුදල අරමුදල් සම්බන්ධයෙන් යහපත් ආයෝජන ප්‍රතිපත්තියක් සකස් කිරීම. | ■ හොඳම ආයෝජන විකල්පය අධ්‍යයනය කර තෝරා ගැනීම.<br>■ ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) ආයෝජන ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම.<br>■ කාර්යභාර පරාසයක් (TOR) සංවර්ධනය කිරීම.<br>■ රක්ෂණ කර්මාන්තයේ සියලුම වාරික එකතු කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම. |
| 05. රාජ්‍ය අංශයේ හොඳම ආයතනවලින් එකක් ලෙස ප්‍රතිරූපයක් ගොඩනැගීම | 2023 වන විට ජාතික රක්ෂණ භාර අරමුදල හි කැළැල් වූ ප්‍රතිරූපය නැවත ගොඩනැගීම.<br><br>අනුකූලතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. | ■ ඇමතුම් මධ්‍යස්ථානයට සහ පාරිභෝගික සේවයට අදාළව ගනුදෙනුකරුවන්ට කඩිනම් ප්‍රතිචාර දැක්වීම.<br>■ ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ප්‍රචාරක ව්‍යාපාර යක් දියත් කිරීම.<br>■ රජයේ ආයතනවලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම, නියමිත වේලාවට තොරතුරු ලබා දීම සහ පසු විපරම් කිරීම.<br>■ අනුකූලතා නිලධාරියෙකු බඳවා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| 06. | වඩාත්ම දක්ෂ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම. | 2024 වන විට අවසන් පාරිභෝගිකයාට වඩා හොඳ සේවාවක් සැපයීම. | ■ අඛණ්ඩ පුහුණුව සහ සංවර්ධනය.<br>■ හොඳම ශ්‍රම භාවිතයන් හඳුන්වා දීම.<br>■ බාහිරින් දක්ෂ සේවකයන් ආකර්ෂණය කර ගැනීම.<br>■ පැමිණිලි නිරාකරණය. |
| 07. | නිරවද්‍ය, කාලීන මූල්‍ය දත්ත සපයන රාජ්‍ය ආයතනයක් බවට පත්වීම. | නිරවද්‍ය, කාලීන මූල්‍ය දත්ත සැපයීම. | ■ අන්තර (Gap) විශ්ලේෂණය.<br>■ අවශ්‍යතා සපුරාලීම සඳහා පද්ධතිය වැඩිදියුණු කිරීම.<br>■ කාර්ය මණ්ඩල සංවර්ධනය. |
| 08. | ක්‍රියාවන්හි නිරවද්‍යතාවය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම. | සියලුම ක්‍රියාවන් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් යටතේ ක්‍රියාත්මක කිරීම.<br><br>අවශ්‍ය සංවර්ධන කටයුතු කළමනාකාරීත්වයට නිර්දේශ කිරීම. | ■ සෑම දෙපාර්තමේන්තුවකම වත්මන් ක්‍රියාවලීන්හි සාම්පල විගණනයක් සිදු කිරීම.<br>■ සෑම දෙපාර්තමේන්තුවක් සඳහාම නිසි මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමට නිර්දේශ කිරීම.<br>■ සෑම දෙපාර්තමේන්තුවකම නිර්දේශිත අභ්‍යන්තර පාලනයන් පිළිබඳව පසු විපරම් කිරීම.<br>■ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පුළුල් කිරීම. |
| 09. | සමාජයේ අවශ්‍යතා ඇති සියලුම කොටස් සඳහා දැරිය හැකි, කාර්යක්ෂම සහ ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම පිළිබඳ මෙහෙවර ප්‍රකාශය මගින් සවිබල ගැන්වීම. | වෙනත් බලධාරීන් විසින් යෝජනා කර ඇති අවශ්‍ය රක්ෂණ අංශවල පවතින අඩුපාඩු හඳුනාගෙන විශ්ලේෂණය කිරීම.<br><br>අලාභ ලබන රක්ෂණ ක්‍රම ලාභ ලබන තත්ත්වයට පත් කිරීම. | මූල්‍ය හා ව්‍යාපාර අභ්‍යන්තර හා බාහිර පරිසර විශ්ලේෂණය තුළින් නව රක්ෂණ ක්‍රම සංවර්ධනය කිරීම සහ නව රක්ෂණ ක්‍රම වල වාරික මිල හා ප්‍රතිලාභ ඇගයීම.<br><br>■ අභ්‍යන්තර පවතින රක්ෂණ ක්‍රම විශ්ලේෂණය.<br>■ තරඟකාරී විශ්ලේෂණය.<br>■ බාහිර පරිසර විශ්ලේෂණය.<br>■ නව වාරික සහ ප්‍රතිලාභ සහිත නවීකරණය කරන ලද රක්ෂණ ක්‍රම සංවර්ධනය කිරීම. |
| 10. | ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා හොඳම තාක්ෂණික දියුණුව ලබා දීම. | නවීනතම විසඳුම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | ■ තාක්ෂණික ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම.<br>■ හොඳම යටිතල පහසුකම් සැපයීම.<br>■ හොඳම විසඳුම් ක්‍රියාත්මක කිරීම. |

# කළමනාකරණ කථිකාව සහ විශ්ලේෂණය



# පාරිසරික සමාලෝචනය

ශ්‍රී ලංකාවේ මෙන්ම ගෝලීය පරිසරයද ජාතික රක්ෂණ භාර අරමුදලේ මෙහෙයුම්වලට සැලකිය යුතු ලෙස බලපායි. 2023 වසර, ආර්ථික අර්බුදයෙන් සහ යථා තත්ත්වයට පත්වෙමින් පැවති වසරක් වූ බැවින්, ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) 'ජනතාව මුල්කරගත්' වසරක් බවට පත් විය.

ගෝලීය සහ ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික සංවර්ධනයන් අසාර්ථක වීමේ අවදානමක් ගෙන එන අතර, මෙය බොහෝ දුරට අවම කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම්වලින් මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින්ද ලබා ගන්නා රක්ෂණ ආවරණ මගිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රක්ෂණ සමාගම් ඔවුන්ගේ අවදානම්වලින් 30% ක් ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ ප්‍රතිරක්ෂණය කිරීමෙන්ද, ඉතිරිය විදේශීය ප්‍රතිරක්ෂණකරුවන් සමඟ ප්‍රතිරක්ෂණය කරයි. ජාතික රක්ෂණ භාර අරමුදල හි මෙහෙයුම් සාර්ව ආර්ථික ගතිකත්වයන් මගින් බලපාන බව ජාතික රක්ෂණ භාර අරමුදල හොඳින් දනී. එබැවින්, ජාතික රක්ෂණ භාර අරමුදල සිය උපායමාර්ගික තීරණ ගැනීමේදී රටේ ආර්ථික හා රක්ෂණ කර්මාන්තයේ වර්ධනයන් ඇගයීමට ලක් කළ යුතුය.

## ශ්‍රී ලංකාවේ සාමාජීය - ආර්ථික සමාලෝචනය

ගැඹුරු ආර්ථික අර්බුදයෙන් පසුව, 2023 අග භාගය වන විට ආර්ථිකය ස්ථාවර වී ඇත. 2022 වසරේදී ශ්‍රී ලංකාව තිරසාර නොවන ණය සහ ක්ෂය වූ සංචිත මධ්‍යයේ, සාර්ව ආර්ථික කළමනාකරණ දෝෂ සහ දිගුකාලීන ව්‍යුහාත්මක දුර්වලතා හේතුවෙන්, බාහිර කම්පන මගින් උග්‍රවීමත් සමඟ, ණය පැහැර හැරීමකට ලක් විය. කෙසේ වෙතත්, 2022 සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ, එනම් පිරිවැයට සරිලන උපයෝගිතා මිලකරණය, නව ආදායම් මාර්ග, විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තියකට නැවත පැමිණීම සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය නැවත ලබා ගැනීමට උපකාරී වී ඇත. 2022 දී සියයට 7.3 කින් සංකෝචනය වීමෙන් පසු, 2023 අවසාන කාර්තු දෙක තුළ ආර්ථිකය වර්ධනය වූ අතර, වාර්ෂික සංකෝචනය සියයට 2.3 කට සීමා විය. උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8 ක ඉහළ අගයක සිට 2023 මැද භාගය වන විට තනි අගය දක්වා අඩුවිය. රුපියල පෙර වසරේ සියයට 81.2 කින් තියුණු ලෙස අවප්‍රමාණය වීමෙන් පසු, 2023 දී සියයට 10.8 කින් අගය වැඩි විය.

## රක්ෂණ කර්මාන්ත සමාලෝචනය

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ කාලසීමාව සඳහා දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල සම්පූර්ණ දළ ලිඛිත වාරිකය (GWP) රු. මිලියන 280,955 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන 257,580), එය 9.07% ක වර්ධනයක් සනිටුහන් කරයි. 2022 වසරේ එම කාලයට සාපේක්ෂව වාරික වැඩිවීම රු. මිලියන 23,375 කි. දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර යේ GWP රු. මිලියන 152,793 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන 135,367), එය 12.87% ක වර්ධනයක් වාර්තා කරයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යේ GWP රු. මිලියන 128,162 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන 122,213), එය 4.87% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

2023 සිව්වන කාර්තුව අවසන් වන විට රක්ෂණ සමාගම්වල සම්පූර්ණ වත්කම්වල වටිනාකම රු. මිලියන 1,087,573 දක්වා ඉහළ ගොස් ඇත. මෙය 2022 සිව්වන කාර්තුව අවසන් වන විට වාර්තා වූ රු. මිලියන 947,259 ට සාපේක්ෂව 14.81% ක වර්ධනයකි. දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර යේ වත්කම් රු. මිලියන 819,923 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන 668,676), එය 22.62% ක වර්ධන වේගයක් පෙන්නුම් කරයි. මෙය ප්‍රධාන වශයෙන් රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජන මගින් නිරූපණය වන ව්‍යාපාර පරිමාවේ වැඩිවීමක් හේතුවෙනි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යේ වත්කම් රු. මිලියන 267,650 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන 278,583), එය 3.92% ක සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.

දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර ය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ය යන දෙකෙහිම රක්ෂණ සමාගම් විසින් ඇති වූ හිමිකම් රු. මිලියන 137,918 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන 122,263), එය වසරින් වසර 12.80% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. කල්පිරීම් සහ මරණ ප්‍රතිලාභ ඇතුළු දීර්ඝකාලීන රක්ෂණ හිමිකම් ඉල්ලීම් රු. මිලියන 76,502 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන 60,639). මෝටර් රථ, ගිනි, සමුද්‍ර සහ අනෙකුත් කාණ්ඩ ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යේ ඇති වූ හිමිකම් රු. මිලියන 61,416 ක් විය (2022 සිව්වන කාර්තුව: රු. මිලියන

61,624). මේ අනුව, 2023 සිව්වන කාර්තුව තුළ දීර්ඝකාලීන ඇති වූ රක්ෂණ හිමිකම් ඉල්ලීම් 26.16% කින් ඉහළ ගිය අතර, සාමාන්‍ය ඇති වූ රක්ෂණ හිමිකම් 2022 එම කාලයට සාපේක්ෂව 0.34% කින් අඩුවී ඇත.

.

# මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය - 2023

මූල්‍ය කාර්යසාධන සමාලෝචනය මගින් ව්‍යාපාරයේ කාර්යසාධනය පිළිබඳව සමීප අධ්‍යයනයක් සිදු කරයි.

**වගුව: මූල්‍යමය විශේෂ අවස්ථා**

| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය : රු.මි. | 9,684 | 12,693 | 9,818 | 10,864 | 12,201 | 11,402 |
| ශුද්ධ ඉපැයූ වාරිකය : රු.මි. | 13,653 | 16,448 | 17,475 | 17,612 | 2,0077 | 20,077 |
| බදු වලට පෙර ලාභය : රු.මි. | 3,289 | 3,008 | 8,866 | 6,175 | 8,534 | 11,537 |
| බදු වලට පසු ලාභය : රු.මි. | 3,183 | 3,114 | 7,526 | 5,128 | 6,835 | 6,546 |
| මුළු වත්කම් :රු.මි. | 15,595 | 20,707 | 27,358 | 31,796 | 42,270 | 53,027 |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් :රු.මි. | 9,691 | 12,079 | 7,955 | 10,761 | 14,693 | 11,914 |
| ආයෝජනය සහ වෙනත් ආදායම :රු.මි. | 1,350 | 1,269 | 1,387 | 1,590 | 5,088 | 7,333 |
| මුළු සමකොටස් :රු.මි. | 6,956 | 7,192 | 14,062 | 17,056 | 19,515 | 26,067 |
| **වත්කම් මත ලාභය** | **20.41%** | **15.04%** | **27.51%** | **16.13%** | **16.17%** | 12.34% |






2023 වසර තුළදී, ජාතික රක්ෂණ භාර අරමුදල (ජාතික රක්ෂණ භාර අරමුදල) විසින් 2022 වසරේ රුපියල් බිලියන 12.20 ක් වූ දළ ලිඛිත වාරිකය (Gross Written Premium) වෙනුවට රුපියල් බිලියන 11.40 ක් වාර්තා කර ඇත. මෙය 6.6% ක අඩුවීමකි. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ වාරිකවල මධ්‍යස්ථ අඩුවීමකි. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2023 දී රුපියල් බිලියන 20.65 ක ශුද්ධ ලිඛිත වාරිකයක් (Net Written Premium) වාර්තා කර ඇති අතර, එය 2022 දී රුපියල් බිලියන 20.90 ක් වූ අගයට සාපේක්ෂව 1.20% ක මධ්‍යස්ථ අඩුවීමකි.

ශුද්ධ ඉපැයුම් වාරිකය (Net Earned Premium) 2022 දී රුපියල් බිලියන 20.89 සිට 2023 දී රුපියල් බිලියන 20.08 දක්වා අඩුවීමක් වාර්තා කරමින් 3.9% ක සුළු අඩුවීමක් පෙන්නුම් කළේය. බදු පසු ලාභය (Profit after Tax) 2022 දී රුපියල් බිලියන 6.83 සිට 2023 දී රුපියල් බිලියන 6.55 දක්වා මධ්‍යස්ථව අඩු විය, එය 4.22% ක අඩුවීමකි. ජාතික රක්ෂණ භාර අරමුදල හි සම්පූර්ණ වත්කම් (Total Assets) 2022 දී රුපියල් බිලියන 42.27 සිට 2023 දී රුපියල් බිලියන 53.03 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

# ආංශික සමාලෝචනය

## ප්‍රතිරක්ෂණය

ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුව 2007 දෙසැම්බර් 19 දිනැති 1528/20 අංක දරන ගැසට් නිවේදනයට අනුව 2008 වසරේදී පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ සෑම සාමාන්‍ය රක්ෂණ සමාගමකින්ම රක්ෂණය කරන ලද ප්‍රතිරක්ෂණ වටිනාකමින් 20% ක වගකීම භාර ගැනීම සඳහාය. එය 2012 දක්වා ක්‍රියාත්මක විය. 2013 දී එය 30% දක්වා වැඩි කරන ලද අතර, අද දක්වාම එය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

2022 වසරේදී, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2022 පෙබරවාරි 01 දින සිට මාස 18 ක කාලයක් සඳහා 'back -to - back' ප්‍රතිරක්ෂණ ආවරණයක් (retrocession) ලබා ගත් නමුත්, රටේ ආර්ථික තත්ත්වය හේතුවෙන් එය 2023 ජනවාරි 31 දක්වා පමණක් ක්‍රියාත්මක විය. 2023 සැප්තැම්බර් 01 දින සිට 2024 අගෝස්තු 31 දක්වා කාලය සඳහා තවත් 'Retrocession ගිවිසුම' ක් ලබා ගන්නා ලද්දේ, රේඛීය අමාත්‍යාංශයේ එකඟතාවය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල හි ශේෂ පත්‍රය ආරක්ෂා කිරීමට සහ රුපියල් බිලියන 1 ඉක්මවන රක්ෂණ ආවරණ සීමාව රුපියල් බිලියන 7.5 ක් ලෙස සීමා කිරීමටය.

30% ක අනිවාර්ය ප්‍රතිරක්ෂණ භාරගැනීම, ලංසු ලේඛනයේ අවශ්‍යතා සම්පාදනය කළ, සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දැක්වූ ප්‍රමුඛ ප්‍රතිරක්ෂකට (Lead Reinsurer) ලබා දුන්නද, තෝරාගත් ප්‍රමුඛ ප්‍රතිරක්ෂකට ප්‍රතිරක්ෂණ මණ්ඩලය සම්පූර්ණ කිරීමට නොහැකි විය. එබැවින්, කොන්ත්‍රාත් ගිවිසුම සම්පූර්ණ නොවීය. තවද, 2024 මැයි 01 දින සිට 2025 මැයි 30 දක්වා කාලය සඳහා Retrocession ගිවිසුම ලබාගෙන ඇති අතර, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ විය.

## SRCC සහ T අරමුදල

SRCC & T අරමුදල 2008 මාර්තු 25 දිනැති 1542/11 දරන ගැසට් නිවේදනයට අනුව, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ සමාගම්වලින් SRCC & T අවදානම් සඳහා රක්ෂණ ආවරණ ලබා ගන්නා අයට වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදය (SRCC & T) යන අවදානම් සඳහා ආවරණය සැපයීමට පවරා ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2022 පෙබරවාරි 01 දින සිට 2023 ජූලි 31 දක්වා කාලය සඳහා SRCC & T අරමුදලට අදාළ ප්‍රතිරක්ෂණ ආවරණය ලබා ගත් අතර, ප්‍රධාන ප්‍රතිරක්ෂණකරු වූයේ චෝසර් සින්ඩිකේට් 1084 (Ms/ Chaucer Syndicate 1084) ආයතනයයි.

2023 අගෝස්තු 01 දින සිට 2025 ජනවාරි 31 දක්වා කාලය සඳහා SRCC & T අරමුදලට අදාළ ප්‍රතිරක්ෂණ ආවරණය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, මේ සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇතැයි නිරීක්ෂණය වූ බැවින්, 2024 පෙබරවාරි 01 දින සිට 2025 ජනවාරි 31 දක්වා කාලය සඳහා එය ප්‍රසම්පාදනය කිරීමට තීරණය කරන ලදී.
2023 වසරේ සිට මෝටර් රථ රක්ෂණ ව්‍යාපාර පන්තිය යටතේ SRCC & T ආවරණ සඳහා 100% ක වගකීම භාර ගැනීමත්, ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන, ආර්ථික වෙනස්කම් හේතුවෙන්ද ලැබුණු ලංසු මිල ඉතා ඉහළ විය. එම නිසා ලංසුකරු සමග වැඩිදුර සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී.

2023 වසරේදී, SRCC & T ආවරණ යටතේ මෝටර් රථ රක්ෂණ වගකීම් 100% ක් භාර ගැනීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ සංගමය සමග විවිධ සාකච්ඡා පවත්වන ලදී. SRCC & T ආවරණ යටතේ මෝටර් රථ රක්ෂණ වගකීම් 100% ක් භාර ගැනීම පිළිබඳව තීරණයක් ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් කමිටුවක් පත් කරන ලදී.

## අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

**රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර ගෝල්ඩ් සහ සිල්වර් ක්‍රම**

2016 වසරේදී, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය, අග්‍රහාර ගෝල්ඩ් (රන්) සහ සිල්වර් (රිදී) යනුවෙන් නව විකල්ප දෙකක් එක් කරමින් පුළුල් කරන ලදී. මෙම සංශෝධනයේ අරමුණ වූයේ යම් යම් ප්‍රතිලාභ ලබා දීම සහ වත්මන් ප්‍රවණතාවන්ට අනුව වාරිකය සකස් කිරීමයි. 2023 වසර අවසන් වන විට, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ආවරණය යටතේ ගෝල්ඩ් ක්‍රමයේ සාමාජිකයින් 650,350 ක්ද, සිල්වර් ක්‍රමයේ සාමාජිකයින් 35,640 ක්ද, සාමාන්‍ය ක්‍රමයේ සාමාජිකයින් 162,258 ක්ද සිටියහ.

**අග්‍රහාර අර්ධ රාජ්‍ය අංශය**

2017 වසරේදී, ජාතික රක්ෂණ භාර අරමුදල (ජාතික රක්ෂණ භාර අරමුදල ) විසින් ලැබුණු ඉල්ලීම් අනුව අර්ධ රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ ආවරණය පුළුල් කිරීමට තීරණය කරන ලදී. වර්තමානය වන විට, අග්‍රහාර අර්ධ රාජ්‍ය වෛද්‍ය රක්ෂණ ක්‍රමය යටතේ අපි අර්ධ රාජ්‍ය ආයතන 74 කට වැඩි ගණනකට සහ ප්‍රතිලාභීන් 35,000 කට අධික සංඛ්‍යාවකට අපගේ සේවා සපයන්නෙමු.

තවදුරටත්, ප්‍රබල ඉල්ලුම සපුරාලීම සඳහා මෙම නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට අදාළ කෙටුම්පත් යෝජනා සකස් කරමින් සිටී.

**අග්‍රහාර විශ්‍රාම වැටුප් ක්‍රමය**

2016 ජනවාරි 01 දිනට පසු විශ්‍රාම ලැබූ සියලුම රාජ්‍ය සේවකයින් සඳහා අග්‍රහාර විශ්‍රාම වැටුප් රක්ෂණ ක්‍රමය හඳුන්වා දෙන ලදී.

2023 වසර අවසන් වන විට, මෙම ක්‍රමය යටතේ මූල්‍ය ආරක්ෂාව සපයන සාමාජිකයින් 140,000 කට අධික සංඛ්‍යාවක් ආවරණය වී සිටිති. මෙම රක්ෂණ ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රධාන අරමුණ වන්නේ විශ්‍රාමිකයින්ට ඔවුන්ගේ ජීවිත කාලය පුරාම මූල්‍යමය සුරක්ෂිතභාවය ලබා දීමයි. මෙය දායකත්ව ක්‍රමයක් වන අතර, එහිදී ඔවුන්ගේ විශ්‍රාම වැටුපෙන් සුළු මාසික දායකත්වයක් අඩු කරනු ලබන අතර, රජයේ භාණ්ඩාගාරයෙන් රුපියල් 600,000 ක් දායක කරනු ලැබේ.

## සාමාන්‍ය රක්ෂණ

ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් 2009 අගෝස්තු 20 දිනැති අංක 1615/20 දරන විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව 2009 වසරේදී ආරම්භ විය. ඒ අනුව, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රජයේ සහ අර්ධ රාජ්‍ය ආයතනවල දේපළ හා පුද්ගලයින් සඳහා රක්ෂණ ආවරණය සපයන ලදී.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2011 වසරේදී රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ 03/2011 පනත මගින් ජාතික රක්ෂණ භාර අරමුදලට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික ආයතනයක් ලෙස කටයුතු කිරීමට අනුමැතිය ලබා දී ඇත.

## මෝටර් රථ රක්ෂණ

රාජ්‍ය චක්‍රලේඛ අංක PF 427 සහ පසුව PF 437 අනුව, රාජ්‍ය ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන සතු වාහන සඳහා 2008 වසරේ සිට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් මෝටර් රථ රක්ෂණය හඳුන්වා දෙන ලදී. 2014 වසරේ සිට මෝටර් රථ රක්ෂණය පෞද්ගලික පාරිභෝගිකයින් වෙතද ව්‍යාප්ත විය. 2017 දී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රාජ්‍ය සේවකයින් සඳහා 'අග්‍රහාර මෝටර්' නමින් නව මෝටර් රථ රක්ෂණ නිෂ්පාදනයක් හඳුන්වා දුන් අතර, එය මෝටර් රථ රක්ෂණ අංශයේ ප්‍රධාන රක්ෂණ ක්‍රමයක් බවට පත් විය.

ජාතික රක්ෂණ භාර අරමුදල දිවයින පුරා සිය ශාඛා ජාලය හරහා සිය අලෙවිකරණ කටයුතු පුළුල් කර ඇත.

2015 සිට 2018 දක්වා මෝටර් රථ රක්ෂණයෙන් ලැබුණු දළ ලියු වාරිකය අඛණ්ඩව ඉහළ ගොස් ඇත. කෝවිඩ්-19 වසංගතය වැනි විවිධ හේතු නිසා පසුගිය වසර කිහිපය තුළ එය අඩු වී ඇත.

## මෝටර් නොවන රක්ෂණ

ජාතික රක්ෂණ භාර අරමුදලේ මෝටර් නොවන රක්ෂණ අංශය ප්‍රධාන වශයෙන් සාමුද්‍රීය, ගිනි, ඉංජිනේරු, වෛද්‍ය සහ වෙනත් පන්ති යටතේ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවලට ප්‍රතිපත්ති නිකුත් කරයි.




# පාලනය සහ අභ්‍යන්තර පාලනය

# ව්‍යවසාය පාලනය

## හැඳින්වීම

ව්‍යවසාය පාලනය යනු සංවිධානයක ආයතනික පාලනය (Corporate Governance) සහ ව්‍යාපාර පාලනය (Business Governance) යන අංශ දෙකම ආවරණය වන රාමුවක් විස්තර කරන නැගී එන පදයකි. කාර්යසාධන කළමනාකරණය සමග උපායමාර්ගිකව සම්බන්ධ වූ යහපත් ආයතනික පාලනයක නිවැරදි සංකලනයක් සාක්ෂාත් කර ගැනීමෙන්, සමාගම්වලට තම ව්‍යාපාර ය ඉදිරියට ගෙන යන ප්‍රධාන සාධක කෙරෙහි අවධානය යොමු කිරීමට හැකි වනු ඇත. මෙය අභියෝගයක් මෙන්ම අවස්ථාවක්ද වේ. මෙම රාමුව පිළිබඳව සටහන් කළ යුතු ප්‍රධාන කරුණ වන්නේ, ව්‍යවසාය පාලනය මගින් සමතුලිතව පවත්වා ගත යුතු අනුකූලතාවය (conformance) සහ කාර්යසාධනය (performance) යන ආයතනික පාලන ක්‍රියාවලීන්හි මාන දෙකක් ආවරණය කිරීමයි.

අනුකූලතා මානය මගින් අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහයන් සහ භූමිකාවන් මෙන්ම විධායක වැටුප් වැනි කරුණු ආවරණය කරයි. සංග්‍රහයන් සහ/හෝ ප්‍රමිති මගින් සාමාන්‍යයෙන් මෙම මානය ආමන්ත්‍රණය කළ හැකි අතර, අනුකූලතාවය සහතික කිරීම/විගණනයට යටත් ව අනුකූල වීමෙනි.

කාර්යසාධන මානය උපායමාර්ගය සහ වටිනාකම් නිර්මාණය කිරීම වටා කේන්ද්‍රගත වේ. මෙහි අවධානය යොමු වන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික තීරණ ගැනීමට, එහි අවදානම් රුචිය අවබෝධ කර ගැනීමට සහ කාර්යසාධනයේ ප්‍රධාන සාධක තේරුම් ගැනීමට උපකාර කිරීමයි.

ව්‍යවසාය පාලන රාමුවේ හරය වන්නේ, යහපත් ආයතනික පාලනය අසාර්ථකත්වය වළක්වා ගැනීමට උපකාරී වන නමුත්, එය යහපත් ව්‍යාපාර කාර්යසාධනයක් සහතික නොකරන බවට වන තර්කයයි. දැනටමත් දැක ඇති පරිදි, 2000 දශකයේ මුල් භාගයේදී ආයතනික අසාර්ථකත්වයන් සමීකරණයේ ආයතනික පාලන අංශය ප්‍රතිසංස්කරණය කිරීමට සැලකිය යුතු උත්සාහයන්ට හේතු විය. නමුත්, මෑතක් වන තුරුම, උපායමාර්ගික තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම අනුව කාර්යසාධන පැත්තට එතරම් අවධානයක් යොමු වී නොතිබුණි. ව්‍යවසාය පාලන රාමුව, ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) දිගුකාලීන සාර්ථකත්වය සඳහා අනුකූලතාවයේ සහ කාර්යසාධනයේ වැදගත්කම තේරුම් ගැනීමට අපට උපකාරී වේ.

ජාතික රක්ෂණ භාර අරමුදල, ශ්‍රී ලංකා සටහන්ගත ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (Institute of Chartered Accountants of Sri Lanka) විසින් නිකුත් කරන ලද හොඳම භාවිතයන් පිළිබඳ ආයතනික පාලන සංග්‍රහය (Corporate Governance Code of Best Practices) සහ රාජ්‍ය ව්‍යවසාය සඳහා වන යහපාලන සහ ආයතනික පාලන භාවිත මාර්ගෝපදේශ (Public Enterprises Guidelines for Good Governance and Corporate Governance Practices) මගින් සවිබල ගැන්වී ඇති අතර, විනය, විනිවිදභාවය, ස්වාධීනත්වය, වගවීම, වගකීම, සාධාරණත්වය සහ සමාජ වගකීම වැනි ප්‍රධාන ආයතනික පාලන අගයන් අනුගමනය කරමින් සිය ව්‍යවසාය පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරයි.

## ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යාපාරික හැසිරීම සහ ව්‍යාපාරික ආචාර ධර්ම

ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) සිය සේවකයන්ගේ හැසිරීම සඳහා හොඳින් පිළිගත් ව්‍යාපාර හැසිරීම් සහ ව්‍යාපාර ආචාර ධර්ම අනුගමනය කර ඇත. මේවාට මහජනයා අතර පිළිගත හැකි හැසිරීම්, ආචාර ධර්මීය ව්‍යාපාර ප්‍රමිති සහ ජාතික රක්ෂණ භාර අරමුදල හි වත්කම් ආරක්ෂා කිරීම හා නිසි ලෙස භාවිතා කිරීම, අවශ්‍යතා ගැටුම් මගහරවා ගැනීම, ජාතික රක්ෂණ භාර අරමුදල හි රක්ෂණ ගනුදෙනුකරුවන් සහ සේවාදායකයින් සමග සාධාරණව කටයුතු කිරීම, ජාතික රක්ෂණ භාර අරමුදල හි පරිගණක පද්ධති නිසි ලෙස භාවිතා කිරීම, පාරිභෝගික තෘප්තිය සහතික කිරීම සහ නීති රීතිවලට අනුකූල වීම ඇතුළත් වේ.

## ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික පාලන වේදිකාවේ හරය වන අතර, ජාතික රක්ෂණ භාර අරමුදලේ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් ජාතික රක්ෂණ භාර අරමුදල හි සමස්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික වන පරිදි, අදාළ සියලුම රජයේ ප්‍රතිපත්ති, ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවලට අනුකූලව කාර්යක්ෂමව කළමනාකරණය වන බවට සහතික වේ. 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතට අනුව, ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගිනි.

මණ්ඩලයේ එක් අයෙකු සභාපතිවරයා ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත. පනතේ විධිවිධාන අනුව, මණ්ඩලයේ සියලුම සාමාජිකයින් පත් කළ දින සිට වසර පහක කාලයක් සඳහා නිල දරනු ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල මණ්ඩලය ජාතික රක්ෂණ භාර අරමුදල හි අඛණ්ඩ ව්‍යාපාරික කටයුතු සාකච්ඡා කිරීම සඳහා නිතිපතා රැස්වන අතර, අවශ්‍ය විටදීද රැස්වේ. 2023 වසර තුළ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇත.

## මූල්‍ය ප්‍රකාශන

ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් අදාළ නීති රීති අනුග මනය කරමින් සකස් කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල එහි කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක හා විනිවිදභාවයෙන් යුත් විශ්ලේෂණයක් එහි සපයයි.

## ප්‍රසම්පාදනය

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රසම්පාදන කටයුතු ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (NPA guidelines) සහ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අනුගමනය කරමින් සිදු කෙරේ. සියලුම වැදගත් ප්‍රසම්පාදන කටයුතු වටිනාකම මත පදනම්ව කැබිනට් පත් ප්‍රසම්පාදන කමිටුවේ (CAPC), අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC), සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සහාය ඇතිව සිදු කරනු ලැබේ.

## අභ්‍යන්තර පාලනය

2023 වසර තුළ දී, ජාතික රක්ෂණ භාර අරමුදල හි මෙහෙයුම් ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් අභ්‍යන්තර විගණන කටයතු සිදු කරන ලදී.

## බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරනු ලැබේ. යම් ලිඛිත නීතියක් යටතේ රජයට පවරා ඇති රාජ්‍ය සංස්ථා, ව්‍යාපාර හෝ වෙනත් ව්‍යවසායකයන්ගේ ගිණුම් විගණනය කිරීමද ඔහුගෙන් අපේක්ෂා කෙරේ. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, 29 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික විගණන කාර්යාලය විසින් සිදු කරනු ලබන විගණන සඳහා අදාළ වේ. 2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල හි මූල්‍ය ප්‍රකාශනවල වාර්ෂික විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලදී.

# අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් - 2023



සාගලා අබේවික්‍රම මහත්මිය
*(සභාපතිනි - 2023 මැයි සිට)*



මහවාහිබ් මවුජූඩ් මහතා
*(සභාපති - 2023 මැයි දක්වා)*



එච්.එම්.ටී.පී.හේරත්
*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*



ගීතාමනි කරුණාරත්න මහත්මිය
*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*



ඩී.එල්.යූ.පීරිස් මහත්මිය
*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*



මදාරා සෙව්වන්දි ද සිල්වා
මහත්මිය
*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*



රසල් ෆොන්සේකා මහතා
*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*



සිසිර කුමාර හේනාධීර මහතා
*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*

# අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැතිකඩ 2023

නීතිඥ සාගලා අබේවික්‍රම මහත්මිය (සභාපති)

සාගලා අබේවික්‍රම මහත්මිය, මහවාහිබ් මවුජූඩ් මහතාගේ ඉල්ලා අස්වීමෙන් පසු, 2023 මැයි මාසයේදී ජාතික රක්ෂණ භාර අරමුදලේ සභාපති ධුරයට පත්වූවාය. ඇය නීතිඥවරියකි. මීට පෙර ඇය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපතිවරිය ලෙස කටයුතු කළාය.

මහවාහිබ් මවුජූඩ් මහතා (සභාපති)

මහවාහිබ් මවුජූඩ් මහතා 2020.02.19 දින ජාතික රක්ෂණ භාර අරමුදලේ සභාපති ලෙස රාජකාරි භාර ගත්තේය. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් MBA (Master of Business Administration), MFE උපාධි ලබා ඇත. නැගෙනහිර ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් LLM උපාධියක් ද ලබා ඇත. ඔහු ACMA UK & SL, B. Com (Hons), ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඔහු 2023 මැයි මාසයේදී ඉල්ලා අස්විය.

ගීතාමණී සී. කරුණාරත්න මහත්මිය (මණ්ඩල සාමාජික)

ඩී. එල්. යූ. පීරිස් මහත්මියගේ ඉල්ලා අස්වීමෙන් පසු ගීතාමණී සී. කරුණාරත්න මහත්මිය 2023 ජුනි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස පත් කරන ලදී. 2023 වසර තුළ ඇය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක් ලෙස සේවය කළාය.

ඩී. එල්. යූ. පීරිස් මහත්මිය (මණ්ඩල සාමාජික)

කාන්ති ගුණවර්ධන මහත්මියගේ ඉල්ලා අස්වීමෙන් පසු ඩී. එල්. යූ. පීරිස් මහත්මිය 2020 නොවැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස පත් කරන ලද අතර එතැන් පටන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වී ඇත. 2023 වසර තුළ ඇය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක් (පරිපාලන) ලෙස සේවය කළාය. පීරිස් මහත්මියට රාජ්‍ය සේවයේ වසර 20කට වැඩි පළපුරුද්දක් ඇත. ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත. ඇය NIBM වෙතින් ඉංග්‍රීසි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධියක් ද ලබා ඇත. වසර තුළ ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හදාරමින් සිටී.

**එච්. එම්. ටී. පී. හේරත් මහත්මිය (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

චන්දන කුමාරසිංහ මහතා ඉල්ලා අස්වීමෙන් පසුව 2021 අප්‍රේල් මාසයේ දී එච්. එම්. ටී. පී. හේරත් මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස පත් කරනු ලැබූ අතර ඇය දැනට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරයි. ඇයට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 20කට වැඩි පළපුරුද්දක් ඇත.

හේරත් මහත්මිය කැළණිය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර මානව සම්පත් පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරා ඇත. එමෙන්ම ඇය කැළණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ඇත. දැනට ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හදාරමින් සිටී.

**මදාරා සෙව්වන්දි ද සිල්වා මහත්මිය (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

ප්‍රදීප් කුමාර මහතාගේ ඉල්ලා අස්වීමෙන් පසු මදාරා ද සිල්වා මහත්මිය 2022 අප්‍රේල් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස පත් කරන ලද අතර ඇය 2023 දී ජාතික රක්ෂණ භාර අරමුදල හි භාණ්ඩාගාර නියෝජිතවරිය වේ. 2023 වසර තුළ ඇය මුදල් හා ආර්ථික ස්ථායීකරණ අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කළාය.

**රසල් ෆොන්සේකා මහතා (මණ්ඩල සාමාජික)**

රසල් ෆොන්සේකා මහතා 2022 නොවැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර ඔහු මහජන බැංකුවේ සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී වේ. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ B.Sc (විශේෂ) උපාධියක් සහ ඕස්ට්‍රේලියාවේ සදර්න් ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ලබා ඇත. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසලේ උසස් කළමනාකරණ වැඩසටහන සම්පූර්ණ කර ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සටහන්ගත ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.

**සිසිර කුමාර හේනාධීර මහතා (මණ්ඩල සාමාජික)**

සිසිර කුමාර හේනාධීර මහතා 2022 නොවැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. 2023 වසර තුළ ඔහු ජනාධිපති ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු ලෙස සේවය කළේය.

# ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම - 2023


එල්.ඒ.පී.එන්. ලියනආරච්චි මහත්මිය
ප්‍රධාන විධායක නිලධාරී
(වැඩබලන)


සාමිල් තුෂාර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී -
මෙහෙයුම්


නිමාලි පතිරණ මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී -
රක්ෂණ


ධම්මිකා වීරකෝන් මහත්මිය
මූල්‍ය අංශ ප්‍රධානී


නිමාලි පෙරේරා මහත්මිය
අග්‍රහාර ප්‍රධානී


ගිහාන් කොස්සින්න මහතා
තොරතුරු තාක්ෂණ ප්‍රධානී


උපේක්ෂා ඒකනායක මහත්මිය
ප්‍රාරක්ෂණ ප්‍රධානී


රජිත් ගුණසේකර මහතා
පර්යේෂණ හා විශ්ලේෂණ ප්‍රධානී


සමන් බණ්ඩාර මහතා
අභ්‍යන්තර විගණන ප්‍රධානී


අනුර සමරකෝන් මහතා
අග්‍රහාර පාරිභොගික සබඳතා
ප්‍රධානී


දේශානී නානායක්කාර මහත්මිය
ප්‍රතිරක්ෂණය සහ SRCCT
ප්‍රධානී


රන්දිමා මානගේ මහත්මිය
සාමාන්‍ය රක්ෂණ හිමිකම්
ප්‍රධානී



නිමේෂා සහබන්දු මහත්මිය
අග්‍රහාර විශ්‍රාමික ප්‍රධානී



අසංක ජයලත් මහතා
පරිපාලන ප්‍රධානී



ගයත්‍රි සොයිසා මහත්මිය
ආයෝජන ප්‍රධානී



නාමල් කාංචන මහතා
වියදම් හා ගෙවීම්
අංශ ප්‍රධානී



ලුම්බිණී උත්පලා පින්තෝ
මහත්මිය
නීති අංශ ප්‍රධානී



ගයනි සියඹලාගොඩ මහත්මිය
සභාපතිවරයාගේ ලේකම්



සිසිත චන්ද්‍රකුමාර මහතා
මූල්‍ය වාර්තාකරණ ප්‍රධානී



එම්.එන්.කේ.පඩිගමගේ මහතා
මාතර ශාඛා
ප්‍රධානී



ඉන්දීර වික්‍රමාරච්චි මහතා
මධ්‍යම ශාඛ ප්‍රධානී



සඳරුවන් රස්නායක මහතා
අවදානම් ඉංජිනේරු



සමීර වාස් මහතා
මෝටර් රථ ප්‍රතිරක්ෂණ
ප්‍රධානී



නුවන් දිසානායක මහතා
අලෙවිකරණ ප්‍රධානී



ගයාන් ෆ්‍රනැන්ඩෝ මහතා
ආයුගණක ප්‍රධානී
(Actuarial valuation)



චතුර පෙරේරා මහතා
තොරතුරු තාක්ෂණ පද්ධති
සංවර්ධන ප්‍රධානී



ධනුෂ්ක ආර්යදාස මහතා
මධ්‍යම ශාඛ ප්‍රධානී

# ව්‍යවසාය අවදානම් කළමනාකරණය

## හැඳින්වීම

ව්‍යවසාය අවදානම් කළමනාකරණය යනු ආයතනයක සෑම තරාතිරමකම පුද්ගලයන් විසින් ක්‍රියාත්මක කරන ආයතනයක් හරහා ක්‍රියාත්මක වන සහ ගලා යන ක්‍රියාවලිය වන අතර, ව්‍යවසාය පුරා, සෑම මට්ටමකින්ම සහ ඒකකයකම උපායමාර්ග සැකසීමේ යෙදෙන අතර, විභව සිදුවීම් හඳුනා ගැනීම සඳහා නිර්මාණය කර ඇති අවදානම පිළිබඳ ආයතන මට්ටමේ කළඹ දැක්මක් ඇතුළත් වේ. අවදානම් රුචිය තුළ අවදානම කළමනාකරණය කිරීම, ආයතනයක කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සාධාරණ සහතිකයක් සැපයීම මෙන්ම සංවිධානයක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොමු කිරීම ව්‍යවසාය අවදානම් කළමනාකරණයේ ප්‍රධාන අරමුණු වේ. සංවිධානයක සාර්ථක ව්‍යවසාය අවදානම් කළමනාකරණ මුලපිරීම සංවිධානයේ අවදානම් මට්ටමට සැලසුම් කර ඇති අතර අනෙකුත් ආයතනික ක්‍රියාකාරකම් සමඟ සමපාත වීම. එහි විෂය පථය තුළ විස්තීර්ණ වීම, වෙනස්වන තත්වයන්ට ප්‍රතිචාර දැක්වීමෙන් සාමාන්‍ය ක්‍රියාකාරකම් සහ ගතිකත්වයන් ඇතුළත් වේ.

ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යවසාය අවදානම් කළමනාකරණය එහි උපායමාර්ගික කළමනාකරණයේ කේන්ද්‍රීය කොටසකි. ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ජාතික රක්ෂණ භාර අරමුදලේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ අවදානම් ක්‍රමානුකූලව ආමන්ත්‍රණය කරයි. සැලකිය යුතු අවදානම් තක්සේරු කිරීම සහ සුදුසු අවදානම් ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීම ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණයේ අවධානය යොමු වනන කරුණු වේ. ජාතික රක්ෂණ භාර අරමුදලේ පරමාර්ථය වන්නේ සංවිධානයේ සියලුම ක්‍රියාකාරකම් වලින් උපරිම තිරසාර වටිනාකමක් ලබා ගැනීමයි. ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යවසාය අවදානම් කළමනාකරණය ආයතනයකට බලපෑම් කළ හැකි සාධකවල විභවය උඩු යටිකුරු වීම පිළිබඳ අවබෝධය වැඩි දියුණු කරයි. එය සාර්ථකත්වයේ සම්භාවිතාව වැඩි කරන අතර අසාර්ථකවීමේ සම්භාවිතාව සහ සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධ අවිනිශ්චිතතාවයේ මට්ටම යන දෙකම අඩු කරයි. අවදානමක් විශ්ලේෂණය කිරීමේ වැදගත් අංග වන්නේ අවදානමේ ස්වභාවය, මූලාශ්‍රය හෝ අවදානමේ වර්ගය, අවදානමේ බලපෑම හෝ බරපතලකම සහ අවදානමේ වාර ගණන තීරණය කිරීමයි. අවදානම් වර්ගීකරණ පද්ධතියක් භාවිතයෙන් මේ ආකාරයෙන් අවදානම් ඇගයීම වැඩිදියුණු කළ හැකිය. සමාන අවදානම් සමුච්චයන් හඳුනා ගැනීම සඳහා සංවිධානයකට අවදානම් වර්ගීකරණ පද්ධති යොදා ගත හැකි බැවින් ඒවා වැදගත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටුව ඒවායේ වගකීම්වල කොටසක් ලෙස අවදානම් කළමනාකරණ උපායමාර්ගය තීරණය කිරීමේ වගකීම දරයි. අවදානම් සහ අභ්‍යන්තර පාලනයන් අධීක්ෂණය කිරීම සහ සංවිධානයේ උපාය මාර්ග සේවකයින්ට සන්නිවේදනය කිරීම කෙරෙහි ද එය වගකිව යුතුය. ජාතික රක්ෂණ භාර අරමුදලේ හඳුනාගත් අවදානම් සම්භාවිතාව (සංඛ්‍යාත) සහ බලපෑම (ප්‍රතිවිපාක) ප්‍රමාණනය තක්සේරු කිරීම අනුව ප්‍රමුඛතාවය මත පෙළ ගස්වනු ලැබේ.

## R01 -උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති නොහැකියාව උපායමාර්ගික අවදානම ලෙස හැඳින්වේ. ජාතික රක්ෂණ භාර අරමුදලේ උපායමාර්ගික අභිප්‍රායට බලපෑම් ඇති කළ හැකි රක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ ශ්‍රී ලංකාවේ පරිසරයේ පවතින තරඟකාරී සහ පාරිභෝගික ගතිකත්වය සාමාන්‍ය පරිසරයේ දේශපාලන, තාක්ෂණික, සමාජ - සංස්කෘතික, ආර්ථික වර්ධනයන් නිරීක්ෂණය කිරීමෙන් මෙය කළමනාකරණය කෙරේ. මණ්ඩලය සහ සංවිධානයේ අරමුණු සහ දිශාව පිළිබඳ ඉහළ කළමනාකාරිත්ව තීරණ මගින් මූලෝපායික අවදානම් තීරණය කරනු ලබයි. උපායමාර්ගික තීරණ ඵලදායී ලෙස ගැනීම සඳහා, මණ්ඩලයට සහ කළමනාකාරිත්වයට ව්‍යාපාරය ක්‍රියාත්මක වන ආකාරය සහ ආර්ථික, වාණිජ සහ තාක්ෂණික පරිසරයන්හි අදාළ අංශ පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු අවශ්‍ය වේ.

සංවිධානය මුහුණ දෙන විවිධ උපාය මාර්ගික අවදානම් තක්සේරු කිරීම සඳහා, මණ්ඩලයට දැක්ම පිළිබඳ පුළුල් අවබෝධයක් තිබිය යුතුය; එබැවින් ආයතනයේ ඉහළ අධිකාරියක් කුසලතා, දැනුම සහ පළපුරුද්ද තුල සමතුලිත විය යුතු බව පාලන වාර්තා නිර්දේශ කරයි. කෙසේවුව ද, මණ්ඩලය සහ කළමනාකාරීත්වය උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් ආයතනික පාලන විශිෂ්ට භාවිතයන් අනුගමනය කළ ද, නිලධාරීන් නිවැරදි තීරණ ගන්නා බවට මෙය අවශ්‍යයෙන්ම සහතික නොවේ. ඒවා ව්‍යාප්ත කිරීමට සහ දිගු කාලීනව ඉදිරියට යාමට පවා සංවිධානවලට (නිසැකවම) ගැනීමට සිදු විය හැකි අවදානම් වේ. ජාතික රක්ෂණ භාර අරමුදලේ කෙටි කාලීනව වෙනත් උපාය මාර්ගික අවදානම් පිළිගත හැකි නමුත් දිගු කාල රාමුවක් තුළ එම අවදානම් අඩු කිරීමට හෝ ඉවත් කිරීමට පියවර ගත හැකිය.

අවසාන වශයෙන්, විය හැකි සෘණාත්මක බලපෑම් ඉතා ඉහළ විය හැකි නිසා හෝ සාර්ථකත්වයේ සම්භාවිතාව ඉතා අඩු විය හැකි බැවින් අවදානම් ගැනීම සහතික කිරීමට ඉදිරිපත් කරන ප්‍රතිලාභ ප්‍රමාණවත් නොවන බැවින් ඇතැම් අවදානම් වළක්වා ගත යුතු වන අතර, ඇතැම් ව්‍යාපාරික අවස්ථා පිළි නොගත යුතුය.

## R02 – ප්‍රාරක්ෂණ අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල එහි විචක්ෂණ, ක්‍රියාශීලී සහ ඵලදායි අවදානම් කළමනාකරණය සහ අවම කිරීමේ මූලික මූලධර්මවලට අනුකූලව, එහි නිරාවරණය සෑම විටම සමතුලිත සහ පිළිගත හැකි මට්ටමේ අවදානමක් ඇති බව සහතික කරයි. දැඩි අයදුම්පත් අනුමත කිරීමේ ක්‍රියාවලීන් සහ විචක්ෂණශීලී නිරාවරණය සහ ආවරණ සීමාවන් පවත්වා ගැනීම මගින් මෙම උපාය මාර්ගය සාක්ෂාත් කරගනු ලැබේ. මීට අමතරව, පාඩු සහ රඳවා ගැනීමේ අත්දැකීම් අවබෝධ කර ගැනීම සඳහා සංවිධානය අඛණ්ඩ අධීක්ෂණය සහ ඇගයීම ක්‍රියාත්මක කරයි. අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන්, අභ්‍යන්තර විගණන මගින් සියලුම මාර්ගෙ ්පදේශ දැඩි ලෙස පිළිපදින බව සහතික කරන අතරතුරම ප්‍රාරක්ෂණය ක්‍රියාවලියක් සිදු වන බව සහතික කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල සමත් වේ. ප්‍රාරක්ෂණය කිරීමේ දී නිවැරදි අවදානම් මට්ටම් පැවරීම සඳහා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නිපුණතාවයකින් සමන්විත බව සහතික කිරීම සඳහා අභ්‍යන්තරව පුහුණුව ද ලබා දේ.

## R03 - නියාමන සහ අනුකූලතා අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිපත්ති සහ ක්‍රියපටිපාටි කාලානුරූපව සමාලෝචනය කර එහි අභ්‍යන්තර පාර්ශ්වකරුවන්ට සන්නිවේදනය කරන අතරම, ව්‍යාපාරයම ක්‍රියාකාරිව අනුකූල බව සහතික කිරීම සඳහා අදාළ කර්මාන්ත සංසදවලට සහභාගී වීමට අමතරව සියලු නියාමන වෙනස්කම් සහ වර්ධනයන් අඛණ්ඩව අධීක්ෂණය කරයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, මුදල් අමාත්‍යාංශය සහ විගණකාධිපති ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන නියාමකයින් වේ.

## R04 - ණය අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ ව්‍යාපාර කටයුතුවල නියැලි ආයතන සහ පුද්ගලයන්ගේ ණය සුදුසුකම් සහ මූල්‍ය ස්ථාවරත්වය ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් අඛණ්ඩව අධීක්ෂණය කරයි. එබැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ව්‍යාපාරයේ ප්‍රමාණය සහ වර්ගය මත පදනම්ව ව්‍යුහගත කර ඇති අතර, සියලුම කාර්ය මණ්ඩලයේ මග පෙන්වීම සඳහා ණය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. ජාතික රක්ෂණ භාර අරමුදල සියළුම ප්‍රතිපත්ති සඳහා වාරික ගෙවීම සම්බන්ධයෙන් දැඩි ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන අතර ගෙවිය යුතු මුදල් නොගෙවන විට දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරයි.

## R05 - වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු විවිධ ව්‍යාපාර ක්‍රියාකාරකම් නැවැත්වීමේ හෝ අඩුවීමේ අවදානමයි. ප්‍රතිරක්ෂණ, සාමාන්‍ය රක්ෂණ, වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්ත රක්ෂණ, මෝටර් රථ රක්ෂණ, අග්‍රහාර රක්ෂණ වැනි බොහෝ උපාය මාර්ගික ව්‍යාපාරික ඒකකවලට විවිධාංගීකරණය කිරීමෙන් ජාතික රක්ෂණ භාර අරමුදලේ වෙළෙඳපොළ අවදානම අවම කර ඇත.

## R06 - මෙහෙයුම් අවදානම

මණ්ඩල තීරණ ගැනීමේ දී උපායමාර්ගික අවදානම් පිළිබඳ දැනුවත් කිරීමක් ඇතුළත් කළ යුතු වුවද, ඔවුන් ඉහළ මට්ටමේ උපාය මාර්ග කෙරෙහි අධික ලෙස අවධානය යොමු කිරීම සහ සංවිධානය තුළ 'බිම් මට්ටමේ' සිදුවෙමින් පවතින දේ නොසලකා හැරීමේ අනතුරක් තිබේ. යන්ත්‍ර ක්‍රියා විරහිත වීමෙන් නිෂ්පාදනය අඩාල වන්නේ නම්, ප්‍රධාන කාර්ය මණ්ඩලය සෑහීමකට පත් නොවන නිසා ඔවුන් ආයතනය හැර යන්නේ නම් සහ දුර්වල සේවා ගුණාත්මක භාවය නිසා විකුණුම් අහිමි වන්නේ නම්, සියලු ආකර්ෂණීය නව සැලසුම් ක්‍රියාත්මක කිරීමට පෙර ව්‍යාපාරය බරපතල ගැටළුවලට මුහුණපෑ හැකිය. මේ සියල්ල - අභ්‍යන්තර සම්පත්, පද්ධති, ක්‍රියාවලි සහ සංවිධානයේ සේවකයින් හා සම්බන්ධ මෙහෙයුම් අවදානම් වේ.

ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම්වලට නිරාවරණයවීම, අනුගමනය කළ ක්‍රියාමාර්ග සහ ක්‍රියාවට නංවා ඇති අවදානම් අධීක්ෂණය කිරීම සඳහා විවිධ කමිටු ස්ථාපිත කරයි. කමිටු මගින් සමස්ත සංවිධානය පුරා මෙහෙයුම් අවදානම් තක්සේරු කළ හැකි අතර, වඩාත්ම වැදගත් අවදානම් මොනවාද සහ ඒවාට එරෙහිව ගත යුතු පියවර මොනවා ද යන්න තීරණය කරයි. පාලන පද්ධති සඳහා ප්‍රමුඛතා සැකසීම සහ විගණන කටයුතු මෙම අවදානම් ආවරණය වන බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණනය සමඟ සම්බන්ධ වීම මෙයට ඇතුළත් විය හැකිය.

වාරික එකතු කිරීමේ සහ හිමිකම් ගෙවීම්වල දෝෂ සහ විෂමතා අවම කිරීම සඳහා වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැලඹීම් සහ ත්‍රස්තවාදී අරමුදල සහ අනෙකුත් දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන කාර්යය ජාතික රක්ෂණ භාර අරමුදලේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. තවද, දෝෂ සහ විෂමතා අවම කිරීම සඳහා කාර්යාලීය කටයුතු පරිගණක ගත කර ඇත. මීට අමතරව, නිශ්චිත අවදානම් සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීම සහතික කිරීම මෙන්ම සිය ප්‍රදේශයේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම රේඛීය කළමනාකරුවන්ගේ වගකීම්වල ප්‍රධාන කොටසකි. කළමනාකරුවන් ඔවුන්ගේ ප්‍රාදේශීය සේවා පරිසරය ගැන සැලකිලිමත් වන අතර අවදානම් ඇතිවීමට හේතු විය හැකි කොන්දේසි සම්බන්ධයෙන් පියවර ගනු ඇත.

## R07 - ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු වත්මන් තත්ත්වයන් යටතේ හෝ ආතති තත්වයන් යටතේ මුදල් අවශ්‍යතා සපුරාලීමට මුදල් සම්පත් ප්‍රමාණවත් නොවීමේ අවදානම ලෙස අර්ථ දැක්විය හැක. ජාතික රක්ෂණ භාර අරමුදල තත්ත්වය තුළ, ද්‍රවශීලතා අවදානම යනු මුදල් අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින විට හිමිකම් ගෙවීම්, ප්‍රතිරක්ෂණ ගෙවීම් සහ භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම වැනි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට ඇති නොහැකියාවයි. සෑවිදි, විවිධ කල්පිරීම්වල භාණ්ඩාගාර බිල්පත්, විවිධ කල්පිරුම් සහ ණයකරවල භාණ්ඩාගාර බැඳුම්කර වැනි විවිධ කල්පිරීම් සහිත ආයෝජන විවිධාංගීකරණය කිරීම තුළින් මෙම අවදානම අවම කර ඇත. මූල්‍ය ස්ථාවරත්වය සහ අධීක්ෂණ අරමුණු සඳහා, ජාතික රක්ෂණ භාර අරමුදල මුහුණ දෙන විවිධ ද්‍රවශීලතා අවදානම මෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදලේ ද්‍රවශීලතා තත්ත්වයන් විශ්ලේෂණය කිරීම වැදගත් වේ. රක්ෂණ සමාගම්වල අභ්‍යන්තර දත්ත වෙත ප්‍රවේශ වීමෙන් ද්‍රවශීලතා ස්ථාන ගණනය කිරීම සිදු කළ හැක.

## R08 - අන්තර්ජාතික අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යාපාර කෙරෙහි සෘජු බලපෑමක් ඇති ජාත්‍යන්තර දේශපාලන සහ සමාජ-ආර්ථික ගතිකත්වය ජාතික රක්ෂණ භාර අරමුදලේ මඟින් අධීක්ෂණය කරයි. ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් ප්‍රතිරක්ෂණයට අදාළ ජාත්‍යන්තර ව්‍යාපාරික ප්‍රවණතා විශේෂයෙන් නිරීක්ෂණය කිරීමෙන් මෙම අවදානම කළමනාකරණය කර ඇත.

## R09 – කීර්තිමත් අවදානම

කීර්තිමත් අවදානම් යනු සාරභූතව ජාතික රක්ෂණ භාර අරමුදලේ කීර්තිනාමයට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කළහොත් සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වීමට ජාතික රක්ෂණ භාර අරමුදලේ ඇති හැකියාවට බලපෑම් කළ හැකි නිශ්චිත අවදානම් සමූහයකට නිරාවරණය වීමේ මිනුමයි. ජාතික රක්ෂණ භාර අරමුදල තම නාමය වටා ඇති වෙළඳපොළ කීර්තිය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන එය පාරිභෝගිකයින්ගේ, පාර්ශ්වකරුවන්ගේ සහ මහජනතාවගේ මතය බැරෑරුම් ලෙස සලකයි. ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිසි ලෙස අනුගමනය කිරීම සහතික කිරීම සඳහා ශක්තිමත් පාලන සහ අනුකූලතා යාන්ත්‍රණයන් සමඟින්, සියලු උත්සාහයන් යහපත් ආයතනික වටිනාකම්

සහිත ධනාත්මක වැඩ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා යොමු කෙරේ. ප්‍රමිතිකරණය, තාක්ෂණය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කීර්තිනාමයට හානි කළ හැකි සිදුවීම්වල සම්භාවිතාව සහ බරපතලකම අඩු කරයි. ගුණාත්මක සේවාවන් අඛණ්ඩව සැපයීම කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, හානිකර අත්වැරැද්දක් සිදුවීමට ඇති ඉඩකඩ බෙහෙවින් අඩුය. තවද, සෑම අවස්ථාවකදීම, ධනාත්මක සන්නිවේදනයන් අඛණ්ඩව ජාතික රක්ෂණ භාර අරමුදලේ කීර්තිය ගොඩනංවනු ඇත.

## R10 – වංචා අවදානම

වංචා අවදානම යනු සංවිධානයේ අභ්‍යන්තර හෝ බාහිර පුද්ගලයන්ගේ වංචනික ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස අනපේක්ෂිත මූල්‍ය, ද්‍රව්‍යමය හෝ කීර්තිනාමය අහිමි වීමේ අවදානමයි. වෘත්තීය පුහුණුවට ජාතික රක්ෂණ භාර අරමුදල තුළ ෑවංචා-විරෝධී පියවරයන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකි තොරතුරු සහ පද්ධති විශ්ලේෂණය ඇතුළත් වේ. තවද, ජාතික රක්ෂණ භාර අරමුදල ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කර ඇත. වංචනික ක්‍රියාකාරකම් වල අවදානම වළක්වා ගැනීම සහතික කිරීම සඳහා ආයතනය තුළ ඇති සියලුම අභ්‍යන්තර පාලනයන් අඛණ්ඩව සමාලෝචනය කරන ඵලදායී අභ්‍යන්තර විගණන කාර්යයක් එහි ඇත.

## R11 - විදේශ විනිමය අවදානම

විදේශ විනිමය අවදානම යනු ව්‍යාපාරයක මූල්‍ය කාර්යසාධනය හෝ මූල්‍ය තත්ත්වය ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාතවල වෙනස්වීම් මගින් බලපෑමට ලක්වීමේ අවදානමයි. විදේශ විනිමය ගනුදෙනු අවදානම ඉවත් කිරීම සඳහා, ප්‍රතිරක්ෂණ වාරික ගෙවීම සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම් දිවයිනේ මුදල් වටිනාකම්වලින් ගිවිසුම්ගත කර ඇත.

## R12 – ප්‍රතිරක්ෂණ අවදානම

ප්‍රතිරක්ෂණ අවදානම යන්නෙන් අදහස් කරන්නේ ප්‍රතිරක්ෂණ සමාගමට හෝ ප්‍රාථමික රක්ෂණකරුට ප්‍රතිරක්ෂණකරුවෙකුගෙන් නියම වේලාවට සහ සුදුසු පිරිවැයකින් රක්ෂණයක් ලබා ගැනීමට ඇති නොහැකියාවයි. අහිතකර වෙළඳපල තත්ත්වයන් වැනි හේතූන් නිසා මෙම නොහැකියාව ඇති විය හැකිය. කෙසේ වෙතත්, 2018 දී, විශිෂ්ට මූල්‍ය ශ්‍රේණිගත කිරීම් සහ ඉහළ ගෝලීය ශ්‍රේණිගත කිරීම් ඇති ප්‍රතිරක්ෂණකරුවන් සමග එහි ප්‍රතිරක්ෂණ කළඹ ආවරණය කිරීම සඳහා සාධාරණ පිරිවැයකින් ප්‍රතිරක්ෂණ ආවරණ NITF ලබා ගත්තේය.

2023 දී, 30% අනිවාර්ය retrocession ප්‍රතිරක්ෂණ ආවරණය අවසන් විය. අලුත් retrocession ප්‍රතිරක්ෂණ ආවරණයක් සඳහා දෙවරක් උත්සහ කල ද ලංසු ඉදිරිපත් වුයේ නැත. තුන්වන උත්සහයේ දී ලංසු 2ක් ඉදිරිපත් විය. එනමුත් තෝරාගත් ලංසුකරුට අවශ්‍ය මූල්‍ය ශ්‍රේණිගත කිරීමක් සහිත ප්‍රතිරක්ෂණ මණ්ඩලයක් සදාගත නොහැකිවිය. වැඩ වර්ජන, කැරලි, කෝලහාල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදලෙහි ප්‍රතිරක්ෂක ආවරණය 2023.07.31 දින අවසන් විය. ඒ සඳහා ප්‍රසම්පාදන දැන්වීමක් පල කර අතර ඊට ලංසු 02ක් ඉදිරිපත් විය. වර්තමානයේ දී ඒ සඳහා ද 30% අනිවාර්ය ප්‍රතිරක්ෂණ ආවරණය සඳහා ද සුදුසු ප්‍රතිරක්ෂක ආවරණය ලබා ගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල නිරත වෙමින් සිටියි.

## R13 – තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු තාක්ෂණ අවදානම යනු ව්‍යාපාරික දත්ත, වැදගත් පද්ධති සහ ව්‍යාපාරික ක්‍රියාවලීන් සඳහා වන ඕනෑම තර්ජනයකි. එය ආයතනයක් තුළ තොරතුරු තාක්ෂණය භාවිතය, හිමිකාරීත්වය, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධ වීම, බලපෑම සහ භාවිතය හා සම්බන්ධ අවදානමයි. ජාතික රක්ෂණ භාර අරමුදල තුළ තොරතුරු තාක්ෂණය මඟින් රක්ෂණ, ප්‍රතිරක්ෂණ, මූල්‍ය සහ පරිපාලනය සඳහා ඉදිරිපස-අන්ත රක්ෂණ සහ පසු-අන්ත ERP විසඳුම් සහ ආධාරක විසඳුම් යොදවා ඇත. 2007 වසරේ සිට ඉල්ලුමට සරිලන ව්‍යාපාර වර්ධනයක් සඳහා සේවා සැපයීමෙන් අපගේ ගනුදෙනුකරුවන්ට, ගනුදෙනුකරුවන්ට සහ නියාමකයාට නිරවද්‍ය සහ යාවත්කාලීන තොරතුරු සමඟ තොරතුරු තාක්ෂණ සහාය ලබා දෙයි. තොරතුරු ආරක්ෂාව, අතිරික්තය සහ ලබා ගැනීමේ හැකියාව යටිතල පහසුකම් සහ දත්ත සමුදා යන අංශ දෙකෙන්ම සාක්ෂාත් කර ගනී.

## R14 – හිමිකම් පියවීමේ අවදානම

වංචනික, නෛතික සහ තාක්ෂණික සාධක හේතුවෙන් පැන නගින වියහැකි ආරවුල් වල අවදානම පාලනය කරනු ලබන්නේ හිමිකම් අනුමත කිරීමේදී සහ හිමිකම් සැකසීමේ දී රාජකාරි වෙන් කිරීමේ දී දැඩි රෙගුලාසි පැනවීමට මූලිකත්වය ගැනීමෙනි.

# තිරසරභාවය වාර්තාකරණය

තිරසාර වාර්තාකරණය යනු තිරසාර සංවර්ධනයේ ඉලක්කය කරා සංවිධානාත්මක කාර්ය සාධනය සම්බන්ධයෙන් අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන්ට මැනීම, හෙළි කිරීම සහ වගවීමයි. තිරසාර වාර්තාකරණයේ අරමුණ වන්නේ ආයතනයක සමාජ, පාරිසරික, සංස්කෘතික ආර්ථික කාර්ය සාධනය සහ බලපෑම මෙන්ම වාර්තාකරණ සංවිධානයක කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට ගෙන ඇති මුලපිරීම් පිළිබඳ තොරතුරු සැපයීමයි. එවැනි තිරසාරභාවයට තර්ජන පිළිබඳ ඔවුන්ගේ වැඩි අවබෝධය හේතුවෙන් තිරසාරභාවය රජයන් විසින් වැඩි වැඩියෙන් අවධානය යොමු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ රජයේ නියාමන අභිලාෂයන් සහ ඔවුන්ගේම තිරසාරභාවයට සහ නවෝත්පාදන සහ පිරිවැය අඩු කිරීමේ අවස්ථාවන්ට ඇති තර්ජන හේතුවෙන් සමාගම් වැඩි වැඩියෙන් තිරසාරභාවය පිළිබඳ සැලකිල්ලේ වාචාලකම අනුගමනය කරති. 2023 වර්ෂයේ රක්ෂණ කර්මාන්තය ඉදිරියට ගිය විට ව්‍යාපාර වල ආයතනික තිරසාරභාවය ප්‍රධාන අවධානයට ලක්වෙමින් පවතී. ඒ අනුව, ජාතික රක්ෂණ භාර අරමුදල ත්‍රිත්ව පහළම රේඛාවේ නව කාර්ය සාධන මානයන්, එනම් ආර්ථික සමෘද්ධිය, පාරිසරික හා සමාජ ගුණාත්මකභාවය සහ හැකි සෑම විටම සංවිධානාත්මක, ආර්ථික, පාරිසරික හා සමාජ කාර්ය සාධනය පිළිබඳ ගෝලීය වාර්තාකරණ මුලපිරීම් මාර්ගෝපදේශ වැලඳ ගැනීමෙන් "හොඳ වගකිවයුතු ආයතනික පුරවැසියෙකු" වීමෙන් තම ව්‍යාපාර කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට උත්සාහ කරයි. තිරසාරභාවය ජාතික රක්ෂණ භාර අරමුදල ආයතනික සංස්කෘතිය තුළ ගැඹුරින් මුල් බැසගෙන ඇති අතර එය එහි පිළිගත් ජීවන ක්‍රමයකි. ව්‍යාපාරික අරමුණු ඉක්මවා ගොස් ජාතිය උසස් කරන වටිනාකම් පද්ධතියක් දිරිමත් කරන සමාජයට බලපෑමක් කිරීමට එය උත්සාහ කරයි. එය ගොඩනගන සම්බන්ධතා සහ එය ව්‍යාපාර කරන ආකාරය තිරසාරභාවය යන සංකල්පය වටා කැරකෙයි. ජාතික රක්ෂණ භාර අරමුදල හි ක්‍රියාකාරකම් අපගේ ජාතියට අර්ථවත් ලෙස දායක වීමටත්, අපගේ සියලු පාර්ශවකරුවන් උසස් කිරීමට, සහාය දීමට සහ ශක්තිමත් කිරීමටත් අවංක හා හෘදයාංගම අරමුණක් පිළිබිඹු කරයි.

ජාතික රක්ෂණ භාර අරමුදල බද්දක් මගින් රුපියල් මිලියන 782 ක්, රුපියල් මිලියන 1,824 ක්, රුපියල් මිලියන 1,608 ක් සහ රුපියල් මිලියන 2,600 ක් 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂවලදී රජයේ ඒකාබද්ධ අරමුදලට පරිත්‍යාග කිරීමෙන් සිය දායකත්වය සැලකිය යුතු ලෙස වැඩි කර ඇති අතර එමගින් පහත වගුවේ දැක්වෙන පරිදි අතීත සම්ප්‍රදාය දිගටම පවත්වාගෙන යනු ලැබේ.

| වර්ෂය | අගය (රුපියල්) |
|---|---|
| 2023 | 2,600,000,000 |
| 2022 | 1,608,000,000 |
| 2021 | 1,824,000,000 |
| 2020 | 782,000,000 |
| 2019 | 3,267,970,000 |
| 2018 | 2,750,000,000 |
| 2017 | 1,500,000,000 |

වගුව: ඒකාබද්ධ අරමුදලට දායකත්වය

ණය ගෙවීමේ අපොහොසත් වීමේ (insolvency) සහ ණය අවදානම් අවම කිරීමෙන් මෙන්ම, ජාතික රක්ෂණ භාර අරමුදල සන්නාම ප්‍රතිරූපය ඉහළ නැංවීම මගින් පාරිභෝගිකයින්ට වඩාත් උසස් සේවාවක් සැපයීමේ අරමුණින්, ජාතික රක්ෂණ භාර අරමුදල ආයතනය 2023 වසරේදී 'BBB' ශ්‍රේණියේ ෆිච් (Fitch) ශ්‍රේණිගත කිරීමෙන් ලබාගෙන ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

## 1. පෙරවදන

මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන් සත් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් මඟින් ජාතික රක්ෂණ අරමුදල පාලනය වේ.

(අ) මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙකු;

(ආ) මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී;

(ඇ) සෞඛ්‍ය විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙකු;

(ඈ) රාජ්‍ය පරිපාලන විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙකු; සහ

(ඉ) මුදල්, බැංකුකරණය, රක්ෂණ කළමනාකරණය හෝ නීතිය යන ක්ෂේත්‍රවල සුදුසුකම් හෝ විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙක්.අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් අයෙකු සභාපති ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත.

පනතේ විධිවිධාන අනුව, මණ්ඩලයේ සියලුම සාමාජිකයින් පත් කළ දින සිට වසර පහක කාලයක් සඳහා තනතුරු දරනු ඇත. අධ්‍යක්ෂවරුන් 2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ අදාළ සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලමින් සකස් කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ මූල්‍ය ප්‍රකාශන වාර්තාව කොටස්කරුවන්ට ඉදිරිපත් කිරීමට සතුටු වෙති. මෙම වාර්තාව 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනත සහ එහි සංශෝධන, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ එහි සිදු කරන ලද සංශෝධන මෙන්ම ආයතනික පාලනයේ හොඳම භාවිතාවන් මගින් අවශ්‍ය තොරතුරු සපයයි. 2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා ඇති අතර, මණ්ඩල සාමාජිකයින් රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ විශිෂ්ට වාර්තාවක් පවත්වා ඇත. අනුමත ව්‍යාපාර සැලැස්ම සහ ආයතනයේ මූල්‍ය හා භෞතික ඉලක්ක මත පදනම්ව, ආයතනයේ කටයුතු නිසි පරිදි සිදු වන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ පාර්ශ්වකරුවන්ට වගකියයි.

## 2. ව්‍යාපාර සමාලෝචනය

### 2.1 දැක්ම මෙහෙවර සහ ආයතනික හැසිරීම

අරමුදලේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයන් වාර්ෂික වාර්තාවේ 9 වන පිටුවේ ප්‍රදර්ශනය කර ඇත. අරමුදලේ ව්‍යාපාරික කටයුතු එහි දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළම ආචාර ධර්ම ප්‍රමිතීන් පවත්වා ගනිමින් සිදු කරනු ලබන අතර, අමාත්‍යවරයා විසින් කලින් කලට හඳුනාගනු ලබන අවශ්‍යතා ඇති පුද්ගලයන්ට හෝ පුද්ගල කණ්ඩායම්වලට රක්ෂණය ලබා දීම තුළින් ඉහළ ආචාර ධර්ම සහිත ව්‍යාපාරික හැසිරීම් සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරයි.

### 2.2 ප්‍රධාන කටයුතු

2023 දී ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ රාජ්‍ය නිලධාරීන් සඳහා වූ වෛද්‍ය රක්ෂණ ක්‍රමය (අග්‍රහාර), අනිවාර්ය ප්‍රතිරක්ෂණ ක්‍රමය, මෝටර් රථ රක්ෂණ ක්‍රමය, මෝටර් නොවන රක්ෂණ ක්‍රම සහ වැඩ වර්ජන, කෝලාහල, සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාදී අරමුදල (SRCC&T) කළමනාකරණය කිරීමයි.

## 2.3 මූල්‍ය ප්‍රතිඵල

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රඥප්ත ගණකාධිකාරී ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS/SLFRS, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතට අනුකූලව සකස් කර ඇති අතර, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) අනෙකුත් නීති රීති වලට අනුකූල වේ. 2023 දී ජාතික රක්ෂණ භාර අරමුදල රු. බිලියන 11.402 ක දළ ලිඛිත වාරිකයක් (Gross Written Premium) වාර්තා කළ අතර, 2022 දී එය රු. බිලියන 12.201 ක් විය. 2023 වර්ෂය තුළදී, ජාතික රක්ෂණ භාර අරමුදල රු. බිලියන 6.546 ක බදු පසු ලාභයක් උපයා ඇති අතර, 2022 දී එය රු. බිලියන 6.836 ක් විය.

## 2.4 විගණකරුවන්

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2022 මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී.

**ඒකාබද්ධ පාලනය**

ශ්‍රී ලංකා ප්‍රඥප්ත ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනයේ හොඳම භාවිතාවන් පිළිබඳ සංග්‍රහය සහ යහපාලනය සහ ආයතනික පාලන භාවිතාවන් සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශවල අදාළ ක්ෂේත්‍ර කෙරෙහි නිසි අවධානය යොමු කරමින් යහපත් ආයතනික පාලන භාවිතාවන් ක්‍රියාත්මක කර ඇත.



ආචාර්ය විශාඛා වනසිංහ
සභාපති - 2024



ප්‍රතිභා වේලිකන්න
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - 2024

කොළඹ
2024.12.05

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. එනම්, ගරු මදාරා ද සිල්වා මහත්මිය (අධ්‍යක්ෂ - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය), ගරු ජී.සී. කරුණාරත්න මහත්මිය (අතිරේක ලේකම් - පරිපාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය), ගරු එච්.එම්.ටී.පී. හේරත් මහත්මිය (අධ්‍යක්ෂ - ආයතන, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය) යන අයයි. විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරන විගණන අධිකාරීවරයා (SA) නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වූ අතර, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි නිලධාරීන්ගෙන් කලින් කලට පැහැදිලි කිරීම් ඉල්ලා සිටින ලදී.

## විගණන විෂය පථය

2023 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව, විගණන හා කළමනාකරණ කමිටුවේ විෂය පථය අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, ඊට පහත කරුණු ඇතුළත් විය.

1. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම.
2. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සියලුම ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලි සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය සමාලෝචනය කිරීම සහ ඇගයීම.
3. පිරිවැය කාර්යක්ෂමතාව සඳහා සහ නාස්තිකාර වියදම් ඉවත් කිරීම සඳහා මූල්‍ය කාර්ය සාධනය නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.
4. බාහිර විගණකවරයා සමග සම්බන්ධීකරණය කිරීම සහ විගණකාධිපතිවරයාගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් පසු විපරම් කිරීම.
5. ව්‍යවස්ථා, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛවලට අනුකූල වී ඇත්දැයි තහවුරු කර ගැනීම.
6. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව තහවුරු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
7. අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා, පිළියම් යෙදීම සඳහා කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම.
8. රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ/අධ්‍යක්ෂණ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

## විගණන හා කළමනාකරණ කමිටු (AMC) රැස්වීම්

2023 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලද අතර, කමිටු රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් තොරතුරු සහිතව සටහන් කර ගෙන නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන ලදී. 4 වන කාර්තුව සඳහා වූ අවසන් රැස්වීම 2023 දෙසැම්බර් මාසයේදී පැවැත්විණි.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සැලැස්ම ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අතර, විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. විගණන හා කළමනාකරණ කමිටුවේ අදහස් සැලකිල්ලට ගැනීමෙන් පසු, සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. විගණන හා කළමනාකරණ කමිටුව අභ්‍යන්තර විගණනය මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ සිදු කරන ලද පරීක්ෂණ නිතිපතා සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.

## බාහිර විගණනය

විගණන හා කළමනාකරණ කමිටුව විගණන අධිකාරීවරයා විසින් ඉදිරිපත් කරන ලද අදහස් සහ යෝජනා කෙරෙහි අවධානය යොමු කළ අතර, බාහිර විගණන කළමනාකරණ ලිපි ද සමාලෝචනය කරන ලදී. ඒවා මත පදනම්ව තීරණ ගනු ලැබූ අතර, ඊට අදාළ පසු විපරම් විගණන සිදු කරමින් කළමනාකරණයට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දෙන ලදී.



සභාපති

විගණන හා කළමනාකරණ කමිටුව - ජාතික රක්ෂණ භාර අරමුදල

# මූල්‍ය වාර්තා



# විගණකාධිපතිවරයාගේ වාර්තාව

සභාපති,
ජාතික රක්ෂණ භාර අරමුදල

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතාවයන් පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ ("මණ්ඩලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභා ගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

i. මණ්ඩලය සමස්ථ රු.8,519,231 ක වටිනාකමකින් යුත් වසර 2 සිට වසර 5 දක්වා කාලය තුළ නොවෙනස් හා අයකර නොගත් මූල්‍ය නොවන වත්කම් වාර්තා කර තිබිණි. කෙසේවුවද, මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් වූ වෙන්කිරීම් සලසා නොතිබුණි.

ii. රු. 19,993,473 ක් ප්‍රතිරක්ෂණය කිරීමේ ලැබීම් ලෙස වාර්තා (NNIDS) වී තිබූ අතර වසර 5ක කාලයක් මෙම ප්‍රමාණය නොවෙනස්ව පැවතුණු අතර මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෙන්කිරීම් සලසා නොතිබිණි.

iii. 2016 සහ 2017 වර්ෂවල පිළිවෙලින් රු. 521,287,319 ක් සහ රු. 251,742,612 ක් වූ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ හිමිකම් පෑම නොවෙනස්ව පවතින බව නිරීක්ෂණය විය. මෙම ගෙවීම් සිදු කිරීම උදෙසා බැඳීමක් තවමත් පවතීද යන්න තහවුරු කර නොතිබිණි.

iv. මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිරක්ෂණ ලැබීම් ලෙස රු. 1,417,548,336 ක ප්‍රමාණයක් වාර්තා වනු ලැබූ අතර සමාලෝචන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෙම ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මුදලින් රු. 833,899,635 හෝ 58% ක් හානිය සඳහා වෙන් කිරීම් කර ඇත. කෙසේ වුවද, රු. 583,648,701 ක් වූ ඉතිරි ශේෂය අයකර ගැනීම ගැනීමේ හැකියාව සඳහා ලිඛිත සාක්ෂි සපයා නොතිබුණි.

v. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 ( LKAS 12) ප්‍රකාරව, නිශ්චිත බදු නිදහස් කිරීමක් අදාළ නොවන අවස්ථාවලදී, බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම්/වගකීම් හඳුනාගනු ලැබිය යුතුය. සමාලෝචිත වර්ෂය සඳහා විලම්බිත බදු ගණනය කිරීම සඳහා වත්කම් භාවිත කිරීමේ වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් භාවිතා කිරීමේ අයිතිය ලෙස සලකා නොතිබුණි.

vi. පහත සඳහන් හේතූන් මත සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු වියදම උචිත නොවන පරිදි ගණනය කරනු ලැබ ඇත.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි සහ බදු - පෙර ලාභය සහ ආදායම් බදු අරමුණ සඳහා බදු පෙර ලාභය අතර වෙනස රු. 1,011,894,272 බවට නිරීක්ෂණය විය.

(ආ) ප්‍රතිරක්ෂණ ලැබීම් සහ වාරික ලැබීම් මත හානිය සඳහා වෙන් කිරීම් ශේෂයන් පිළිවෙලින් රු.863,896,464 සහ රු.149,743,612 ක් වන බව නිරීක්ෂණය වූ අතර බදු අය කළ හැකි ලාභය ගණනය කිරීම සඳහා මෙම ශේෂයන් සලකා බලා නොතිබුණි. .

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි හානිය සඳහා ප්‍රතිවර්තනය සහ ආදායම් බදු අරමුණු සඳහා අවසර නොලත් වියදම් ලෙස එකතු කරන ලද හානිය සඳහා ප්‍රතිවර්තනය අතර රු. 5,579,980 ක වෙනසක් නිරීක්ෂණය විය.

vii. 2022 වර්ෂයේ සිට ගෙවිය යුතු කොමිස් මුදල සහ ගිණුම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදලට අදාළවන රු.64, 899,542 ක මුදලක් නොවෙනස්ව පවතින බව නිරීක්ෂණය විය. මෙම ගෙවීම් සිදු කිරීමට බැඳීයාවක් තවමත් තිබේද යන්න තහවුරු කර නොමැත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**කාරණය අවධාරණය කිරීම**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන  නැවත ප්‍රකාශ කිරීම සඳහා හේතු සහ 2023.12.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට සහ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම ප්‍රකාශනයට එහි බලපෑම දක්වනු ලබන මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 40 කෙරෙහි අපෙගේ අවධානය යොමු කෙරේ.මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය නොකරනු ලබයි.

## 1.3 මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2023 හි අන්තර්ගතව ඇති වෙනත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනෙන් පසු මා හට ලබා දිය යුතු යැයි  අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධ විගණන වාර්තාවේ අන්තර්ගත නොවන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2023 හි ඇතුළත් කර තිබෙන තොරතුරු වලින් අනෙකුත් තොරතුරු අන්තර්ගත වේ. කළමනාකරණය  අනෙකුත් තොරතුරු සඳහා වගකීම දරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ මතය ආනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ සම්බන්ධයෙන් යම් ආකාරයක සහතික  කිරීමේ නිගමනයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණනයට අදාලව, වෙනත් තොරතුරු ලබා ගැනීමට හැකි වූ විට ඉහත හදුනාගත් එම තොරතුරු කියවා බැලීම මාගේ වගකීම වන අතර එසේ කිරීමේදී, වෙනත් තොරතුරු ප්‍රමාණාත්මකව මූල්‍ය ප්‍රකාශන සමග  අනනුකූල වේද හෝ විගණනයේදී  හෝ වෙනත් ආකාරයෙන් ලබා ගත් මාගේ දැනුම ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශ කර තිබීම පෙනෙන්නට තිබේද යන්න සළකා බලනු ලබයි.

මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2023 කියවන විට,එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් තිබෙන බවට මම නිගමනය කරයි නම්,  නිවැරදි කිරීම සඳහා එම කරුණ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන් දැනුවත් කිරීමට අවශ්‍ය කෙරේ.තවදුරටත් ප්‍රමාණාත්මක නිවැරැදි නොකළ සාවද්‍ය ප්‍රකාශනයන් පවතී නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ඉදිරියේදී පාර්ලිමේන්තුව වෙත සභා ගත කරනු ලබන මාගේ වාර්තාවේ ඒවා අන්තර්ගත කරනු ලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම
කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේනම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබදව ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1 2018 අංක 19 දරන විගණන පනතෙහි පහත අවශ්‍යතා සඳහා විශේෂිත විධිවිධාන ඇතුලත් වේ.**

2.1.1 මාගේ වාර්තාවෙහි තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ විස්තර කළ කරුණුවල බලපෑම හැරෙන්නට, විගණනය සඳහා අවශ්‍ය වනු ලබන තොරතුරු සහ පැහැදිලි කිරීම් විගණනයේදී මා ලබාගත් අතර මාගේ විගණන පරීක්ෂණයෙන් පෙන්නුම් කරන පරිදි 2018 අංක 19 දරන විගණන පනතෙහි වගන්ති 12(අ) අවශ්‍යතාවන් ප්‍රකාරව මණ්ඩලය විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ගනු ලැබ ඇත.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවයට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂයට අනුකූල වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති (iii), (සඪ) හි විගණන කරුණු හැර, පෙර වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ.

**2.2 ප්‍රමාණාත්මක කරුණු වලට පමණක් සීමා වූ, ඉටු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව, කිසිවක් මගේ අවධානයට යොමු වී නොමැත.**

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, සාමාන්‍ය කටයුතුවලින් බැහැර වූ, මණ්ඩලය විසින් එළඹෙන ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ පාලක ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් ඇති බව ප්‍රකාශ කිරීමට.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතියක්, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් කිසිවක් මණ්ඩලය විසින් පිළිපැද නොමැති බව ප්‍රකාශ කිරීමට.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මණ්ඩලය එහි බලතල, කාර්යයන් සහ රාජකාරී ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, අදාළ නීතිවලට අනුකූලව සහ කාල රාමු තුළ මණ්ඩලයේ සම්පත් ආර්ථික වශයෙන්, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීමට.

W.P.C. වික්‍රමරත්න
විගණකාධිපති




# මූල්‍ය ප්‍රකාශන

# 2023

**ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**
2023 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2023<br>රු. | 2022<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික | 1 | 11,402,441,499 | 12,201,341,213 |
| අග්‍රහාර තුළින් ලද දායකත්වය | 1 | 6,804,410,342 | 6,812,706,561 |
| එකතු කල බෝග රක්ෂණ බදු | | 2,441,408,966 | 2,572,862,779 |
| පවරා දෙනු ලැබූ ප්‍රතිරක්ෂණ වාරික | | 6,707,708 | (684,014,374) |
| **ශුද්ධ ලිඛිත වාරික** | | **20,654,968,515** | **20,902,896,180** |
| උපයා නොගත් රක්ෂණ වාරික සඳහා වන සංචිතවල ශුද්ධ වෙනස්වීම | | (476,271,792) | (52,131,046) |
| UPR හි ප්‍රතිරක්ෂනකරුවන්ගේ කොටස් වෙනස | | (100,748,210) | 36,721,473 |
| **ශුද්ධ ඉපැයූ වාරිකය** | | **20,077,948,513** | **20,887,486,607** |
| | | | |
| **වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| ගාස්තු හා වට්ටම් ආදායම් | 2 | 1,349,912 | 1,301,773 |
| ආයෝජන සහ වෙනත් ආදායම් | 3 | 7,331,609,537 | 5,086,515,142 |
| **වෙනත් ආදායම්** | | **7,332,959,449** | **5,087,816,914** |
| | | | |
| දළ ප්‍රතිලාභ සහ හිමිකම් දැරීම් | 4 (a) | (10,361,559,541) | (9,576,889,921) |
| ප්‍රතිරක්ෂණකරුවන්ට පවරා ඇති හිමිකම් | 4 (b) | (452,855,860) | 2,016,134,008 |
| කොන්ත්‍රාත් වගකීම්වල දළ වෙනස | 4 (c) | 98,144,877 | (3,583,632,596) |
| ප්‍රතිරක්ෂණකරුවන්ට පවරා ඇති කොන්ත්‍රාත් වගකීම්වල වෙනස | 4 (d) | - | - |
| දරන ලද නමුත් වාර්තා නොවූ (IBNR) හිමිකම්පෑම් හි දළ වෙනස | 4 (e) | (1,197,669,565) | (3,548,680,512) |
| **ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්** | | **(11,913,940,089)** | **(14,693,069,021)** |
| | | | |
| ප්‍රාරක්ෂණ (Underwriting) සහ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක් | 5 | (1,901,780,800) | (2,161,834,671) |
| | | | |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | 6.1 | (2,053,128,389) | (578,060,096) |
| මූල්‍ය පිරිවැය සහ අනෙකුත් අදාළ පිරිවැය | 6.2 | (5,013,656) | (8,510,392) |
| | | | |
| **සම්පූර්ණ ප්‍රතිලාභ, හිමිකම් සහ අනෙකුත් වියදම්** | | **(15,873,862,934)** | **(17,441,474,181)** |
| බදු වලට පෙර ලාභය/(අලාභය) | | **11,537,045,028** | **8,533,829,340** |
| වසර සඳහා ආදායම් බදු | | (4,977,397,379) | (1,697,676,607) |
| විලම්භිත බදු | | (13,752,383) | (429,114) |
| **වසරට අදාළ බදු ගෙවීමෙන් පසු ලාභය/(අලාභය)** | | **6,545,895,266** | **6,835,723,619** |
| | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්හි ශුද්ධ වෙනස | | 2,663,729,759 | (2,796,453,741) |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම මත ආයුගණක ලාභය/(අලාභය) | | (38,243,327) | 26,492,484 |
| ඉහත දෑ මත විලම්භිත බදු වගකීම | | 19,420,743 | (930,803) |
| | | | |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම, ශුද්ධ බදු** | | | |
| | | | |
| **සම්පූර්ණ විස්තීර්ණ ආදායම** | | **9,190,802,437** | **4,064,831,556** |

Page 01

**ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**
2023 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2023<br>රු. | 2022<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 7 | 5,937,043 | 12,253,367 |
| දේපළ, පිරියත සහ උපකරණ | 8 | 42,743,013 | 31,748,602 |
| බදු වත්කම් භාවිතය සඳහා බදුකරුගේ අයිතිය | 9 | 98,629,532 | 29,944,625 |
| මූල්‍ය වත්කම් | 10 | 43,283,419,678 | 29,560,640,208 |
| අයවිය යුතු ප්‍රතිරක්ෂණ | 11 | 1,552,036,536 | 3,118,276,183 |
| අයවිය යුතු වාරික | 12 | 4,638,288,422 | 5,829,559,264 |
| අයවිය යුතු අධිභාර බදු | | 1,196,274,044 | 1,196,274,044 |
| මෘදු ණය | 13 | 1,730,785 | 2,708,762 |
| වෙනත් මූල්‍යමය නොවන වත්කම් | 14 | 130,383,159 | 228,757,405 |
| විලම්භිත කොමිස් මුදල් | 15 | 819,635,744 | 840,496,110 |
| බැංකුවේ සහ අතැති මුදල් | 16 | 1,257,506,630 | 1,419,456,545 |
| **මුළු වත්කම්** | | **53,026,584,586** | **42,270,115,114** |
| | | | |
| **හිමිකාරිත්වය සහ වගකීම්** | | | |
| රඳවාගත් ඉපැයීම් | | 499,491,152 | 297,775,369 |
| හිමිකාරිත්වයේ වෙනත් අංග | | (283,817,429) | (2,909,303,861) |
| සංචිත ප්‍රතිතක්සේරු කිරීම | | (2,102,126) | (2,102,126) |
| සමුච්චිත අරමුදල -SRCC | | 25,853,622,290 | 22,128,863,550 |
| **මුළු හිමිකාරිත්වය** | | **26,067,193,887** | **19,515,232,931** |
| | | | |
| **වගකීම්** | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් | 20 | 20,598,773,647 | 18,922,228,957 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 21 | 52,969,759 | 10,704,256 |
| විලම්භිත බදු | | 34,252,433 | 1,079,307 |
| බදු ණයකරු | 22 | 89,502,202 | 42,879,795 |
| ආදායම් බදු | 17 | 3,585,233,095 | 1,755,097,846 |
| වෙනත් වගකීම් | 18 | 2,589,044,739 | 2,022,892,019 |
| බැංකු අයිරාව | 16 | 9,614,823 | - |
| **මුළු වගකීම්** | | 26,959,390,698 | 22,754,882,181 |
| **මුළු හිමිකාරිත්වය සහ වගකීම්** | | **53,026,584,586** | **42,270,115,114** |

0

……………………………..
ඩබ්. එම්. ඩී. කේ. වීරකෝන්
ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැඩබලන)
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

……………………………..
එල්. ඒ. ජී. එන්. ලියනාරච්චි
ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)

පිටු අංක 5 සිට 54 දක්වා පිටුවල සඳහන් ගිනුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්ගේ අත්‍යවශ්‍ය කොටසක් නිර්මාණය කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශනයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, ඔවුන් වෙනුවට මෙහි අත්සන තබනු ලැබේ.

……………………………..
අධ්‍යක්ෂ

……………………………..
අධ්‍යක්ෂ

2024 පෙබරවාරි 28
කොළඹ

Page 02

**ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**
2023 දෙසැම්බර් 31 දිනට

**2022**

| | සටහන් | සමුච්චිත අරමුදල - NITF | AFS (විකිණීම සඳහා වන) සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | SRCC අරමුදල් | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2022.01.01 දිනට ශේෂය | | (588,652,855) | (139,342,604) | (2,102,126) | 17,786,637,352 | | **17,056,539,766** |
| | | | | | | | - |
| වර්ෂය සඳහා ලාභය | | | | | | 6,049,158,366 | **6,049,158,366** |
| **සමුච්චිත අරමුදලට පැවරීම** | | 81,978,927 | | | 5,967,179,439 | (6,049,158,366) | - |
| පාරිතෝෂික ඇගයීම මත ආයුගණක (ප්‍රතිලාභ) / අලාභය | | | 26,492,484 | | | | **26,492,484** |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස | | | (2,796,453,741) | | | | **(2,796,453,741)** |
| විලම්භිත බදු | | | | | 930,803 | | **930,803** |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල් | | | | | (1,608,000,000) | | **(1,608,000,000)** |
| | | **(506,673,928)** | **(2,909,303,861)** | **(2,102,126)** | **22,146,747,594** | **-** | **18,728,667,679** |

**2023**

| | සටහන් | සමුච්චිත අරමුදල - NITF | AFS (විකිණීම සඳහා වන) සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | SRCC අරමුදල් | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2023.01.01 දිනට ශේෂය | | (506,673,928) | (2,909,303,861) | (2,102,126) | 22,146,747,594 | - | **18,728,667,679** |
| 2022/12/31 දිනට නැවත ප්‍රකාශන ගැලපීම | 40 | 804,449,297 | - | - | 17,884,044 | | **822,333,341** |
| 2023.01.01 දිනට ශේෂය | | **297,775,369** | **(2,909,303,861)** | **(2,102,126)** | **22,128,863,551** | | **19,515,232,932** |
| වර්ෂය සඳහා ලාභය | | | | | | 6,545,895,266 | **6,545,895,266** |
| **සමුච්චිත අරමුදලට පැවරීම** | | 201,715,783 | | | 6,344,179,482 | (6,545,895,266) | - |
| පාරිතෝෂික ඇගයීම මත ආයුගණක (ප්‍රතිලාභ) / අලාභය | | | (38,243,327) | | | | **(38,243,327)** |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස | | | 2,663,729,758.66 | | | | **2,663,729,759** |
| විලම්භිත බදු | | | | | (19,420,743) | | **(19,420,743)** |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල් | | | | | (2,600,000,000) | | **(2,600,000,000)** |
| | | **499,491,152** | **(283,817,429)** | **(2,102,126)** | **25,853,622,290** | **-** | **26,067,193,887** |

Page 03

## ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2023 | 2022 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් මුදල් ප්‍රවාහ** | | | |
| බදුවලට පෙර ලාභය | | 11,537,045,028 | 8,533,829,340 |
| **ගැළපුම්:** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම | | 6,736,146 | 6,885,544 |
| ආපදා ණය පොළී ආදායම /SA | 3.4 | (21,664,344) | (20,542,055) |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 6.1 | 6,316,324 | 7,419,879 |
| කල්බදු වියදම් | 6.2 | 4,198,682 | 8,510,392 |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම්වල ශුද්ධ සාධාරණ අගය වෙනස්වීම | | 2,663,729,759 | (2,796,453,741) |
| වත්කම් භාවිතා කිරීම සඳහා ඇති අයිතියේ දළ ක්ෂයකිරීම | 6.1 | 34,075,707 | 32,570,517 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 6.1 | 5,879,234 | 8,439,092 |
| | | - | - |
| | | **14,236,316,535** | **5,780,658,969** |
| මෙහෙයුම් වත්කම්වල වෙනස අ | | 2,876,745,100 | (5,205,145,133) |
| මෙහෙයුම් වගකීම්වල වෙනස ආ | | 2,242,697,410 | 7,353,693,922 |
| මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | 19,355,759,045 | 7,929,207,758 |
| ගෙවන ලද පාරිතෝෂික | 21 | (1,857,058) | (919,583) |
| ගෙවන ලද ආදායම් බදු | | (3,147,262,129) | (981,187,501) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් | | 16,206,639,858 | 6,947,100,674 |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| මූල්‍ය ආයෝජනයන්ගේ ශුද්ධ අපහරණ / (අත්පත් කරගැනීම්) | | (13,722,779,470) | (4,606,374,292) |
| ආපදා ණය පොළී ආදායම /SA | | 21,664,344 | 20,542,055 |
| මෘදු ණය නැවත අය කරගැනීම | | 977,977 | 17,795 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | 8 | (17,730,556) | (3,339,395) |
| බදුකරුට භාවිතා කිරීමට අයිතිය ඇති කල්බදු වත්කම් අත්පත් කරගැනීම | 9 | (102,760,616) | (2,455,242) |
| ආයෝජන කටයුතුවලින් භාවිතා කල ශුද්ධ මුදල් | | (13,820,628,321) | (4,591,609,079) |
| **මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| කල්බදු පොළී ගෙවීම් | 6.2 | (4,198,682) | (8,510,392) |
| කල්බදු කුලී නිරවුල් කිරීම | | 46,622,407 | (35,158,366) |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල් | | (2,600,000,000) | (1,608,000,000) |
| මූල්‍ය කටයුතුවලින් භාවිතා කල ශුද්ධ මුදල් | | (2,557,576,274) | (1,651,668,758) |
| **මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** ඇ | | (171,564,737) | 703,822,837 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ | | 1,419,456,545 | 715,633,708 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ | | 1,247,891,808 | 1,419,456,545 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්**

| | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| **අ. මෙහෙයුම් වත්කම්වල වෙනස** | | | |
| විලම්භිත කොමිස් ගාස්තුවල (වැඩිවීම)/ අඩුවීම | | 20,860,366 | (62,101,700) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරිකවල (වැඩිවීම)/ අඩුවීම | | 1,566,239,647 | (2,016,134,008) |
| ලැබිය යුතු වාරිකවල (වැඩිවීම)/ අඩුවීම | | 1,191,270,841 | (1,804,985,344) |
| අනෙකුත් මූල්‍ය නොවන වත්කම්වල (වැඩිවීම)/ අඩුවීම | | 98,374,246 | (125,650,037) |
| ලැබිය යුතු අධිභාර බදුවල (වැඩිවීම)/ අඩුවීම | | - | (1,196,274,044) |
| | | 2,876,745,100 | (5,205,145,133) |
| **ආ. මෙහෙයුම් වගකීම්වල වෙනස** | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම්වල (වැඩිවීම)/ අඩුවීම | | 1,676,544,690 | 7,341,525,449 |
| අනෙකුත් වගකීම්වල (වැඩිවීම)/ අඩුවීම | 17 | 566,152,720 | 12,168,473 |
| | | 2,242,697,410 | 7,353,693,922 |
| **ඇ. මුදල් හා මුදල් හා සමාන දෑ හි වැඩිවීම / (අඩුවීම)** | | | |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ | | 1,124,294,784 | 993,558,383 |
| විනිමය අනුපාත වෙනස්වීම මත සිදු වූ මූල්‍ය බලපෑමේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | 123,597,023 | 425,898,162 |
| **වර්ෂය අවසානයේදී ශුද්ධ මුදල් හා මුදල් හා සමාන දෑ** | | **1,247,891,807** | **1,419,456,545** |
| අඩුකළා: වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ | | 993,558,383 | 677,343,717 |
| විනිමය අනුපාත වෙනස්වීම මත සිදු වූ මූල්‍ය බලපෑමේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | 425,898,162 | 38,289,990 |
| **වර්ෂය ආරම්භයේදී ශුද්ධ මුදල් හා මුදල් හා සමාන දෑ** | | **1,419,456,545** | **715,633,708** |
| මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (171,564,738) | 703,822,837 |

Page 04

## 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකිරීමේ ඒකකය

ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) 2007 අංක 28 දරන පනතින් සංශෝධිත 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මඟින් සංස්ථාපනය කර ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය අංක 95, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය මෙම ලිපිනයේ පිහිටුවා තිබේ.

### 1.2 මව් ආයතනය සහ මූලාරම්භක ආයතනය

මණ්ඩලයේ මව් ආස්ථිත්‍යය සහ මූලාරම්භක ආස්ථිත්‍යය ශ්‍රී ලංකා ආණ්ඩුවයි.

### 1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ජීවිත-නොවන (සාමාන්‍ය) රක්ෂණ කටයුතු සහ ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමයි.
තව ද, මණ්ඩලය මඟින් SRCC & T අරමුදල පවත්වාගෙන යන අතර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බැංකු, මූල්‍ය ආයතන සහ රක්ෂණ සමාගම්වලින් බදුවලින් පසු ලාභයෙන් 1%ක භෝග බද්දක් රැස්කර ගෙන බෝග බද්දෙන් කෘෂිකාර්මික රක්ෂණ යෝජනාක්‍රම පිරිනමනු ලබයි. සමාලෝචිත වර්ෂය ඇතුළත මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනස්කම් සිදු වී නොමැත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකිව යුතු වේ.

### 1.5 සේවකයන් සංඛ්‍යාව

2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාර්ය මණ්ඩල ශක්තිය 261 (2021-250) විය.

### 1.6 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන, 2025 ජනවාරි 08 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුව, 2025 ජනවාරි 08 දින අනුමත කර නිකුත් කිරීමට අවසර දෙන ලදී. මෙම නැවත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මුලින් 2025 ජනවාරි 09 දින ඉදිරිපත් කරන ලද අතර, අවසන් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2025 මාර්තු 28 දින නැවත ඉදිරිපත් කරන ලදී.

## 2. සකස් කිරීමේ පදනම සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන, වෙනත් යම් ආකාරයකින් ප්‍රකාශ කර ඇත්නම් මිස, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය (CA - ශ්‍රී ලංකා) මඟින් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ අනුකූළ වන පරිදි සහ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්ත නියාමනය කිරීමේ පනත හා අනුකූල වන පරිදි සකස් කර ඇත.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය - මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සපයයි. (59 වන පිටුව).
- විස්තීරණ ආදායම් ප්‍රකාශනය - සමාලෝචනයට ලක්වූ වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සපයයි. (58 වන පිටුව).
- හිමිකම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය - හිමිකම්වල සියලු වෙනස්කම් නිරූපණය කරයි. (60 වන පිටුව).

- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - මුදල් සහ මුදල් සමාන දෑ උත්පාදනය කිරීමට සහ එම මුදල් ප්‍රවාහයන් භාවිතා කිරීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳ තොරතුරු පරිශීලකයින්ට සපයයි. (04 වන පිටුව).
- මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු අඩංගු වේ. (05 සිට 59 දක්වා පිටු).

## 2.2 මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශයන්ගේ පහත දැක්වෙන භෞතික අයිතමයන් හැර ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශයනයන් සකසා ඇත.

## 2.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ සාපේක්ෂ ද්‍රවශීලතාවය පෙන්නුම් කරන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිළිවෙලින් පුළුල් ලෙස ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම් කරන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ඇති අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ශුද්ධ අගය වාර්තා කර ඇත්තේ හඳුනාගත් අගයන් හිලව් කිරීම සඳහා නෛතික වශයෙන් බලගැන්විය හැකි අයිතියක් පවතින සහ ශුද්ධ පදනම මත බේරුම් කිරීමට අපේක්ෂාවක් සහිත හෝ වත්කම මුදල් බවට පත්කර වගකීම බේරුම්කිරීම ඒ අවස්ථාවේදීම කිරීමට අපේක්ෂිත අවස්ථාවල දී පමණි.

## 2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. වෙනත් ආකාරයකින් සඳහන් කර ඇති අවස්ථාවල දී හැර, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල්වලට වටයා ඇත.

## 2.5 ප්‍රමාණාත්මකභාවය සහ එකතු කිරීම

සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍යමය පන්තිය වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. නොවැදගත් වන්නේ නම් මිස, සමාන නොවන ස්වභාවයේ හෝ ක්‍රියාවල අයිතම වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

## 2.6 වාර්තා කිරීමේ කාලසීමාව

වාර්තා කිරීමේ කාලසීමාව 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලසීමාව වේ.
අදාළ අවස්ථාවල දී, ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුව පැමිණෙන සටහන්වලින් පැහැදිලි කර ඇත.

## 2.7 වැදගත් ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්/ SLFRS හා අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී කළමනාකරකාරීත්වය ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමට සහ වාර්තාගත වත්කම්, වගකීම් අගයයන්වලට බලපෑම් කරන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය. ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන කටයුතු සිදු කරන අතරතුරෙහි දී සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට ප්‍රතිශෝධන හඳුනාගනු ලබන්නේ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාලසීමාවේ දී සහ බලපාන යම් ඉදිරි කාලසීමාවන්වල දීය.

අවිනිශ්චිතභාවයන් සම්බන්ධ වන සැලකිය යුතු මට්ටමේ මූලික ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන පහතින් විස්තර කර ඇත. එවැනි වත්කම් සහ වගකීම්වල ඉදිරියට යනු ලබන අගයයන් අදාළ සටහන්වල සටහන් කර ඇත.

### 2.7.1 අඛණ්ඩ පැවැත්ම

ක්‍රියාත්මකවීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් කළමනාකාරිත්වය මගින් සිදු කර ඇති ඉදිරි අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මකවීම සඳහා මණ්ඩලයට සම්පත් ඇති බවට තෘප්තිමත්ය. තව ද, අඛණ්ඩව ක්‍රියාත්මකවීම සඳහා මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳ සැලකිය යුතු මට්ටමේ සැකයක් පෙන්නුම් කළ හැකි යම් වැදගත් අවිනිශ්චිතතාවයන් පිළිබඳව කළමනාකාරිත්වයට දැනුවත්භාවයක් නොමැත. එහෙයින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩභාවය පදනම් කර ගෙන අඛණ්ඩවම සකස් කෙරේ.

### 2.7.2 මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ වටිනාකම් නිර්ණය කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති අතර එහි දී ගණිතමය තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම ඇතුළත් අගය නිර්ණය කිරීමේ තාක්ෂණික ක්‍රම ගණනාවක් භාවිතයෙන් නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිල ගණන් නිර්ණය කර නොමැත. මෙම ආදර්ශ වෙත ආදාළ හැකි අවස්ථාවල දී නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිල ගණන් නිර්ණය කර නොමැත. මෙම ආදර්ශ වෙත ආදාන හැකි අවස්ථාවල දී නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත වෙතින් පැන නගින නමුත් මෙය නොපවතී නම්, තීරණය ඔවුන්ගේ සාධාරණ වටිනාකම් ස්ථාපිත කළ යුතු වේ.

### 2.7.3 හානිකරණය පිළිබඳ තක්සේරු කිරීම

අවස්ථාවන්ගේ සිදුවීම් හෝ වෙනස්කම් එසේ කිරීමේ අවශ්‍යතාවය දක්වන්නේ නම්, සෑම වාර්තා කරන දිනයකම හෝ ඊට වැඩි වාර ගණනක්, වත්කමක් හෝ මුදල් උපයන ඒකකයක් සඳහා යම් හානියක දර්ශකයක් තිබේ ද යන්න මණ්ඩලය තක්සේරු කරනු ලැබේ. මේ සඳහා, එවැනි තනි වත්කමක හෝ මුදල් උපයන ඒකකයක 'භාවිත වටිනාකම් ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. භාවිත වටිනාකම තක්සේරු කිරීම සඳහා කළමනාකරණය විසින් වත්කමෙන් හෝ මුදල් උපයන ඒකකයෙන් තක්සේරු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කිරීම සහ අදාළ මුදල් ප්‍රවාහ ප්‍රවාහවල වටිනාකම ගණනය කිරීම සඳහා යෝග්‍ය අඩු කිරීමේ ප්‍රතිශතයක් තෝරා ගැනීමට සිදු කළ යුතු වේ. මෙම ඇගයීමෙන් අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහ සහ අඩු කිරීමේ ප්‍රතිශතය පිළිබඳව මණ්ඩලය විසින් ඇස්තමේන්තුවක් සිදු කිරීම අවශ්‍ය වේ. එබැවින්, ඒවා අවිනිශ්චිතතාවයට භාජනය වේ.

### 2.7.4 වගකීම් සහ අවිනිශ්චිත තත්ත්වයන් සඳහා ප්‍රතිපාදන

මණ්ඩලයට අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් (නීතිමය හෝ ගොඩනැගීමේ) ඇති විට, ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලා ඒමක් බැඳීම පියවීමට අවශ්‍ය වීමට ඉඩ ඇති විට, සහ බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි විට සාමාන්‍ය ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. මණ්ඩලය ප්‍රතිපාදනයක සියල්ල හෝ කොටසක් ප්‍රතිපූරණය වනු ඇතැයි අපේක්ෂා කරන්නේ නම්, ප්‍රතිපූරණය සංයුක්තව ස්ථිර වන විට පමණක් එය වෙනම වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඕනෑම ප්‍රතිපාදනයකට අදාළ වියදම, ඕනෑම ප්‍රතිපූරණයකින් ශුද්ධව, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ.

මුදලේ කාල වටිනාකමේ බලපෑම සැලකිය යුතු නම්, ප්‍රතිපාදන වට්ටම් කරනු ලබන්නේ, සුදුසු පරිදි, වගකීමට විශේෂිත අවදානම් පිළිබිඹු කරන වත්මන් බදු-පෙර අනුපාතයක් භාවිතා කරමිනි. වට්ටම් කිරීම භාවිතා කරන විට, කාලය ගතවීම නිසා ප්‍රතිපාදනයේ වැඩිවීම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගනු ලැබේ.

මණ්ඩලයේ මතය අනුව, වර්තමානයේ ආයතනයට එරෙහිව පවතින නඩු කටයුතු, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, වාර්තාගත මූල්‍ය ප්‍රතිඵල හෝ මණ්ඩලයේ අනාගත මෙහෙයුම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරනු ඇත.

මණ්ඩලයට සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී නීතිමය හිමිකම් ලැබේ. ඕනෑම හිමිකම් පෑමක් සාර්ථක වීමේ සම්භාවිතාව සහ ප්‍රතිපාදන සකස් කිරීම පිළිබඳව කළමනාකාරිත්වය විසින් තීන්දු කර ඇත. නීතිමය හිමිකම් පෑමක් අවසන් වන කාලය අවිනිශ්චිත වන අතර, ආර්ථික ප්‍රතිලාභවල විය හැකි පිටතට ගලා ඒමේ ප්‍රමාණයද එසේමය.

කාලය හා පිරිවැය අවසාන වශයෙන් අදාළ නීතිමය අධිකරණ බල ප්‍රදේශවල නිසි ක්‍රියාවලිය මත රඳා පවතී. සමාලෝචනයට ලක්වූ වර්ෂය තුළ, මණ්ඩලය නඩු ප්‍රතිපාදනය සඳහා රුපියල් 216,194,262 ක් වූ මුළු නීතිමය හිමිකම්වලින් 15% ක්, නඩු 244 ක් සඳහා ප්‍රතිපාදන සැපයීමට තීරණය කළේය.

## 2.8 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 2.8.1 විදේශ මුදල් පරිවර්තනය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. විදේශ මුදල්වලින් සිදු කරනු ලබන ගණුදෙණු කිරීම් එම ගණුදෙණු කිරීම සිදු කරන දිනයේ දී පැවති ක්‍රියාකාරී මුදල් අනුපාතය මත මූලිකව වාර්තා කර ඇත.

විදේශ මුදල්වලින් නම් කර ඇති මූල්‍යමය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේදී පැවති හුවමාරු මුදල් අනුපාතය මත නැවත පරිවර්තනය කර ඇත. සියළුම වෙනස්කම් ලාභ හෝ පාඩු ප්‍රකාශයට සැලකිල්ලට ගෙන ඇත.

### 2.8.2 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

මණ්ඩලය විසින් වාර්තා කරන සෑම දිනකම වත්කමක් අගය අඩු වීමක් ඇති විය හැකි බවට ඇඟවීමක් තිබේද යන්න තක්සේරු කරයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික දුර්වලතා පරීක්ෂණයක් අවශ්‍ය වූ විට, මණ්ඩලය වත්කම් ආපසු ලබාගත හැකි මුදල ඇස්තමේන්තු කරයි. වත්කමක අයකරගත හැකි මුදල වත්කමක හෝ මුදල් උත්පාදන ඒකක (CGU) සාධාරණ වටිනාකමින් විකිණීමට අඩු වියදම් සහ භාවිතයේ ඇති වටිනාකමට වඩා ඉහළ අගයකි. වත්කම් වෙනත් වත්කම්වලින් හෝ වත්කම් කාණ්ඩවලින් බොහෝ දුරට ස්වාධීන වන මුදල් ගලා ඒම උත්පාදනය නොකරන්නේ නම් මිස, අයකරගත හැකි මුදල තනි වත්කමක් සඳහා තීරණය කරනු ලැබේ. වත්කමක හෝ CGU රැගෙන යා හැකි ප්‍රමාණය එහි ආපසු ලබාගත හැකි ප්‍රමාණය ඉක්මවන විට, වත්කම දුර්වල ලෙස සලකනු ලබන අතර එහි ආපසු ලබාගත හැකි මුදලට ලියා ඇත. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කරනු ලැබේ. ඔවුන්ගේ වර්තමාන වටිනාකමට පෙර බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපොළ තක්සේරු කිරීම් පිළිබිඹු කරයි. සාධාරණ වටිනාකමක් තීරණය කිරීමේ දී, පවතින්නේ නම්, විකිණීම සඳහා අඩු වියදම් මෑත වෙළඳපොළ ගනුදෙනු සැලකිල්ලට ගනී. එවැනි ගනුදෙනු හඳුනාගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ.

අඛණ්ඩ මෙහෙයුම්වල අලාභහානි අලාභ හානි වූ වත්කම්වල ක්‍රියාකාරිත්වයට අනුරූප වන එම වියදම් කාණ්ඩවල ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

### 2.8.3 මූල්‍ය වත්කම් අගය අඩු වීම (Impairment)

මූල්‍යමය වත්කමක හෝ මූල්‍යමය වත්කම් සමූහයක අගය අඩු වී ඇත්දැයි, වාර්තා කරන සෑම දිනකදීම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. ලාභ හෝ පාඩු අඩු වීම තුලින්, සාධාරණ අගයට මූල්‍යමය වත්කමක හෝ මූල්‍යමය වත්කම් සමූහයක සාධාරණ අගයට පවත්වාගෙන නොයන බවට විෂය මූලික සාක්ෂි තිබේ ද යන්න සෑම වාර්තා කරන දිනකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි.

වත්කමක මූලික හඳුනාගැනීමෙන් පසු එක් සිදු වීමක් හෝ සිදුවීම් කිහිපයක් සිදු වීමේ ('අලාභ සිදුවීමක්') සහ විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත අලාභ සිදු වීමක (හෝ සිදුවීම්) වල බලපෑමක් පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස, විෂය මූලික සාක්ෂි සහිත හානිකරණයක් තිබේ නම්, සහ තිබේ නම් පමණක්, මූල්‍යමය වත්කමක් හෝ මූල්‍යමය වත්කම් සමූහයක් හානි වී ඇති බවට සලකනු ලැබේ.

- **ක්‍රමක්ෂය පිරිවැය යටතේ ගැනෙන මූල්‍යමය වත්කම් හානිකරණය**

  ක්‍රමක්ෂය පිරිවැය හේතුවෙන් මූල්‍යමය වත්කම් වලට හානිකරණ අලාභයක් සිදු වන බව විෂය මූලික සාක්ෂි තිබේ නම්, වත්කමේ ධාරණ මුදල සහ මූල්‍යමය වත්කමේ මුල් සඵල පොලී අනුපාතිකය අඩු

කරන ලද ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි වර්තමාන අගය (සිදුවිය හැකි අනාගත ණය පාඩු හැර) අතර වෙනස ලෙස හානිකරණ අලාභය මනිනු ලැබේ. වත්කමේ ධාරණ මුදල අඩු කර, අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලැබේ.

එක් එක් වශයෙන් වැදගත් වන සහ එක් එක් මූල්‍ය වත්කම් සඳහා සහ එක් එක් වශයෙන් වැදගත් නොවන එක් එක් හෝ සාමූහික වත්කම් සඳහා හානිකරණයක් පවතින බවට විෂය මූලික සාක්ෂි තිබේ ද යන්න පළමුව අධ්‍යක්ෂ මණ්ඩලයට මඟින් තක්සේරු කරනු ලබයි. එක් එක් වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳව විෂය මූලික සාක්ෂි නොමැති බවට හඳුනාගෙන ඇත්නම්, වැදගත් වුව ද නොවූව ද, සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයකට සහ හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සමූහයකට වත්කම ඇතුළත් කරනු ලැබේ. හානිකරණ සම්බන්ධයෙන් එක් එක් වශයෙන් තක්සේරු කරන ලද සහ හානිකරණ අලාභ සිදු වන බවට හෝ සිදුවෙමින් පවතින බවට හඳුනාගෙන ඇති වත්කම්, හානිකරණය පිළිබඳව සාමූහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ. වාර්තා කරනු ලබන සෑම දිනකම හානිකරණ තක්සේරුව සිදු කරනු ලබයි.

පසු කාලයක දී හානිකරණ අලාභය අඩු වන්නේ නම්, එම අඩුවීම හානිකරණය හඳුනා ගැනීමෙන් පසු සිදු වන සිද්ධියකට විෂය මූලිකව සම්බන්ධ කළ හැකි වන්නේ නම්, කලින් හඳුනාගත් හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු ලැබේ. ප්‍රතිවර්තනය සිදු කරන දිනයට, වත්කමේ ධාරණ වටිනාකම එහි ක්‍රමක්ෂය පිරිවැය ඉක්ම නොවන සීමාව දක්වා, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි, හානිකරණ අලාභයක ඕනෑම පසු ප්‍රතිවර්තනය කිරීමක් හඳුනා ගනු ලැබේ.

- **විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජනයන් හානිකරණය**

  විකිණීම සඳහා වන වත්කමක් හානිකරණය වේ නම්, එහි පිරිවැය (යම් මූලික නැවත ගෙවීමක හෝ ක්‍රමක්ෂය කිරීමක ශුද්ධ අගය) සහ වෙනත් විස්තීර්ණ ආදායමකින් පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද යම් හානිකරණ අලාභයක් අඩු කරන ලද එහි වර්තමාන සාධාරණ අගය අතර වෙනසෙහි වටිනාකම, හිමිකමේ සිට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි, විකිණීම සඳහා වන ලෙස වර්ගීකරණය කරන ලද හිමිකම් උපකරණ සම්බන්ධයෙන් ප්‍රතිවර්තනයන් හඳුනාගනු නොලැබේ.

  විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභයන් හඳුනාගැනීමෙන් පසු සිදු වන සිදුවීමක් හා විෂය මූලිකව සම්බන්ධ විය හැකි උපකරණයන් ගේ සාධාරණ අගය වැඩි වේ නම්, විකිණීම සඳහා වන ලෙස වර්ගීකරණය කර ඇති ණය උපකරණ සම්බන්ධ හානිකරණ අලාභයන්ගේ ප්‍රතිවර්තනයන්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුලින් ප්‍රතිවර්තනය කරනු ලැබේ.

- **පිරිවැය යටතේ ගැනෙන මූල්‍ය වත්කම් හානිකරණය**

  සිය සාධාරණ වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය නොහැකි නිසා සාධාරණ වටිනාකමකින් ගෙන නොයන ලැයිස්තුගත නොකළ කොටස් උපකරණයක හෝ එවැනි ලැයිස්තුගත නොකළ කොටස් උපකරණයක් භාරදීමෙන් පියවිය යුතු ව්‍යුත්පන්න වත්කමක වටිනාකම් හානි පාඩුවක් සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේ නම්, වටිනාකම් හානි පාඩුවේ ප්‍රමාණය මනිනු ලබන්නේ මූල්‍ය වත්කමේ ගෙන යන ප්‍රමාණය සහ සමාන මූල්‍ය වත්කමක් සඳහා වත්මන් වෙළඳපල ප්‍රතිලාභ අනුපාතය අනුව වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස ලෙසය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහනට අනුව, මණ්ඩලය විසින් 2022.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා රුපියල් 138,603,776 ක වටිනාකම් හානි ප්‍රතිපාදනයක් සපයා ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය විසින් 2023 ජූලි මාසයේදී දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ විනිමය සංදේශයක් නිකුත් කරන ලදී. මෙය දේශීය ණය ප්‍රශස්තකරණය යටතේ ශ්‍රී ලංකාවේ සංවර්ධන බැඳුම්කර (SLDB) ශ්‍රී ලංකාවේ නව ඇමරිකානු ඩොලර් හෝ ශ්‍රී ලංකා රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා හුවමාරු කර ගැනීම සඳහා නිකුත් කරන ලදී. මෙම ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද විකල්ප තුන තක්සේරු කිරීමෙන් පසු, සහ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ඉතිරි SLDB 2023 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. ඒ

අනුව, වටිනාකම් හානිකරණ ප්‍රතිපාදනය ආපසු හරවන ලද අතර, 2023 දෙසැම්බර් 31 වාර්තාකරණ දිනය වන විට SLDB ආයෝජන පිළිබිඹු නොවේ.

**2.8.4. අහඹු වගකීමක්**

අහඹු වගකීමක් යනු,

අ) අතීත සිදුවීම් වලින් පැන නගින සහ එහි පැවැත්ම සම්පූර්ණයෙන්ම ආයතනයේ පාලනයට යටත් නොවන එකක් හෝ වැඩි ගණනක් අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීමෙන් හෝ සිදු නොවීමෙන් පමණක් තහවුරු වන විය හැකි බැඳීමක්: හෝ

ආ) අතීත සිදුවීම් වලින් පැන නගින නමුත් හඳුනා නොගන්නා වත්මන් බැඳීමක් වන්නේ,

i) ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලා ඒමක් බැඳීම පියවීමට අවශ්‍ය වීමට ඉඩක් නොමැති නිසා හෝ

ii) බැඳීමේ ප්‍රමාණය ප්‍රමාණවත් විශ්වාසනීයත්වයකින් මැනිය නොහැකි නිසාය.

**2.8.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ සැකසීමේ වක්‍ර නොවන ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත. ලද පොලී ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කර ඇත. මුදල් සහ මුදල් හා සමාන දෑ වලට, මුදල් වල දන්නා ප්‍රමාණ වලට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීම් වීමේ සුළු අවදානමකට ලක් විය හැකි හැකියාව සහිත කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලී ආයෝජනයන් ඇතුලත් වේ. මුදල් සහ මුදල් හා සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකු වල ඇති ශේෂය ද ඇතුලත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යන් සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ, බැංකු අයිරා වල ශුද්ධ අගයක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

**2.8.6 මෙතෙක් යොදාගෙන නොමැති නව ප්‍රමිතීන් සහ අර්ථකථනයන්**

පහත සඳහන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති අනාගතයේ ක්‍රියාත්මක වන දිනයක් ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර නොමැත. එම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මණ්ඩලය විසින් දැනට අනුගමනය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති කෙරෙහි බලපෑමක් ඇති කරන අතර අනාගත මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය.

- මෙම ප්‍රමිතිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ලමූල්‍ය උපකරණ - හඳුනාගැනීම සහ මිනුම්ල හි පවතින මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 හි මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මිනුම් පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ, මූල්‍ය වත්කම්වල වටිනාකම් හානි ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය පාඩු ආකෘතියක් සහ නව සාමාන්‍ය හෙජ් (Hedge) ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ.

  ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09, 2018 ජනවාරි 01 හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද සඳහා බලපැවැත්වෙන අතර, කලින් අනුගමනය කිරීමට අවසර ඇත. මණ්ඩලය (NITF) ප්‍රධාන වශයෙන් පදනම් වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 04 "රක්ෂණ කොන්ත්‍රාත්තු" සඳහා යෝජිත සංශෝධන මත වන අතර, රක්ෂණ කොන්ත්‍රාත්තු නිකුත් කිරීම ප්‍රධාන ක්‍රියාකාරකම වන ආයතනවලට, 2022 දී ආරම්භ වූ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 04 අනුගමනය කරන තෙක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09 හි පූර්ණ යෙදීම කල් දැමීමට අවසර ඇත. IFRS 17 - රක්ෂණ කොන්ත්‍රාත්තු බලපැවැත්වෙන දිනය 2026 ජනවාරි 01 දක්වා කල් දැමීම හේතුවෙන්, තාවකාලික නිදහස් කිරීම 2026 ජනවාරි දක්වා කල් තැබෙනු ඇතැයි මණ්ඩලය අපේක්ෂා කරයි.

  රක්ෂණකරුවෙකුට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 09 (SLFRS 09) වෙතින් තාවකාලික නිදහස් කිරීමක් යෙදිය හැක්කේ පහත කොන්දේසි සපුරා ඇත්නම් පමණි:

අ. ලාභ හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම ලෙස නම් කරන ලද මූල්‍ය වගකීම් මත ලැබෙන ලාභ හා අලාභ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතා හැර, වෙනත් කිසිදු ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 09 සංස්කරණයක් කලින් යොදාගෙන නොමැති නම්.

ආ. එහි ක්‍රියාකාරකම් 2016 අප්‍රේල් 01 දිනට වහාම පෙර වාර්ෂික වාර්තාකරණ දිනයේදී හෝ පසුව එළඹෙන වාර්ෂික වාර්තාකරණ දිනයකදී ප්‍රධාන වශයෙන් රක්ෂණයට සම්බන්ධ වී තිබේ නම්.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 04 - රක්ෂණ කොන්ත්‍රාත්තු හි සංශෝධනවලට අනුව, රක්ෂණකරුවෙකුගේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණයට සම්බන්ධ වන්නේ පහත කොන්දේසි සපුරා ඇත්නම් පමණි.

අ. මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය හි විෂය පථය තුළ ඇති කොන්ත්‍රාත්තු වලින් පැන නගින එහි වගකීම්වල ගෙන යන ප්‍රමාණය, (රක්ෂණ කොන්ත්‍රාත්තු වලින් වෙන් කරන ලද ඕනෑම තැන්පතු සංරචක හෝ කාවැදුණු ව්‍යුත්පන්නයන් ඇතුළුව) එහි සියලුම වගකීම්වල මුළු ගෙන යන ප්‍රමාණයට සාපේක්ෂව සැලකිය යුතු නම් සහ

ආ. රක්ෂණයට සම්බන්ධ එහි වගකීම්වල මුළු ගෙන යන ප්‍රමාණය, එහි සියලුම වගකීම්වල මුළු ගෙන යන ප්‍රමාණයට සාපේක්ෂව පහත ප්‍රතිශතයක් නම්,

i. 90% ට වඩා වැඩි නම්, හෝ

ii. 90% ට වඩා අඩු හෝ සමාන නමුත් 80% ට වඩා වැඩි නම්, සහ රක්ෂණකරු රක්ෂණයට සම්බන්ධ නොවන සැලකිය යුතු ක්‍රියාකාරකම්වල නිරත නොවේ නම්.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 09 වෙතින් වන තාවකාලික නිදහස් කිරීම, එම දිනයෙන් අවසන් වූ වාර්ෂික කාල පරිච්ඡේදය තුළ ආයතනයේ ක්‍රියාකාරකම්වල වෙනසක් සිදුවී ඇත්නම් පමණක්, පසුව එළඹෙන වාර්ෂික වාර්තාකරණ දිනයකදී එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණයට සම්බන්ධ වේදැයි නැවත තක්සේරු කරනු ලැබේ.

මණ්ඩලය සිය ආයෝජන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 09 යටතේ නිසි ලෙස වර්ගීකරණය කිරීම පිළිබඳව සංශෝධිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 04 අනුගමනය කිරීමට ආසන්න කාලයේදී තීරණය කරනු ඇත. එබැවින්, වාර්තාකරණ දිනය වන විට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 09 අනුගමනය කිරීමේ සම්පූර්ණ බලපෑම එහි මූල්‍ය ප්‍රකාශන මත ප්‍රමාණාත්මකව තක්සේරු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත්, එය මණ්ඩලයේ මුළු හිමිකම් සැලකිය යුතු ලෙස වෙනස් නොවිය හැකි බව අපේක්ෂා කෙරේ.

ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (SLFRS - 17) රක්ෂණ කොන්ත්‍රාත්තු
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 17 යනු රක්ෂණ කොන්ත්‍රාත්තු සඳහා වන පුළුල් නව ගිණුම්කරණ ප්‍රමිතියකි, එය හඳුනාගැනීම සහ මිනුම්කරණය, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම ආවරණය කරයි. ක්‍රියාත්මක වූ පසු, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 17, 2005 දී නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 04 රක්ෂණ කොන්ත්‍රාත්තු ප්‍රතිස්ථාපනය කරනු ඇත. මෙම ප්‍රමිතිය මුලින් 2023 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වීමට නියමිතව තිබුණද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් IFRS 17 හි බලපැවැත්වෙන දිනය 2026 ජනවාරි 1 හෝ ඊට පසු කාල පරිච්ඡේදයක් දක්වා කල් දැමීමට තීරණය කර ඇත.

## 3 මෙහෙයුම් අංශ

මෙහෙයුම් අංශයක් යනු ආයතනයක කොටසකි.

අ) එය ආදායම් උපයා ගැනීමට සහ වියදම් දැරීමට (එම ආයතනයේම අනෙකුත් කොටස් සමග ඇති ගනුදෙනු හා සම්බන්ධ ආදායම් සහ වියදම් ඇතුළුව) ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල නිරත වේ.

ආ) එහි මෙහෙයුම් ප්‍රතිඵල, අංශයට වෙන් කළ යුතු සම්පත් පිළිබඳ තීරණ ගැනීමට සහ එහි කාර්ය සාධනය තක්සේරු කිරීමට ආයතනයේ තීරණ ගන්නන් විසින් නිතිපතා සමාලෝචනය කරනු ලැබේ. සහ

ඇ) ඒ සඳහා වෙනම මූල්‍ය තොරතුරු ලබා ගත හැකිය.
කළමනාකරණ අරමුණු සඳහා, මණ්ඩලය ප්‍රධාන ව්‍යාපාරය නිෂ්පාදන හා සේවාවන් මත පදනම්ව

ව්‍යාපාරික අංශ හතකට සංවිධානය කර ඇති අතර, වාර්තා කළ හැකි අංශ හතක් ඇත. පහත වාර්තා කර ඇති අංශ තොරතුරු, සම්පත් වෙන් කිරීම සහ කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා තීරණ ගන්නන් විසින් භාවිතා කරනු ලැබේ.

- **සාමාන්‍ය - මෝටර් රථ රක්ෂණ**

  ශ්‍රී ලංකා රජයේ මූලික අවශ්‍යතාවක් වන්නේ, පොදු මහාමාර්ගවල භාවිතා කරන සියලුම වර්ගයේ මෝටර් වාහන සඳහා අවම වශයෙන් තෙවන පාර්ශවීය රක්ෂණ ආවරණයක් තිබිය යුතු බවයි. විස්තීරණ රක්ෂණ ආවරණයක් හරහා, මගීන්, වාහන, ගොඩනැගිලි ආදිය ආවරණය වන පරිදි ප්‍රතිලාභ පුළුල් කළ හැකිය. එබැවින්, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ (NITF) මෝටර් රථ රක්ෂණය, 2009 අගෝස්තු 20 දින අංක 1615/20 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, වාහන හිමිකරුට සහ තෙවන පාර්ශවයන්ට හොඳම සේවාව සපයමින් විස්තීරණ මෝටර් රක්ෂණයක් හඳුන්වා දී ඇත.

- **සාමාන්‍ය - මෝටර් නොවන රක්ෂණ**

  2009 අගෝස්තු 20 දින අංක 1615/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් හඳුන්වා දුන් පරිදි, සියලුම අවශ්‍ය ප්‍රතිලාභ සහිතව, සියලුම රාජ්‍ය ආයතන සඳහා අනිවාර්ය වන සාමාන්‍ය රක්ෂණ ආවරණය.

  - සාමාන්‍ය - මෝටර් රථ රක්ෂණය
  - සාමාන්‍ය - මෝටර් රථ නොවන රක්ෂණය
  - අග්‍රහාර
  - NNDIS
  - ප්‍රතිරක්ෂණය
  - SRCC & T
  - බෝග

- **අග්‍රහාර**

  අග්‍රහාර රක්ෂණ ක්‍රමය මහජන පරිපාලන අමාත්‍යාංශයේ 5/1997 දරණ චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද අතර, මෙම ක්‍රමය 2006 ජනවාරි 01 දින සිට ජාතික රක්ෂණ භාර අරමුදල යටතට පත් විය. මුල් අවධියේදී අපට ශ්‍රී ලංකා රක්ෂණයෙන් විශාල හිමිකම් සංඛ්‍යාවක් ලැබුණු අතර, මේ වන විට අපි එම හිඟ මුදල් නිරවුල් කර සුමටව පවත්වාගෙන යමු. 'අග්‍රහාර' වෛද්‍ය රක්ෂණ ක්‍රමයේ ප්‍රධාන අරමුණ වන්නේ රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සහ ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වය උසස් කිරීමයි. එබැවින්, අප වෙත ලැබෙන සියලුම හිමිකම් හැකි ඉක්මනින් කඩිනම් කිරීමට අපි පියවර ගෙන ඇත. අවශ්‍ය සියලුම අවශ්‍යතා සහිතව කිසියම් හිමිකම් පෑමක් ලැබුණහොත්, එම හිමිකම් ක්ෂණිකව ගෙවීමට කටයුතු සලස්වා ඇත.

- **ජාතික ස්වභාවික ආපදා රක්ෂණ ක්‍රමය (NNDIS)**

  ජාතික ස්වභාවික ආපදා රක්ෂණ ක්‍රමය 2020/03/31 දින සිට අත්හිටුවන ලදී.

- **ප්‍රතිරක්ෂණ**

  2012 දෙසැම්බර් 31 දින අංක 1791/4 දරණ රජයේ ගැසට් නිවේදනයට අනුව, සියලුම ප්‍රාථමික රක්ෂණකරුවන්, සෑම සාමාන්‍ය රක්ෂණ කොන්ත්‍රාත්තුවකින්ම පැන නගින ඔවුන්ගේ මුළු ප්‍රතිරක්ෂණ වාරිකයෙන් 30% ක් NITF වෙත භාර දිය යුතුය.

  වෛකල්පිත (facultative) ප්‍රතිරක්ෂණය සාමාන්‍යයෙන් විශාල, අසාමාන්‍ය හෝ ව්‍යසනකාරී අවදානම් සඳහා මිලදී ගනු ලැබේ. එබැවින්, ප්‍රතිරක්ෂණකරුවන්ට තනි අවදානම් ප්‍රවේශමෙන් භාර ගැනීමට අවශ්‍ය සම්පත් තිබිය යුතුය.

- **වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාදය (SRCC&T)**

  වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාදය අරමුදල 1987 නොවැම්බර් 18 දින කැබිනට් තීරණයකින් ලත්‍රස්තවාදී ක්‍රියා, කැරලි සහ වර්ජන නිසා සිදුවන පාඩු හේතුවෙන් රක්ෂණ හිමිකම්ල යන මාතෘකාව යටතේ 1988 දී ස්ථාපිත කරන ලදී. වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාදය අරමුදල යටතට එන කාර්යයන්, 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් (NITF) පනතේ 18(C) වගන්තිය අනුව ජාතික රක්ෂණ භාර අරමුදලට අවශෝෂණය කර ඇත.

2008 මාර්තු 25 දින නිකුත් කරන ලද අංක 1542/11 දරණ අති විශේෂ ගැසට් පත්‍රය, රට තුළ වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාදී තත්වයන් සමග කටයුතු කරන ආකාරය නියම කර ඇත. ඉහත අති විශේෂ ගැසට් පත්‍රයට අනුව, වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාදය සම්බන්ධයෙන් රක්ෂණ වාරික ලෙස ලැබෙන සියලුම මුදල් රක්ෂණ කර්මාන්තයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම සඳහා සහ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් විසින් නිකුත් කරන සියලුම රක්ෂණ ආවරණ NITF වෙතින් ලබා ගත යුතුය.

- **බෝග**

බෝග රක්ෂණ බද්ද, 1988 අංක 30 දරණ බැංකු පනත, 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතට එන සෑම ආයතනයක් විසින්ම ගෙවිය යුතුය. හෝ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනතට අනුව, ඉහත පනත් යටතේ ලියාපදිංචි වී ඇති සෑම බැංකුවක්, මූල්‍ය සමාගමක් හෝ රක්ෂණ සමාගමක්, 2013 අංක 12 දරණ මුදල් පනතේ 14 වන වගන්තියට අනුව ජාතික රක්ෂණ භාර අරමුදලට බෝග රක්ෂණ බදු ගෙවීමට බැඳී සිටී.

තක්සේරු වර්ෂයක් සඳහා (යම් වසරක අප්‍රේල් මස පළමු වන දින ආරම්භ වී ඊට වහාම පසු වර්ෂයේ මාර්තු මස තිස්එක් වන දිනෙන් අවසන් වන මාස දොළහක කාලයක්) බදු පසු ලාභයෙන් සියයට එකක් (1%) පදනම ලෙස සැලකිය යුතුය.

## 4 ආදායම

## 5 දළ ලිඛිත වාරිකය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 4 - රක්ෂණ කොන්ත්‍රාත්තු මගින් රක්ෂණකරුවෙකු විසින් ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්තු, පවරන ලද රක්ෂණ අවදානම් මට්ටම අනුව "රක්ෂණ කොන්ත්‍රාත්තු" හෝ "ආයෝජන කොන්ත්‍රාත්තු" ලෙස වර්ගීකරණය කිරීම අවශ්‍ය වේ.

රක්ෂණ කොන්ත්‍රාත්තු යනු, මණ්ඩලය (රක්ෂණකරු) වෙනත් පාර්ශවයකින් (ප්‍රතිපත්තිලාභීන්) සැලකිය යුතු රක්ෂණ අවදානමක් භාරගෙන ඇති අතර, යම් නිශ්චිත අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂණ සිදුවීම) ප්‍රතිපත්තිලාභීන්ට අහිතකර ලෙස බලපාන්නේ නම්, ඔවුන්ට වන්දි ගෙවීමට එකග වන කොන්ත්‍රාත්තු වේ. සාමාන්‍ය මාර්ගෝපදේශයක් ලෙස, රක්ෂණ සිදුවීම සිදු නොවූයේ නම්, ගෙවන ලද ප්‍රතිලාභ, ගෙවිය යුතු ප්‍රතිලාභ සමග සංසන්දනය කිරීමෙන් මණ්ඩලය සැලකිය යුතු රක්ෂණ අවදානමක් තිබේද යන්න තීරණය කරයි. රක්ෂණ කොන්ත්‍රාත්තු මත මූල්‍ය අවදානම් ද මාරු කළ හැකිය.

ආයෝජන කොන්ත්‍රාත්තු යනු සැලකිය යුතු මූල්‍ය අවදානමක් මාරු කරන සහ සැලකිය යුතු රක්ෂණ අවදානමක් නොමැති කොන්ත්‍රාත්තු වේ. මූල්‍ය අවදානම යනු, නිශ්චිත පොලී අනුපාතයක්, මූල්‍ය උපකරණ මිලක්, භාණ්ඩ මිලක්, විදේශ විනිමය අනුපාතයක්, මිල හෝ අනුපාත දර්ශකයක්, ණය ශ්‍රේණිගත කිරීමක් හෝ ණය දර්ශකයක් හෝ වෙනත් විචල්‍යයන් එකක් හෝ කිහිපයක් අනාගතයේදී වෙනස් වීමේ අවදානමයි. මෙහිදී, මූල්‍ය නොවන විචල්‍යයකදී, එම විචල්‍යය කොන්ත්‍රාත්තුවේ පාර්ශවයකට විශේෂිත නොවන බව සපයා ඇත.

කොන්ත්‍රාත්තුවක් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් ලෙස වර්ගීකරණය කළ පසු, එම කාලය තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු ලෙස අඩු වුවද, සියලු අයිතිවාසිකම් සහ බැඳීම් අවසන් වන හෝ කල් ඉකුත් වන තෙක් එහි ජීවිත කාලය පුරාම එය රක්ෂණ කොන්ත්‍රාත්තුවක් ලෙස පවතී. කෙසේ වෙතත්, රක්ෂණ අවදානම සැලකිය යුතු වුවහොත්, ආයෝජන කොන්ත්‍රාත්තු ආරම්භයෙන් පසුව රක්ෂණ කොන්ත්‍රාත්තු ලෙස නැවත වර්ගීකරණය කළ හැකිය.

මණ්ඩලය විසින් අලෙවි කරනු ලබන සියලුම නිෂ්පාදන රක්ෂණ කොන්ත්‍රාත්තු වන අතර, එබැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 4 - රක්ෂණ කොන්ත්‍රාත්තු යටතේ රක්ෂණ කොන්ත්‍රාත්තු ලෙස වර්ගීකරණය කර ඇත. මේ අනුව, වාර්තාකරණ දිනය වන විට මණ්ඩලයේ නිෂ්පාදන කළඹ තුළ කිසිදු ආයෝජන කොන්ත්‍රාත්තුවක් නොමැත.

දළ ලිඛිත වාරිකය (GWP) මගින්, අවදානම් භාර ගැනීම සඳහා මණ්ඩලය විසින් අය කරනු ලබන වාරිකය නිරූපණය කරයි. GWP උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.

නොවන - ජීවිත රක්ෂණ GWP සමන්විත වන්නේ ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ඇතුළත් වූ කොන්ත්‍රාත්තු මගින් සපයන ලද සමස්ත ආවරණ කාලය සඳහා ලැබුණු / ලැබිය යුතු මුළු වාරිකවලින් වන අතර, ඒවා ප්‍රතිපත්තිය ආරම්භ වන දිනයේදී හඳුනා ගනු ලැබේ. කෙසේ වෙතත්, අග්‍රහාර සහ බෝග රක්ෂණ බද්දේ GWP මුදල් පදනම මත සලකනු ලැබේ. වාරික අනුපාතයේ කොටසක් වන වට්ටම් (උදා: හිමිකම් නොමැති වට්ටම්) GWP වෙතින් අඩු කරනු ලැබේ.

ප්‍රතිරක්ෂණ දළ වාරිකවලට, අභ්‍යන්තර වෛකල්පිත (facultative) ව්‍යාපාර, අභ්‍යන්තර සමානුපාතික ගිවිසුම් (proportional treaty) සහ අභ්‍යන්තර අසමානුපාතික ගිවිසුම් (non)proportional treaty) ප්‍රතිරක්ෂණවලට අදාළ වාරික ආදායම් ඇතුළත් වේ. සමානුපාතික ගිවිසුම් ගිණුම් ප්‍රකාශයන් සෑම කාර්තුවක් අවසන් වීමෙන් පසු මණ්ඩලයට ඉදිරිපත් කරන බැවින්, අදාළ වසරේ සිව්වන කාර්තුව සඳහා සමානුපාතික ගිවිසුම්වල දළ ලේඛනගත වාරික (GWP)ඊළග වසරේදී වාර්තා කෙරේ. ඒ අනුව, සමානුපාතික ගිවිසුම්වල GWP යනු පෙර වසරේ සිව්වන කාර්තුවේ සහ වාර්තාකරණ වසරේ පළමු කාර්තුවේ සිට තෙවන කාර්තුව දක්වා වූ GWP වේ.

අභ්‍යන්තර වෛකල්පිත (facultative) ප්‍රතිරක්ෂණ වාරික අදාළ මූල්‍ය කාලය තුළ භාරගත් වෛකල්පිත (facultative) අවදානම් සම්බන්ධයෙන් මූල්‍ය වසර තුළදී හඳුනාගනු ලබන අතර, අභ්‍යන්තර සමානුපාතික ගිවිසුම් පුනරක්ෂණ වාරික, වාරික වශයෙන් පවරන්නා වෙතින් (cedants) ලැබෙන දැනුම්දීම් මත හඳුනාග නු ලැබේ. නිශ්චිත ගිවිසුම් කාලයක් තුළ සිදුවන පාඩු ආවරණය කරන අසමානුපාතික ගිවිසුම්වලින් ලැබෙන

වාරික ආදායම, එක් එක් කොන්ත්‍රාත්තුවේ නියමයන් හා කොන්දේසි යටතේ ගිවිසුම් කාලය ආරම්භයේදී දැනටමත් ස්ථාපිත කර ඇති ගිවිසුම්ගත වාරික මත පදනම්ව හඳුනාගනු ලැබේ.

**SRCC මෝටර් වාරික හඳුනාගැනීම**

2008 මාර්තු 25 දිනැති අතිවිශේෂ ගැසට් අංක 1542/11 හි 3(1) ඡේදය අනුව, වැඩ වර්ජන, කැරලි, සිවිල් නොසන්සුන්තා සහ ත්‍රස්තවාදය සඳහා ප්‍රතිපත්ති නිකුත් කිරීමෙන් එකතු කරන වාරික රාජ්‍ය බැංකුවේ පවත්වාගෙන යන ගිණුමකට බැර කළ යුතුය. කෙසේ වෙතත්, ගැසට් පත්‍රයේ නියම කර ඇති විධිවිධාන අනුව SRCC වාරිකවලින් මෝටර් නොවන වාරික එකතු කරනු ලබන අතර, මෝටර් SRCC වාරික 2010 සිට 12% ක් පමණක් අලාභ අතිරික්ත පදනම මත එකතු කරනු ලැබේ. ඒ අනුව, මෝටර් පන්තියේ SRCC වාරික එකතු කිරීම ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අහිමි වූ වාරිකය, එම ගැසට් නිවේදනයේ දක්වා ඇති විධිවිධාන අනුව පසුගිය වසර 15 සඳහා දළ වශයෙන් රුපියල් බිලියන 51 කි. එමනිසා, NITF හි අධ්‍යක්ෂ මණ්ඩලය 2021 සැප්තැම්බර් 03 දින (මණ්ඩල පත්‍රිකා අංක 172/03) මෝටර් නොවන ව්‍යාපාර පන්තියට සමානව 100% මෝටර් පන්තියේ SRCC වාරික එකතු කිරීමට තීරණයක් ගෙන ඇත.

මෙම සන්දර්භය තුළ, 2023 වසර තුළ රුපියල් 11,692,153,445/- ක මුදලක් වන 100% මෝටර් වාරික ආදායමේ SRCC සහ ත්‍රස්තවාදය (T) NITF විසින් හඳුනාගත යුතුව තිබුණි. කෙසේ වෙතත්, 2023 අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වන්නේ SRCC මෝටර් වාරිකවලින් 12% ක් පමණි (රුපියල් 1,403,058,413.38 ක මුදලක්). එයට හේතුව සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන ලද දුක්ගැනවිලි සහ මුදල් අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශය සැලකිල්ලට ගනිමින් අදාළ ක්‍රියාත්මක කිරීම කල් දැමීමයි.

සාමාන්‍ය රක්ෂණ සමාගම්වලින් SRCC වාරික එකතු කිරීම සම්බන්ධයෙන් පෙර කැබිනට් තීරණ සහ ගැසට් නිවේදන තිබුණද, 2024 අප්‍රේල් 26 දින කැබිනට් අනුමැතිය සඳහා නව කැබිනට් සංදේශයක් ඉදිරිපත් කරන ලදී. මෙම කැබිනට් පත්‍රිකා අංක 24/0854/604/096 කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් 2024 මැයි 13 දින අනුමත කරන ලද අතර, 2008 මාර්තු 25 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ නිදහස් කිරීමේ කාලයක් ලබා දී, දළ SRCC සහ ත්‍රස්තවාදය (T) මෝටර් වාරික සඳහා 12% ක පවතින යාන්ත්‍රණය අඛණ්ඩව යෙදවීමට අවසර දෙන ලදී. එබැවින්, රුපියල් 61,404,099,115 ක් වන වසර සඳහා දළ ලේඛනගත වාරිකය මූල්‍ය ප්‍රකාශනවල සකස් කිරීම අවශ්‍ය නොවේ.

තවදුරටත්, කැබිනට් මණ්ඩලය 2024 මැයි 13 දින තීරණය කර ඇත්තේ 2024 ජනවාරි 01 දින සිට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ සමාගම්වලින් SRCC සහ ත්‍රස්තවාදී අරමුදල (SRCC & T fund) යටතේ 100% රක්ෂණ වගකීම් බාර ගැනීමටය. ඒ අනුව, 2024.01.01 දින සිට කැබිනට් තීරණයට අනුව සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම්වලින් 100% SRCC මෝටර් වාරික එකතු කරන ලදී.

## 6 නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතයේ වෙනස් වීම

ඉපැයීම් නොලැබූ වාරික සඳහා සංචිතය යනු වසර තුළ ලියා ඇති වාරිකවල, ආවරණයේ කල් ඉකුත් නොවූ කාලයට අදාළ කොටස නියෝජනය කරයි. ඉපැයීම් නොලැබූ වාරික, මෝටර් සහ මෝටර් නොවන සාමාන්‍ය රක්ෂණ සහ අග්‍රහාර සෞඛ්‍ය යෝජනා ක්‍රමය සඳහා 365 දින පදනම මත ද, SRCC සඳහා 1/24 පදනම මත ද, සහ ප්‍රතිරක්ෂණ සඳහා දළ වාරිකවලින් 35% පදනම මත සාමාන්‍යයෙන් පිළිගත් රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ කර්මාන්ත භාවිතාවන්ට අනුකූලව ගණනය කරනු ලැබේ.

ඉපැයීම් නොලැබූ රක්ෂණ වාරික සඳහා සංචිතයේ වෙනස්වීම යනු ප්‍රතිපත්තිවල කල් ඉකුත් නොවූ කාලය ආවරණය කිරීම සඳහා වසර තුළ ඉපැයීම් නොලැබූ වාරික සංචිතයට මාරු කරන ලද දළ ලේඛනගත වාරිකවල (GWP) ශුද්ධ කොටස නියෝජනය කරයි.

## 7 ප්‍රතිරක්ෂකයින් වෙත යැවූ වාරිකය

ජීවිත නොවන දළ ප්‍රතිරක්ෂණ වාරික යනු කාල සීමාව තුළ ඇති කරගත් කොන්ත්‍රාත්තු මගින් සපයන ලද සමස්ත ආවරණය සඳහා ගෙවිය යුතු මුළු වාරිකය වන අතර, එය ප්‍රතිපත්තිය ආරම්භ වන දිනට හඳුනාග නු ලැබේ. වාරිකවලට පෙර ගිණුම්කරණ කාලසීමාවන්හිදී ආරම්භ වූ පුනරක්ෂණ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ගිණුම්කරණ කාල සීමාව තුළ ඇතිවන ඕනෑම ගැලපීමක් ඇතුළත් වේ.

## 8 නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතයේ වෙනස් වීම

ඉපැයීම් නොලැබූ ප්‍රතිරක්ෂණ වාරික යනු වාර්තාකරණ දිනයෙන් පසු අවදානම් කාලසීමාවන්ට අදාළ වන වසරක් තුළ ලියා ඇති වාරිකවල අනුපාතයයි. ඉපැයීම් නොලැබූ ප්‍රතිරක්ෂණ වාරික යටින් පවතින සෘජු රක්ෂණ ප්‍රතිපත්තිවල කාලසීමාව තුළ කල් දමනු ලැබේ. ඉපැයීම් නොලැබූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතයේ වෙනස්වීම යනු ප්‍රතිපත්තිවල කල් ඉකුත් නොවූ කාලය ආවරණය කිරීම සඳහා වසර තුළ ඉපැයීම් නොලැබූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතයට මාරු කරන ලද ප්‍රතිරක්ෂණ වාරිකයේ ශුද්ධ කොටස නියෝජනය කරයි.

## 9 ශුද්ධ හිමිකම් ගෙවීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - දළ හිමිකම් ගෙවීම් හඳුනා ගැනීම - වර්ෂය තුළ සිදු වන සියලු හිමිකම් ගෙවීම් සඳහා, දළ හිමිකම් හඳුනාගැනීම: ජීවිත නොවන රක්ෂණ සඳහා දළ හිමිකම්වලට වසර තුළ සිදුවන, වාර්තා වී ඇති හෝ නැති, හිමිකම් සැකසීමට හා පියවීමට සෘජුවම සම්බන්ධ බාහිර හිමිකම් හසුරුවන පිරිවැය, salvage (අබලි ද්‍රව්‍යවල වටිනාකම) සහ අනෙකුත් ප්‍රතිසාධනවල වටිනාකම අඩු කිරීමක් සහ පෙර වසරවලින් හිමිකම් හිගයන්ට අදාළ ඕනෑම ගැලපීමක් ඇතුළත් වේ. හිමිකම් හිගයන් තනි හිමිකම් ලිපිගොනු සමාලෝචනය කිරීමෙන් සහ හිමිකම් පියවීමේ අවසාන පිරිවැයේ වෙනස්වීම් තක්සේරු කිරීමෙන් තක්සේරු කරනු ලැබේ.

හිමිකම් වියදම් සහ හිග හිමිකම් සඳහා වූ වගකීම් සෘජු රක්ෂණ ව්‍යාපාරයට අදාළව හඳුනාගනු ලැබේ. වගකීම මගින් වාර්තා කරන ලද නමුත් තවමත් ගෙවා නොමැති හිමිකම්, සිදු වී ඇති නමුත් වාර්තා වී නොමැති (IBNR) හිමිකම් සහ එම හිමිකම් පියවීමේ අපේක්ෂිත සෘජු හා වක්‍ර පිරිවැය ආවරණය කරයි. ෂර්හසෘ සම්බන්ධයෙන් ඇති ප්‍රතිපාදනය අතීත අත්දැකීම් සහ ප්‍රවණතා මත පදනම්ව අනාගත වගකීම් වඩාත් යථාර්ථවාදී ලෙස තක්සේරු කිරීම සහතික කිරීම සඳහා කාර්තුමය පදනම මත ගණනය කරනු ලැබේ.

අධ්‍යක්ෂවරුන් විසින් හිමිකම් සඳහා වූ ප්‍රතිපාදනය දැනට පවතින තොරතුරු මත සාධාරණව ප්‍රකාශ කර ඇති බව සලකනු ලැබුවද, අවසාන වගකීම පසුකාලීන තොරතුරු හා සිදුවීම් හේතුවෙන් වෙනස් විය හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස සපයන ලද මුදල්වල ගැලපීම් සිදු විය හැක. එවැනි මුදල් එම කාලසීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු වේ. භාවිතා කරන ලද ක්‍රම සහ සිදු කරන ලද තක්සේරු කිරීම් නිතිපතා සමාලෝචනය කෙරේ.

ප්‍රතිරක්ෂණ හිමිකම් අදාළ කොන්ත්‍රාත්තුවේ නියමයන්ට අනුව අදාළ දළ රක්ෂණ හිමිකම හඳුනාගත් විට හඳුනාගනු ලැබේ.

භාරගත් ප්‍රතිරක්ෂණ මත ඇති හිමිකම්, ප්‍රතිරක්ෂණ සෘජු ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබුවේ නම් ඒවා ආදායම් හෝ වියදම් ලෙස හඳුනාගන්නා ආකාරයටම හඳුනාගනු ලැබේ, එහිදී ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ නිෂ්පාදන වර්ගීකරණය ද සැලකිල්ලට ගනී.

## 10 ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ලිඛිත පිරිවැය ඉපයීම හා සම්බන්ධ කාල සීමාව තුල ව්‍යාපාරික නිෂ්පාදනය ප්‍රමාද කිරීම් සහ ක්‍රමක්ෂණය කිරීම් හා සෘජුව සම්බන්ධිත හා වෙනස් විය හැකි නියෝජන කොමිස් මුදල් හඳුනා ගැනීමයි. ප්‍රමාද කරන ලද අත්පත් කර ගැනීමේ පිරිවැය තුල ප්‍රතිරක්ෂණ කොමිස් මුදල් ද ඒ අකාරයෙන්ම සලකා බලනු ලැබේ.

## 11 වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් හඳුනා ගැනීම - වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. ව්‍යාපාරික කටයුතු සිදු කිරීමේ දී සහ දේපළ, පිරියත හා උපකරන පවත්වාගෙන යෑමේ දී, දැරීමට සිදුවන සියලු වියදම්, ලාභ සහ අලාභ ප්‍රකාශනයේ සඳහන් කෙරේ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - කෙටි-කාලීන සේවක ප්‍රතිලාභ - කෙටි-කාලීන සේවක ප්‍රතිලාභ බැඳීම්, වට්ටම් නොවන පදනම මත මනිනු ලබන අතර, අදාල සේවය සපයන ආකාරය අනුව ගෙවනු ලැබේ. සේවකයකු විසින් අතීතයේ දී ලබා දුන් සේවයේ ප්‍රතිපළයක් ලෙස සහ බැඳීම විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි විට එම මුදල ගෙවීමට මණ්ඩලයට නෛතික හෝ අර්ථසාධනීය බැඳීමක් ඇත් නම්, කෙටි කාලීන මුදල් පාරිතෝෂිකය හෝ ලාභ-බෙදීමේ සැලසුම් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල වගකීමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු, නිශ්චිත දායක්ව සැලසුමකට වඩා හිටපු-සේවක ප්‍රතිලාභ සැලසුමක් වේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ කාර්ය මණ්ඩල වියදම් යටතේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වෙනස්වීම් මණ්ඩලය විසින් හඳුනා ගනු ලැබේ.

(අ) වර්තමාන සේවා පිරිවැය
(ආ) පොලී පිරිවැය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නිශ්චිත දායකත්ව සැලසුම් - නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, ආයතනයක් විසින් වෙනත් ආයතනයකට ස්ථිර දායක මුදලක් ගෙවන, වැඩිදුර මුදලක් ගෙවීමට නෛතික හෝ අර්ථසාධනීය බැඳීමක් නොමැති තත්වයක් යටතේ ගෙවන හිටපු - සේවක සැලසුමකි. සියලු සේවකයින් ආවරණය කරන, 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල පනත යටතේ වන සේවක භාරකාර අරමුදල සහ සංශෝධනය වූ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ වන සේවක අර්ථසාදක අරමුදල (ඊපීඑෆ්) වෙත ගෙවන දායකත්ව මුදල් සඳහා බැඳීම්, ගෙවීමට ඇති විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනු ලැබේ. සේවක අර්ථ සාධක අරමුදලට සහ භාරකාර අරමුදලට සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3%ක ප්‍රතිශතයක් මණ්ඩලය විසින් දායක මුදල් ලෙස ගෙවනු ලබයි.

## 12 ගාස්තු ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - රක්ෂණ ගිවිසුමේ පරිපාලන සේවා සහ වෙනත් ගිවිසුම් ගාස්තු ලෙස රක්ෂණ හිමියන්ගෙන් අය කරන ගාස්තු හඳුනා ගැනීම. ලැබීමේ දී හෝ ලැබීමට ඇති විට, මෙම ගාස්තු ආදයම් ලෙස හඳුනාගනු ලැබේ.

## 13 ශුද්ධ සාධාරණ අගයේ ප්‍රතිලාභ

සාධාරණ අගයේ ප්‍රතිලාභ සහ අලාභ හඳුනාගැනීම. අයෝජන සම්බන්ධයෙන් වන ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන ශුද්ධ සාධාරණ ප්‍රතිලාභයන්ට, මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් වන ප්‍රතිලාභයන් සහ අලාභයන් ඇතුලත් වේ. ශුද්ධ විකුණුම් ආදායම් සහ මුල් හෝ ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස ලෙස, ආයෝජනයන්ගේ විකුණුම් සම්බන්ධ ලාභ හෝ අලාභ ගනනය කරනු ලබන අතර, විකුණුම් ගනුදෙනු සිදුවීම් යටතේ වාර්තා කරනු ලැබේ.

## 14 වෙනත් අදායම්

වෙනත් ආදායම් වලට, අබලි ද්‍රව්‍ය, දේපළ, පිරියත සහ උපකරණ සහ විවිධ ආදායම් මත බැහැර කිරීමේ ලාභ/අලාභ හා විවිධ ආදායම් ඇතුලත් වේ. දේපළ, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය හෝ අලාභය, විකිණීම සිදුවන කාල සීමාවේ දී හඳුනාගනු ලබන අතර, වෙනත් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ

## 15 බදු පෙර ලාභය

පහත වියදම් අය කර ගැනීමෙන් පසු, වර්ෂය සඳහා බදු පෙර ලාභය සඳහන් කරනු ලැබේ;

| විස්තරය | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| විගණකවරුන්ගේ වේතනය - ව්‍යවස්ථාපිත විගණන සේවා | 6 | 1,028,000 | 1,027,235 |
| අස්පෘශ්‍ය වත්කම් ක්ෂයවීම | 6 | 6,316,232 | 7,419,957 |
| දේපල, පිරියත සහ උපකරණ ක්ෂයවීම | 6 | 6,973,145 | 6,888,544 |
| අධ්‍යක්ෂවරුන්ගේ දීමනා | 6 | 2,719,017 | 1,880,000 |

## 16 ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම්වලට වත්මන් ආදායම් බදු ඇතුළත් වේ. වත්මන් ආදායම් බදු ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලබන්නේ එය ප්‍රාග්ධනයට සෘජුවම හඳුනාගත් අයිතමවලට අදාළ වන ප්‍රමාණයට හැරය. දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ආදායම් බදු වියදම්වල ප්‍රධාන කොටස් සහ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන බදු පහත දැක්වේ.

| විස්තරය | 2023<br>රු | 2022<br>රු |
|---|---|---|
| **දෙසැම්බර් 31 අවසන් වර්ෂය** | | |
| කාල සීමාව සඳහා ලාභය | 11,537,045,028 | 8,533,829,340 |
| ආදායම් බදු සඳහා ලාභය | 11,562,462,219 | 6,287,691,138 |
| | 3,464,738,666 | 1,697,676,607 |
| පෙර වසරවල විධිවිධානවලට වඩා/අඩු | 3,214,068,113 | |
| මණ්ඩලයේ දේශීය බදු අනුපාතය භාවිතා කරමින් | | |
| ආදායම් බදු (2023-30%, 2022-24% / 30%) | 4,977,397,329 | 1,697,676,607 |
| | | |
| **කල් දමන ලද බදු (ආපසු හැරවීම) / වියදම්** | | |
| සේවක ප්‍රතිලාභ නිසා කල් දමන ලද බදු වගකීම | 12,679,650 | (3,911,259) |
| දේපල, පිරියත සහ උපකරණ නිසා කල් දමන ලද බදු වගකීම | 1,072,732 | 4,340,373 |
| | 13,752,382 | 429,114 |
| ආදායම් බදු වියදම් | 4,991,149,711 | 1,698,105,721 |

**එලදායී බදු අනුපාතය ගලපාල ගැනීම**
**වසර සඳහා අවසන් විය**

| **විස්තරය** | **2023**<br>**රු.** | **2022**<br>**රු.** |
|---|---|---|
| වසර සඳහා ලාභය | 6,545,895,266 | 6,835,723,619 |
| ආදායම් බදු වියදම් | 4,977,397,379 | 1,697,676,607 |
| කල් දැමූ බදු විධිවිධානය | 13,752,382 | 429,114 |
| බදු වලට පෙර ලාභය | 11,537,045,028 | 8,533,829,340 |
| ව්‍යවස්ථාපිත ආදායම් බදු අනුපාතය 30% (2022-24% ) 30%) හිදී | | |
| බදුවලින් නිදහස් ආදායම් | (900,000,000) | (1,608,000,000) |
| එකතු කළ හැකි වියදම් | (14,836,539) | (18,330,972) |
| එකතු කළ නොහැකි වියදම් | 152,525,568 | 166,758,023 |
| | 10,774,734,057 | 7,074,256,391 |
| වසරේ බදු (2022-24% ) 30%) | | |
| කාල සීමාවේ බදු | 3,232,720,217 | 1,981,918,767 |
| දෙවන කාල සීමාවේ බදු | | 1,066,138,459 |
| අදාළ බදු අනුපාතය | 3,232,720,217 | 1,910,049,225 |
| කල් දමන ලද ආදායම් ආපසු හැරවීම | 13,752,383 | 429,114 |
| පෙර වසරේ ආදායම් සඳහා බදු විධිවිධානයට වඩා/අඩු වීම | 1,744,677,161 | (212,372,618) |
| ආදායම් බදු වියදම් | 4,991,149,761 | 1,698,105,721 |

## 17 අස්පෘශ්‍ය වත්කම්

මණ්ඩලයේ අස්පෘශ්‍ය වත්කම්වලට අත්පත් කරගත් පරිගණක මෘදුකාංගයේ වටිනාකම ඇතුළත් වේ.

a) **හඳුනාගැනීමේ පදනම**
අස්පෘශ්‍ය වත්කමක් යනු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට ඉඩ ඇති බවටත්, වත්කමේ පිරිවැය විශ්වාසනීයව මැනිය හැකි බවටත් ඉඩකඩක් තිබේ නම් හඳුනාගනු ලැබේ. මණ්ඩලය විසින් අත්පත් කරගත් මෘදුකාංග ආරම්භයේදී පිරිවැයෙන් මැන බැලීමෙන් පසු, එය ක්ෂය කරනු ලබන අතර, කිසියම් අත්පත් කරගත් වටිනාකම් අඩු කිරීම් පාඩුවක් තිබේ නම් එය ද ඇතුළත් කරනු ලැබේ.

b) **පසුකාලීන මැනීම**
ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම අඩු කළ ක්ෂයවීම් සහ සමුච්චිත වටිනාකම් අඩු කිරීමේ පාඩු සහිත පිරිවැයෙන් මනිනු ලැබේ. අස්පෘශ්‍ය වත්කමක් සඳහා පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය අදාළ වත්කමට විශේෂිත වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් සිදුවන විට වියදමක් ලෙස සටහන් වේ.

c) **අස්පෘශ්‍ය වත්කම් ක්ෂයවීම**

අස්පෘශ්‍ය වත්කම් වසර හතරක කාලයක් තුළ සරල රේඛීය පදනමක් මත ක්ෂය කරනු ලැබේ. ක්ෂයවීම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වාර්තා කෙරේ. සීමිත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා, ක්ෂයවීම සහ ක්ෂය කිරීමේ ක්‍රමය සෑම මූල්‍ය වසරක් අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ.

අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලයෙහි වෙනස්වීම් හෝ වත්කම් තුළ අන්තර්ගත වන අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජන රටාව, සුදුසු පරිදි, ගිණුම්කරණ තක්සේරු කිරීම්වල වෙනස්වීම් ලෙස සලකනු ලැබේ.

ස්ථාවර ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්ෂය කිරීමේ වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන්නේ අස්පෘශ්‍ය වත්කමේ ක්‍රියාකාරිත්වය සමග අනුකූල වන වියදම් කාණ්ඩය තුළිනි. අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා කපා හැරීම සඳහා සරල රේඛීය ක්‍රමය භාවිතා කර ක්ෂයවීම ගණනය කරනු ලැබේ.

d) **අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම ඉවත් කිරීම**

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමෙන් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. එවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම ඉවත් කිරීමෙන් ලැබෙන ලාභය හෝ පාඩුව අයිතමය හඳුනා ගැනීම ඉවත් කරන විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඇතුළත් වේ.

e) **අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම අඩු වීම**

වටිනාකම් අඩු කිරීමේ ඇඟවීමක් ඇති විට වටිනාකම් අඩු කිරීමේ සමාලෝචනයක් සිදු කරනු ලැබේ. ප්‍රතිසාධනය කළ හැකි වටිනාකම පොතේ ඇති වටිනාකමට වඩා අඩු වූ විට, වටිනාකම් අඩු කිරීමේ පාඩුව අදාළ වාර්තාකරණ කාලය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. අතිරික්ත කොන්ත්‍රාත් ප්‍රතිපාදනයක් ස්ථාපිත කිරීමේදී අනාගත සේවාදායක අයිතිවාසිකම් ද සැලකිල්ලට ගනු ලැබේ. 2023 දෙසැම්බර් 31 වන විට අස්පෘශ්‍ය වත්කම්වල විභව වටිනාකම් අඩු කිරීමේ ඇඟවීම මණ්ඩලය විසින් තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, වටිනාකම් අඩු කිරීමේ දර්ශක හඳුනාගෙන නොමැති අතර, එබැවින් අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් වාර්තාකරණ දිනයේදී වටිනාකම් අඩු කිරීමේ ප්‍රතිපාදනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

f) **සම්පූර්ණයෙන් ක්ෂය වූ අස්පෘශ්‍ය වත්කම්**

භාවිතයේ පවතින හෝ නිෂ්ක්‍රීය අස්පෘශ්‍ය වත්කම් ලෙස වාර්තාකරණ දිනයේදී සම්පූර්ණයෙන් ක්ෂය වූ අස්පෘශ්‍ය වත්කම් රු. 7,067,073 කි (2022 - රු. 7,067,073).

g) **අස්පෘශ්‍ය වත්කම්වල හිමිකම් සීමාව**

අස්පෘශ්‍ය වත්කම්වල හිමිකම් මත කිසිදු සීමාවක් නොමැති අතර වගකීම් සඳහා ඇපයක් ලෙස කිසිවක් පොරොන්දු වී නොමැත.

h) **2023 වසර තුළ අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර නොගැනීම**

(2022 - කිසිවක් නොමැත).

## 18. දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ යනු සේවය සඳහා හෝ පරිපාලන කටයුතු සඳහා වසරකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කරන ස්පෘශ්‍ය අයිතම වේ. දේපල, කම්හල් සහ උපකරණවලට කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්, විවිධ වත්කම් සහ මෝටර් වාහන ඇතුළත් වේ.

a) **හඳුනාගැනීමේ පදනම**

දේපල, පිරියත සහ උපකරණ හඳුනාගනු ලබන්නේ අනාගත ආර්ථික ප්‍රතිලාභ වත්කම සමග ගලා ඒමට ඉඩ ඇති බවටත්, වත්කමේ පිරිවැය විශ්වාසනීයව මැනිය හැකි බවටත් ඉඩකඩක් තිබේ නම් ය.

b) **ආරම්භක මැනීම**

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක්, වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා සුදුසුකම් ලබන විට, එහි පිරිවැයෙන් මුලින් මනිනු ලැබේ. පිරිවැයට වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් සහ වත්කමක කොටසක් එකතු කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට සිදු වූ වියදම් ඇතුළත් වේ. ස්වයං - නිර්මාණය කළ වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය වත්කම එහි අභිප්‍රායගත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට ආරෝපණය කළ හැකි වියදම් සහ ඒවා පිහිටා ඇති ස්ථානයේදී ඒවා විසුරුවා හැරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වියදම් ඇතුළත් වේ. මිලදී ගත් මෘදුකාංගය, අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වය සඳහා අනුකලනය වී ඇති බැවින්, පරිගණක උපකරණවල කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත.

මණ්ඩලය විසින් ශාක හා උපකරණවල පිරිවැය මිලදී ගැනීමෙන් හෝ ඉදිකිරීමෙන් වාර්තා කරනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත අලාභයක් අඩු කිරීමෙන් පසුවය.

අලුත්වැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු සිදු වූ මූල්‍ය කාලය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයට අය කරනු ලැබේ. ප්‍රධාන අලුත්වැඩියාවන්හි පිරිවැය ඇතුළත් කරනු ලබන්නේ දැනට පවතින වත්කමෙන් අඳුනාගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කරන විට, අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමට ඉඩ ඇති බවට වඩාත් සාධාරණව තක්සේරු කළ හැකි විට පමණි. ප්‍රධාන අලුත්වැඩියාවන් අදාළ වත්කමේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

c) **ක්ෂයවීම්**

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා කපා හැරීම සඳහා සරල රේඛීය ක්‍රමය භාවිතා කර ක්ෂයවීම ගණනය කරනු ලැබේ. වත්කමක් භාවිතය සඳහා ලබා ගත හැකි විට ක්ෂයවීම් ආරම්භ වේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත දැක්වේ.

| | |
|---|---|
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | වසර 10ට වැඩි |
| ගෘහ උපකරණ සහ සවි කිරීම් | වසර 13.33 ට වැඩි |
| කාර්යාලීය උපකරණ | වසර 13.33 ට වැඩි |
| මෝටර් රථ වාහන | වසර 10ට වැඩි |
| නාම පුවරු | ගොඩනැගිල්ලේ ලීසිං කාලසීමාව තුළ |

d) **දේපල, පිරියත සහ උපකරණවල පසුකාලීන මැනීම**

පුනර්ඇගයුම අගය කිරීම සිදු කරනු ලබන්නේ විවෘත වෙළඳපල වටිනාකම භාවිතා කරන වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවන් විසිනි. වත්කම් වරින් වර නැවත තක්සේරු කර ඇති අතර 2018 දී නැවත තක්සේරු කිරීම් සිදු කර ඇත. නැවත තක්සේරු කිරීම් සෑම වසර 05 කට වරක් අභ්‍යන්තරව පත් කරන ලද කමිටුවක් හෝ බාහිර තක්සේරුකරුවන් විසින් අවශ්‍ය තැනදී සිදු කරනු ලැබේ. නැවත තක්සේරු කිරීමේ අතිරික්තය වත්කමේ ශුද්ධ රැගෙන යන වටිනාකමෙහි හඳුනාගනු ලබන අතර, නැවත තක්සේරු කරන ලද ප්‍රමාණයට ලැබීමෙන් පසු එය සංචිතයකට මාරු කරනු ලැබේ. හඳුනාගැනීම ඉවත් කරන විට නැවත තක්සේරු සංචිතය ඉපැයීම්වලට මාරු කරනු ලැබේ.

කෙසේ වෙතත්, LKAS 16 ඡේදයේ 34 වන පරිච්ඡේදය අනුව, දේපල, පිරියත සහ උපකරණවල අර්ථවත් වෙනස්කම් නොමැති විට නැවත තක්සේරු කිරීම් අවශ්‍ය නොවේ. NITF සතුව මෝටර් වාහන, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් සහ කාර්යාල උපකරණ යන වත්කම් පන්තිවල අර්ථවත් වෙනස්කම් සහිත ස්ථාවර වත්කම් නොමැති බැවින්, 2023 මූල්‍ය වසර සඳහා ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීම් සිදු කර නොමැත.

e) **දේපල, පිරියත සහ උපකරණ හඳුනා නොගැනීම**

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක පොත් වටිනාකම බැහැර කිරීමෙන් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. බැහැර කිරීමෙන් ලැබෙන ලාභය හෝ පාඩුව දේපල, කම්හල් සහ උපකරණ අයිතමයක හඳුනාගැනීම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලබන්නේ අයිතමය හඳුනාගැනීම ඉවත් කරන විටය.

ප්‍රතිස්ථාපන පිරිවැය දේපල, පිරියත සහ උපකරණ අයිතමයක රැගෙන යන වටිනාකමෙහි හඳුනාගනු ලබන විට, ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ඉතිරි රැගෙන යන වටිනාකම හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. එවැනි සෑම ප්‍රාග්ධනීකරණයක් සමගම, පෙර පරීක්ෂණයේ ඉතිරි රැගෙන යන වටිනාකම හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ.

f) **දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම් අඩු කිරීම තක්සේරු කිරීම**
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 දෙසැම්බර් 31 වන විට දේපල, පිරියත සහ උපකරණවල විභව වටිනාකම් අඩු කිරීමේ දර්ශක තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, වටිනාකම් අඩු කිරීමේ දර්ශක හඳුනාගෙන නොමැති අතර, එබැවින් දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් වාර්තාකරණ දිනයේදී මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් අඩු කිරීමේ ප්‍රතිපාදනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

g) **සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණ භාවිතයේ පවතින විට**
දේපල, පිරියත සහ උපකරණවලට සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ද ඇතුළත් වේ.

h) **දේපල, පිරියත සහ උපකරණවල හිමිකම් සීමාව**
වාර්තාකරණ දිනයේදී මණ්ඩලයේ දේපල, පිරියත සහ උපකරණවල හිමිකම් මත කිසිදු සීමාවක් නොතිබුණි.

i) **වසර තුළ දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම**
මූල්‍ය වසර තුළදී මණ්ඩලය විසින් රු. 17,730,556 (2022 - රු. 3,339,395) වටිනා දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගෙන ඇත. දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම සඳහා වසර තුළදී ගෙවීම් සිදු කරන ලදී.

j) **වගකීම් සඳහා ඇපයක් ලෙස තබා ඇති දේපල, පිරියත සහ උපකරණ**
2023 දෙසැම්බර් 31 වන විට වගකීම් සඳහා ඇපයක් ලෙස තබා ඇති දේපල, පිරියත සහ උපකරණ අයිතම කිසිවක් නොතිබුණි (2022 - කිසිවක් නොමැත).

k) **තාවකාලිකව නිෂ්ක්‍රීය දේපල, පිරියත සහ උපකරණ**
2023 දෙසැම්බර් 31 වන විට තාවකාලිකව නිෂ්ක්‍රීය දේපල, පිරියත සහ උපකරණ කිසිවක් නොතිබුණි (2022 - කිසිවක් නොමැත).

l) **දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා වන කොන්ත්‍රාත් බැඳීම් ප්‍රමාණය**
වාර්තාකරණ දිනයේදී දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා කොන්ත්‍රාත් බැඳීම් කිසිවක් නොතිබුණි.

## 19 මූල්‍ය ආයෝජනයන්

### 19.1 මූල්‍ය ආයෝජන වර්ගීකරණය

මණ්ඩලය මුලින්ම ණය සහ ලැබිය යුතු දේ ඒවා ආරම්භ වූ දිනයේදී හඳුනාගනු ලැබේ. (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම ලෙස නම් කරන ලද) අනෙකුත් මූල්‍ය වත්කම්, මණ්ඩලය උපකරණයක කොන්ත්‍රාත් විධිවිධානවලට පාර්ශවකරුවෙකු වන වෙළඳ දිනට මුලින් හඳුනාගනු ලැබේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමෙන් මූල්‍ය වත්කම් නොමැති අවස්ථාවක, වත්කම් අත්පත් කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය ද ඇතුළත් කර සාධාරණ වටිනාකමින් මූල්‍ය වත්කමක් මනිනු ලැබේ.

i. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම
ii. ණය සහ ලැබිය යුතු දේ
iii. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්
iv. කල් පිරීම දක්වා තබාගත්

කෙසේ වෙතත්, 2022 වාර්තාකරණ දිනය වන විට ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම ලෙස වර්ගීකරණය කරන ලද ආයෝජන කිසිවක් නොතිබුණි (2022* කිසිවක් නොමැත).

මණ්ඩලයේ මූල්‍ය ආයෝජන පහත මිනුම් කාණ්ඩ අනුව සාරාංශ කර ඇත.

| කාණ්ඩය | මූල්‍ය වත්කම |
|---|---|
| ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය | නැත |
| විකිණීම සඳහා වන | භාණ්ඩාගාර බැඳුම්කර,<br>භාණ්ඩාගාර බිල්පත් |
| ණය සහ අයවිය යුතු දෑ | REPO,<br>එක් දින ප්‍රති මිලදී ගැනීම් |
| කල්පිරෙන තෙක් රඳවා ගන්නා ලද | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර |

